

# නිවනේ නිවීම

## සිව්වන වෙළුම

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# නිවනේ නිවීම

## (දෙසුම් පෙළකි)

සිවුවන වෙළුම - සිවුවන මුද්‍රණය

(10-12 දෙසුම්)

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර,
දේවාලේගම

ISBN 955 - 8832 - 07 - 3

ප්‍රකාශනය
ධම්ම්ග්‍රන්ථ මුද්‍රණ භාරය

## ධර්මදානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 1998 ජුනි

## පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
   'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

2 රෝයල් ඉන්ස්ටිටියුට්,
   191, හැව්ලොක් පාර,
   කොළඹ 5.

3. ඩී. ටී. වේරගල මහතා
   422, වැලිපාර, තලවතුගොඩ.

4. අනුර රූපසිංහ මහතා
   27, කොළඹ වීදිය, මහනුවර

5. මහා භාරකාර දෙපාර්තමේන්තුව
   2, බුලර්ස් පටුමග,
   කොළඹ 07.

*මුද්‍රණය*
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4302312

මෙම දේශනාමාලාව පැවැත්වීමට ආරාධනාකොට

අප ධෛර්‍යවත් කළ

මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ

අපවත් වී වදාළ

අතිපූජනීය, මහෝපාධ්‍යාය

## මාතර ශ්‍රී ඥානාරාමාභිධාන

අප ගුරුදේවයන් වහන්සේගේ ශ්‍රී නාමයට

## 'නිවනේ නිවීම'

පූජෝපහාරයක්ම වේවා!

එතං සනතං

එතං පණීතං

යදිදං

සබබ සංඛාර සමථො

සබබූපධිපටිනිසසගගො

තණහකඛයො

විරාගො

නිරොධො

නිබබානං

"මෙය ශානතය

මෙය ප්‍රණීතය

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම

සියලු උපධීන් අතහැර දැමීම

තණ්හාව ක්ෂය කිරීම

නොඇල්ම නම්වූ විරාගය

නැවැත්ම නම් වූ නිරෝධය

නිවීම නම් වූ නිබ්බානය"

# පටුන


| | පිටුව |
| --- | --- |
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | x |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මඟින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායකවීම | xii |
| අමාගඟ | xiii |
| ග්‍රන්ථ සංකේත නිරූපණය | xv |
| 'නිවනේ නිවීම' - 10 | 1 |
| 'නිවනේ නිවීම' - 11 | 25 |
| 'නිවනේ නිවීම' - 12 | 49 |

# හැඳින්වීම

බුද්ධ දේශනාවෙහි දැක්වෙන ප්‍රතිපත්ති මාර්ගයේ අවසාන පරමාර්ථය වන 'නිවන' පිළිබඳව ඈත අතීතයේ පටන්ම විවිධ මතිමතාන්තර ප්‍රකාශයට පත් වී ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය 'සම්මා දිට්ඨි' නම් වූ 'හරි දැක්ම' පෙරටු කරගත් ප්‍රතිපදාවකි. එබැවින් ඒ මාර්ගයෙහි ගමන් කරන්නෙකුට ගමනෙහි ඉලක්කය ගැන නිරවුල් අවබෝධයක් ඇතිවිය යුතුමය. බුද්ධ වචනයට අනුකූලව එවැනි අවබෝධයකට මඟ හෙළි කිරීම මෙම දේශනා මාලාවේ පරමාර්ථය විය.

මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්යයන් වහන්සේ වශයෙන් වැඩ විසූ, අපවත් වී වදාළ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ විසින් අප වෙත කරන ලද සමාරාධනය මේ දේශනා පෙළට ආසන්න නිමිත්ත විය. අපගේ ගුරුදේවයන් වහන්සේ වූ උන්වහන්සේ, මෙයට වසර කීපයකට පෙර නිස්සරණ වන යෝගාවචර සඟ පිරිසට ඉදිරිපත්වූ එක්තරා ධර්ම ගැටළුවකදී 'නිවන' පිළිබඳව දේශනා පෙළක් පැවැත්වීම ප්‍රයෝජනවත් විය හැකි බවත්, ඒ දේශනා පටිගත කරගැනීමට කටයුතු යෙදිය හැකි බවත් පවසමින් අප වෙත කරන ලද දයාන්විත ආරාධනය පිළිගැනීමට මුලදී පසුබට වීමු. යළිත් එම ආරාධනාව කළ අවස්ථාවේදී, එසේ පසුබට වීමට එක් හේතුවක් වශයෙන් අප සඳහන් කළේ 'නිවන' සම්බන්ධයෙන් දැනට ප්‍රචලිතව ඇති ඇතැම් මතිමතාන්තර කෙරෙහි අප දක්වන වෙනස් ආකල්පය නිසා ඇතිවිය හැකි ප්‍රතිචාරයය. එවිට උන්වහන්සේ වදාළේ: "ඒකට කමක් නෑ...... මා ආරාධනා කළ බව දේශනාවේදීම කියන්න" යනුවෙනි.

ඒ සා උදාර පැවරීමකින් උත්සාහවත්ව ආරම්භ කැරුණු මෙම දේශනා මාලාව දෙවසරකට වැඩි කාලයක් තිස්සේ (1988.08.12-1991.01.30) දෙපෝයකට වරක් බැගින් අප ගුරුදේවයන් වහන්සේගේ අතිපූජනීය පාදමූලයේදී නිස්සරණ වනයේ අප සබ්‍රහ්මචාරී ගරුතර යෝගාවචර සඟ පිරිස හමුවේ පවත්වන්නට යෙදුණි. ගිලන්වූ ඇතැම් අවස්ථාවලදී පවා මාහිමිපාණන් වහන්සේ යහන්ගතව දෙසුමට සවන් දුන්හ. උන්වහන්සේ බැහැර සෙනසුනෙක වැඩ විසූ එක් අවස්ථාවෙක, මාහිමිපාණන් වහන්සේ මුල'සුනෙහි නොමැතිව දේශනා පැවැත්වීම සම්බන්ධයෙන් පැනනැඟුනු ප්‍රශ්නයක් නිසා එක් දේශනා වාරයක් මඟ හැරුණි. ඒ බැව් සැළවූ විට. නොකඩවාම දේශනාමාලාව පැවැත්විය යුතු බවත්, තමන් වහන්සේට ඒ දෙසුම් පටිගත කළ පසුව වුවද ඇසිය හැකි බවත්, උන්වහන්සේ වදාළහ.

අප ගුරු දේවයන් වහන්සේගේ ඒ උදාර මුදිතා ගුණයට හා ධර්මකාමී ශාසන දයාවට නමස්කාර වේවා!

දෙසුම් 33 කින් පරිමිත මෙම දේශනා මාලාව පැවැත්වීමේදී අප අනුගමනය කළ විවරණ මාර්ගය අනුව හේතුසාධක වශයෙන් පෙළ අටුවා ආදියෙන් කොතෙකුත් උද්ධෘත පාඨ ගෙනහැර දැක්වීමට සිදුවිය. ඒ අනුව එක්තරා බුද්ධිගෝචර රටාවක් මෙහි දැකිය හැකි නමුදු අප පරමාර්ථය වූයේ සද්ධර්මයේ සජීව ප්‍රායෝගික පක්ෂය ඉස්මතු කර දීමමය. ඇතැම් විට හුදු බුද්ධිවාදයක අතරමං වී සිටින උගතුන් කිසියම් ධර්මප්‍රබෝධයක් තුළින් ප්‍රතිපදාව වෙතට යොමුකරවා ගැනීමට මේ විවරණ මාර්ගය උපකාරවත් විය හැකිය. කෙසේ හෝ වේවා, යමෙකුට ධර්මරසය විඳිමින්ම දෙසුමකට සවන්දිය හැකිවන අයුරින් විවිධ උපමා, උපමා කථා, නිදර්ශන ආදියෙන් දෙසුම් පෙළ පණපෙවීමට උත්සාහවත් වීමු. බුදු පියාණන් වහන්සේ වදාළ පරිදිම, "මෙහි ඇතැම් නුවණැති පුරුෂයෝ උපමාවෙකිනුදු දෙසුමෙක අරුත මැනැවින් වටහා ගනිත්".

අසන්නවුන්ගේ අවධානය නොවිසිරෙන අයුරින් මුතු ඇට පෙළක් නූලක අවුණන්නාක් මෙන් ධර්ම කාරණා සාධක සහිතව ගොනු කර දැක්වීම දේශනාවක් තුළ දී කළ හැකි පහසු කාර්යයක් නොවේ. එබැවින් එවැනි ගැටමුසු තැන්වලදී හේතුසාධක කීපයක් පමණක් දැක්වීමෙන් සෑහීමකට පත්වීමට සිදුවිය. එහිලා වඩාත් සවිස්තර විවරණ විග්‍රහ අප අතින් ලියැවී පළවූ ග්‍රන්ථ කීපයක ඇතුළත් වී ඇත.[1]

දෙසුම් පෙළ නිමකොට සත්වසරකට පසු "නිවනේ නිවීම" නමින් එළිදැක්වෙන මෙම ග්‍රන්ථයෙන් යම් ශාසනාර්ථයක් ඉටු වෙතොත් එයින් ජනිත කුශල සම්භාරය දෙසුම්පෙළට ඇරැයුම් කොට වදාළ අප ගුරුදේවයන් වහන්සේ වූ මීතිරිගල නිස්සරණ වන සේනාසනාධිපතිව වැඩවිසූ අතිපූජනීය මහෝපාධ්‍යාය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිපාණන් වහන්සේ අනුමෝදන් වන සේක්වා! ඒ දුර්ලභ ගුරු ඇසුර ලබාගැනීමට මහපැදූ ශ්‍රී කල්‍යාණී

---

1 * 1 Concept and Reality in Early Buddhist Thought - (1971)
* 2 Samyutta Nikaya - An Anthology Part II - (Wheel No. 183/185)
* 3 Ideal Solitude - Wheel No. 188
* 4 උත්තරීතර හුදෙකලාව - (දම්සක් අංක 172/173)
* 5 The Magic of the Mind - (1974)
6 Towards Calm and Insight-Printed for free distribution by J.Alwis
* Published by Buddhist Publication Society. P.O. Box 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61. මහනුවර

යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක අතිපූජනීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ මාහිමිපාණන් වහන්සේටත් අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේටත් මෙම ධර්මදානමය කුශලය හිමිවේවා!

පටිගත වූ දෙසුම් 33 පිටපත් කිරීමේ භාරදූර කාර්යය මහත් පරිශ්‍රමයකින් ඉටුකළ හපුරුදෙණියේ පියදස්සන හිමියන්ටද, සමීක්ෂණ ශුද්ධි ආදියෙන් පසුව එම අත්පිටපත මුද්‍රණය සඳහා සකස් කර දුන් පූජ්‍ය උඩර්රියගම ධම්මජීව, පූජ්‍ය මහයායේ ධම්ම සුනෙත්ත යන හිමිවරුන්ටද දෙසුම් පටිගත කිරීම් පිටපත් කිරීම් ආදී කටයුතුවලට සහායවූ හැමදෙනා වහන්සේලාටද මෙම ධර්මදානමය පින පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිසම වේවා! එමෙන්ම, අවශ්‍ය අවස්ථාවලදී කැසට් පටි සපයාදීමෙන් හා ලිපි ද්‍රව්‍ය, ඡායා පිටපත් ලබාදීමෙන් අනුග්‍රහය දැක්වූ ඩඩ්ලි ප්‍රනාන්දු මහතා ප්‍රධාන ඩී. එච්. පී. මුණවීර සහ සමාගමේ කාර්යමණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

අමිලවූ ධර්මය මිල කිරීමකින් නොපිරිහෙළා ධර්මකාමීන් අතට පත්කිරීම අපගේ අභිලාෂය විය. එහෙත් විශාල ග්‍රන්ථයක් බවට පත්වන මෙම දෙසුම් පෙළ එක්වරම බොහෝදෙනෙකුන් අතට පත් කිරීමේ දුෂ්කරතාව වැටහුණෙන් දෙසුම් 3 බැගින් වෙළුම් 11 ක් වශයෙන් එළි දැක්වීමට අදහස් කළෙමු. මේ අනුව යටත් පිරිසෙයින් දෙසුම් කිහිපයක් හෝ කියවීමට වැඩිදෙනෙකුට අවසථාව සැලසෙන අතරම ධර්මදානමය පුණ්‍ය කර්මයට බොහෝදෙනාගේ සහභාගිත්වයද ලැබෙනු ඇතැයි හඟිමු. එබැවින්, ග්‍රන්ථය තවමත් ශුද්ධිපත්‍ර අවස්ථාවේ පවතින නමුදු මෙසේ පළමු වෙළුම නිකුත් කිරීමට තීරණය කළෙමු. යථා කාලයේදී සම්පූර්ණ ග්‍රන්ථය පුස්තකාල මුද්‍රණයක් වශයෙන් අංග සම්පූර්ණව මුද්‍රණය කෙරෙනු ඇත. කෙසේ වෙතත්, 'නිවනේ නිවීම' වෙළුම් එකොළොසම පිළිවෙළින් එකතු කරගන්නා පාඨකයින්ගේ පහසුව තකා අවසන් වෙළුම සමග උපමා ඉඟිවැලක් හා ගාථා ඉඟිවැලක් ද සහිත 'පදයතුරක්' (අනුක්‍රමණිකාවක්) නිකුත් කිරීමට බලාපොරොත්තු වෙමු. එම පදයතුර සකස් කිරීමේදී අපට සහාය වූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් උපාලි ජයනෙත්ති මහතාට ඒ පින නිවන් දොර ඇරෙන යතුරක්ම වේවායි පතමු.

ග්‍රන්ථ මුද්‍රණයෙහිලා මුද්‍රණාලය හා අවශ්‍ය සම්බන්ධීකරණය පිළිබඳ සම්පූර්ණ වගකීම භාරගෙන විශේෂ කැපවීමකින් ග්‍රන්ථය එළිදැක්වීමට කටයුතු කරන මහාභාරකාර තැන්පත් යූ. මාපා මහතාට මෙම ධර්මදානමය කුශලය ස්වකීය ධර්ම ප්‍රාර්ථනා ඉෂ්ට කරගැනීම පිණිස හේතුවාසනා වේවා! එසේම, වෙළුම් එකොළොසකින් නිමාවන ග්‍රන්ථයෙහි බරපැන, 'බර පැනයක්' නොවනු පිණිස 'ධර්මග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් විශේෂ

අරමුදලක් පිහිටුවීමෙන් පුරෝගාමීවූ පින්වත් ජී.ටී. බණ්ඩාර මහතාට එම ආදර්ශවත් පරිත්‍යාගයෙන් ජනිත කුශලය පරම ශාන්තවූ 'නිවනේ නිවීම' පසක් කරගැනීමට උපනිශ්‍රය වේවායි! යි පතමු. මුද්‍රණ භාරයේ තීරණාත්මක අවසාන අදියර සඳහා පූර්ණ සහයෝගය දෙන කරුණාරත්න සහ පුත්‍ර සමාගමේ කාර්ය මණ්ඩලයටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමි විය යුතුව ඇත.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දෙගෙදර
දේවාලේගම

**(25 41) 1997 ජුලි 1**

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ, එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි..." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කල "නිවනේ නිවීම" දේශන මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අය හට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුනු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 5ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථද එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත්

බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය<br>
රෝයල් ඉන්ස්ටිටියුට්<br>
අංක 191, හැව්ලොක් පාර<br>
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරැවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරැවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරැවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

## නිවනේ නිවීම - සිවුවන වෙළුම
### (සිවුවන මුද්‍රණය)

මෙම ධර්ම ග්‍රන්ථය සදහම් පිපාසිතයින් අතට පත්කිරීම උදෙසා කාලය, ධනය, ශ්‍රමය ශාසන දයාවෙන් පරිත්‍යාග කළ සැමදෙනාටම අමිල වූ ධර්මය නොමිලයේ බෙදාදීමෙන් ජනිත කුශල ශක්තිය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස හේතු වාසනා වේවා! යි පතමු.

- සම්පාදක

(2550) 2006 ජූලි

# ග්‍රන්ථ සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| මහා. | - | මහා වග්ග පාළි |
| දී.නි. | - | දීඝ නිකාය |
| ම.නි. | - | මජ්ඣිම නිකාය |
| සං.නි. | - | සංයුත්ත නිකාය |
| අං.නි. | - | අංගුත්තර නිකාය |
| ඛු.නි. | - | ඛුද්දක නිකාය |
| ධ.ප. | - | ධම්මපද |
| උදා. | - | උදාන |
| ඉති. | - | ඉතිවුත්තක |
| සු.නි. | - | සුත්තනිපාත |
| ථෙර. | - | ථෙරගාථා |
| ථෙරී. | - | ථෙරීගාථා |
| මහානි. | - | මහා නිද්දෙස |
| චූ.නි. | - | චූලල නිද්දෙස |
| නෙත්ති | - | නෙත්තිප්පකරණ |
| සු.වි. | - | සුමඞ්ගලවිලාසිනී (දීඝ නිකාය අටුවාව) |
| ප.සූ. | - | පපඤ්චසූදනී (මජ්ඣිම නිකාය අටුවාව) |
| සා.ප. | - | සාරත්ථප්පකාසිනී (සංයුත්ත නිකාය අටුවාව) |
| මනො. | - | මනොරථපූරණී (අංගුත්තර නිකාය අටුවාව) |
| ධ.අ. | - | ධම්මපදට්ඨ කථා |
| ප.ජෝ. | - | පරමත්ථජෝතිකා |
| ජා.අ. | - | ජාතකට්ඨකථා |
| ප.දී. | - | පරමත්ථදීපනී |
| වි.ම. | - | විසුද්ධිමග්ග |
| බු.ජ. | - | බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා |
| හේ.මු. | - | සයිමන් හේවාවිතාරණ මුද්‍රණය |

# 10 වන

# දේශනය

# 10 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහාසංඝරත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ දහවන දේශනයයි මේ.**

විඤ්ඤාණයෙහි පිළිබිඹුවන නාමරූපය, පිළිබිඹුවක් පමණක් බව තේරුම් නොගැනීම නිසා, සක්කාය දිට්ඨිය ඇතිවන හැටි අප ගියවර දෙසුම අවසානයේදී උම්මග්ගජාතකයෙන් ගත්තු 'මණි' ප්‍රශ්නය පිළිබඳ උපමා කථාවක් ආශ්‍රයෙන් තරමක් දුරට පැහැදිලි කරන්න උත්සාහකළා. පොකුණෙහි දියේ පෙනෙන මැණිකක් අනුව පොකුණේ මැණිකක් ඇත්තවශයෙන්ම තියෙනවයි කියල හිතාගෙන එක්තරා පඬිවරයෙක්, පොකුණෙහි දියත් ඉවත්කරල, මඩත් ඉවත්කරල වෙහෙසට පත් උනහැටි ඒ කථාවෙන් අපි සැකෙවින් සඳහන් කළා. ඒ වගේම මේ නාමරූප පිළිබිඹුව සත්‍ය වශයෙන් ගැනීම නිසා ඇති උන සක්කායදිට්ඨිය නිසා ශාස්වත, උච්ඡේද යන ඒ දෘෂ්ටිදෙක, එහෙම නැත්නම් භව, විභව වශයෙන් ගත්ත දෘෂ්ටිදෙක, අන්ත දෙකක් ඔස්සේ ගමන්කළා. ශාස්වතදෘෂ්ටිය ආත්ම ස්නේහය අනුව 'ආත්මයක් ඇත' කියන හැඟීම අරගෙන, මේ ආත්මය දිගටම ගෙනයාමට බලාපොරොත්තු වුනා. විභව දෘෂ්ටිය, එහෙම නැත්නම් උච්ඡේද දෘෂ්ටිය ආත්ම ද්වේශය ඇතිකරගෙන. මේ ආත්මයෙන් මිදීම මරණයෙන් මතු සිදුවේය කියන බලාපොරොත්තුව ඇතිකරගත්ත. මේ විදියට මේ අන්ත දෙකම, අර පිළිබිඹුව, පිළිබිඹුවක් බව තේරුම් නොගැනීම නිසයි මේ විදියේ අවුලකට පත්උනෙ. බුදුපියාණන්වහන්සේ ලෝකයට හඳුන්වාදුන්න මධ්‍යම ප්‍රතිපදාව මේ අන්ත දෙකෙන් මිදුනෙ කොහොමද? අර භව විභව දෘෂ්ටි දෙක වෙනුවට යථාභූත ඥානදර්ශනයක් ඉදිරිපත් කිරීමෙන්. ඒ කියන්නෙ අර නාමරූප පිළිබිඹුව පිළිබිඹුවක් පමණක්ය යන ඒ යථාභූත ඥානදර්ශනය උන්වහන්සේ ලෝකයට හඳුන්වා දුන්න.

මේ 'යථාභූත' කියන වචනයෙ විශේෂ වැදගත් කමක් තියෙනව. භව විභව කියන වචන දෙකත් එක්ක සසඳල බලනකොට 'භූත' කියන වචනයෙ අමුත්තක් තියෙනව – 'යථාභූත'. මේ යථාභූත කියන වචනයේ අර්ථය පැහැදිලි කරගැනීමට අපට උපකාරවෙනව, අපි පසුගිය දේශනාවෙදි යන්තමින් සඳහන් කළ එක්තරා ඉතිවුත්තක සූත්‍ර පාඨයක්. ඒක සවිස්තරව ගත්තොත් අපට මේ අදහස වඩාත් පැහැදිලි කරගන්න පුළුවන්. 'භූත' කියන වචනය බුදුපියාණන්වහන්සේ ඉදිරියට ගත්තෙ මක්නිසාද? භව විභව ව්‍යවහාරය වෙනුවට 'භූත' යන වචනයක් ඉදිරිපත් කළේ මක්නිසාද? කියන එක. ඒ ඉතිවුත්තක සූත්‍රයේ මේ විදියටයි සඳහන් වෙන්නෙ.

**'ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති එකෙ අතිධාවන්ති එකෙ. චක්ඛුමන්තොව පස්සන්ති. කථංච භික්ඛවෙ ඔලීයන්ති එකෙ. භවාරාමා භික්ඛවෙ දෙවමනුස්සා භවරතා භවසම්මුදිතා තෙසං භව නිරොධාය ධම්මෙ දෙසියමානෙ න චිත්තං පක්ඛන්දති. නප්පසීදති න සන්තිට්ඨති. නාධිමුච්චති එවං ඔලීයන්ති එකෙ. කථංච භික්ඛවෙ අතිධාවන්ති එකෙ. භවෙනෙව ඛො පන එකෙ අට්ටීයමානා හරායමානා ජිගුච්ඡමානා විභවං අභිනන්දන්ති. යතො කිර භො අයං අත්තා කායස්ස භෙදා පරම්මරණා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා එතං සන්තං එතං පණීතං එතං යාථාවන්ති එවං ඛො භික්ඛවෙ අතිධාවන්ති එකෙ. කථංච භික්ඛවෙ චක්ඛුමන්තොව පස්සන්ති. ඉධ භික්ඛු භූතං භූතතො පස්සති භූතං භූතතො දිස්වා භූතස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. එවංඛො භික්ඛවෙ චක්ඛුමන්තොව පස්සන්ති'**[1]

දැන් මෙතැන කියැවෙනව අර භව විභව දෘෂ්ටි දෙකේ ඒ අන්ත දෙකත් බුදුපියාණන්වහන්සේ මේ භූත කියන වචනය ආශ්‍රයෙන් ඉදිරිපත්කළ මධ්‍යම ප්‍රතිපදාවත්. ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශ වෙනව. මේ සූත්‍රයේ අදහස අපි දැන් තේරුම් ගන්න බලමු. 'ද්වීහි භික්ඛවෙ දිට්ඨිගතෙහි පරියුට්ඨිතා දෙවමනුස්සා ඔලීයන්ති එකෙ, අතිධාවන්ති එකෙ'-දෘෂ්ටි දෙකකින් මඩනාලද සිත් ඇති දෙව්මිනිසුන්ගෙන් ඇතැමෙක් පසුබසිත්, ඇතැමෙක් ඉක්මවා දිවයත්. 'චක්ඛුමන්තොව පස්සන්ති'-ඇස් ඇත්තෝමැ දකිත්. 'කථංච භික්ඛවෙ ඔලීයන්ති එකෙ' 'කෙසේද ඇතැමෙක් පසුබසින්නේ?' 'භවාරාමා භික්ඛවෙ දෙවමනුස්සා භවරතා භව සම්මුදිතා තෙසං භව නිරොධාය, ධම්මෙ දෙසියමානෙ න චිත්තං පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති, නාධිමුච්චති' – 'මහණෙනි දෙව්මිනිස්සු භවයට ඇලුම් කරන්නාහ. භවයෙහි ඇලුනාහුය. භවයෙන් සතුටු වූවාහු ය. ඔවුනට භව නිරෝධය පිණිස ධර්මය දේශනා කරන කල්හි, ඔවුන්ගේ සිත ඒ දෙසට නොපනී. එහි නො පැහැදෙයි. එහි නොසිටියි. එහි නොමිදෙයි. මේ අන්දමින් ඇතැම් කෙනෙක් පසුබසිත්. 'කථං ච භික්ඛවෙ අතිධාවන්ති එකෙ' – ඇතැම් කෙනෙක් ඉක්මවා දුවන්නේ කෙසේද?

'භවෙනෙව බො පන එකෙ අට්ටීයමානා, හරායමානා, ජිගුච්ඡමානා විභවං අභිනන්දන්ති - ඇතැම් කෙනෙක් මේ භවයෙන්ම පීඩා විඳින්නාහු, පීඩාවට පත්වුවාහු. භවය නිසා ලැජ්ජාවට පත්වුවාහු, භවය පිළිකුල් කරන්නාහු, භව විනාශය පිළිබඳව සතුටු වෙත්. භවවිනාශයක් ලබාගැනීමට උනන්දුවෙත්' මෙන්න මේ විදියට හිතල - 'යතො කිර භො අයං අත්තා කායස්ස භෙදා පරම්මරණා, උච්ඡිජ්ජති විනස්සති, න හොති පරම්මරණා. එතං සන්තං එතං පණීතං එතං යාථාවං' - යම්හෙයකින් මේ ආත්මය කයෙහි බිඳීමෙන් මරණයෙන් පසුව උච්ඡේද වේද විනාශවේද. මරණින් මතු නොවේද, මෙන්න මේ තත්වය ශාන්තය ප්‍රණීතය, මෙයම යථාතත්ත්වයය'. මෙන්න මේ අන්දමින් - එවං බො භික්ඛවෙ අතිධාවන්ති එකෙ - මේ අන්දමින් ඇතැම් කෙනෙක් ඉක්මවා දිවයන්නට තැත්කෙරෙත්. ඉක්මවා දිවයෙත්. 'කථංච භික්ඛවෙ චක්ඛුමන්තොව පස්සන්ති' ඇස් ඇත්තන් කෙසේද මහණෙනි දකින්නෙ? - 'ඉධ භික්ඛු - මෙහිලා යම්කිසි භික්ෂුවක් - භූතං භූතතො පස්සති' - හටගත්දෙය හටගත් වශයෙන්ම දකී - 'භූතං භූතතො දිස්වා භූතස්ස නිබ්බිදාය, විරාගාය, නිරොධාය පටිපන්නො හොති' හටගත්දෙය හටගත් හැටියටම තේරුම් අරගෙන, ඒ හටගත්දෙය පිළිබඳව නිර්වේදය - කලකිරීම පිණිස - විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. - 'එවං බො භික්ඛවෙ චක්ඛුමන්තොව පස්සන්ති' - මෙන්න මේ අන්දමින් ඇස් ඇත්තෝ දකිත්. ඊ ළඟට මේ සූත්‍රය අගදී හොඳ ගාථා දෙකකුත් එනව. ඒ ගාථා දෙකෙනුත් ඒ අදහස වඩා ප්‍රකටව ඉදිරිපත් වෙනව.

**යෙ භූතං භූතතො දිස්වා - භූතස්ස ච අතික්කමං**
**යථාභූතෙ විමුච්චන්ති - භවතණ්හා පරික්ඛයා.**
**ස වෙ භූතපරිඤ්ඤො සො - වීතතණ්හො භවාභවෙ**
**භූතස්ස විභවා භික්ඛු - නාගච්ඡති පුනබ්භවං**

'යෙ භූතං භූතතො දිස්වා භූතස්සච අතික්කමං' - යම් කෙනෙක් හටගත් දෙය හටගත් දෙය වශයෙන් දැක එසේම හටගත් දෙය ඉක්මවන ආකාරයද දැක - 'යථාභූතෙ විමුච්චන්ති' - යථාභූත ස්වභාවය වූ නිර්වාණයෙහි මිදෙද්ද නිවනෙහි මිදෙද්ද? මිදෙන්නෙ කොහොමද - 'භවතණ්හා පරික්ඛයා' - භවතණ්හාව සම්පූර්ණයෙන්ම ක්ෂයකිරීම හේතු කොටගෙන, ඒ විදියට යථාභූත තත්ත්වයවූ නිවනින් මිදෙත්ද? - 'ස වෙ භූතපරිඤ්ඤො සො වීතතණ්හො භවාභවෙ- ඒ භූත තත්ත්වය පිළිබඳව ඉතාමත්ම පුළුල් ඥානයක් ඇති, පැහැදිලි ඥානයක් ඇති, තේරුම් ගැනීමක් ඇති, ඒ පුද්ගලයා මේ භව - විභව පිළිබඳව තෘෂ්ණාව නැත්තේ, තෘෂ්ණාව පහකළේ - 'භූතස්ස විභවා භික්ඛු' - භූත තත්ත්වය කෙළවර කිරීමෙන් භූත තත්ත්වය නැති කර ගැනීමෙන් 'නාගච්ඡති පුනබ්භවං'-නැවත භවයකට නොඑයි.

මෙතන ඉතින් හොඳටම පැහැදිලිව පේනව අර භවවිභව දෙක අතරට බුදුපියාණන්වහන්සේ මේ භූත යන වචනයක් ඉදිරිපත්කළ බව. නමුත් මේක තවදුරට විස්තර කරන්න වෙනවා. මේ භව විභව කියන වචන දෙක, බුදුපියාණන්වහන්සේගේ කාලය වනවිට ව්‍යවහාර උනේ යම්කිසි ආත්මයක පැවැත්මක් සහ යම්කිසි ආත්මයක විනාශයක්, හැඳින්වීම සඳහායි. සමහර සූත්‍රවලින් ඒක හොඳට පැහැදිලි වෙනව. ඒ දෘෂ්ටිය ගත් අය කතාකරනව' භවිඎාමි න භවිඎාමි කියල. 'මම වන්නෙමි, මම නොවන්නෙමි'. මේ 'වන්නෙමි', 'නොවන්නෙමි' කියන වචන, යම්කිසි පුද්ගලයෙක්, යම්කිසි ආත්මයක් අඟවන පදයි. මේ 'භූත' කියන වචනය ඒ විදියට පාවිච්චි කරන්න බැහැ. ඒක එහෙම පිටින්ම භාවකාරක වශයෙන් සිදුවුන දෙයක් හැටියට – 'වූ දෙයක්,' හැටියට පෙන්වනව. මේ 'භූත' කියන වචනය අර පිළිබිඹු වගේ හේතුප්‍රත්‍යයන්ගෙන් හටගත්තු බවක් හඟවන පදයක්. කලින් කියපු පිළිබිඹු ගැන තවදුරටත් කල්පනා කරල බලනව නම්, ශාස්වත දෘෂ්ටිය ගත්තු කෙනා ආත්ම ස්නේහය ඇතිකරගෙන. අර තමන්ගේම ඡායාව - වතුරට වැටුනු ඡායාවක් දැකල සමහරකෙනෙක් ඇලුම්කරගෙන ඒකට නැඹුරුවෙනව - අන්න ඒ වගේ 'ඔලියනිත්ති එකෙ' - පසුබැසීම. ආත්මදෘෂ්ටිය ගත්තු අය, ආත්මය භවයෙහි දීඝ කාලයක් පැවැත්වීම සඳහා, ආත්මයක පැවැත්ම තහවුරු කරගැනීම සඳහා, අරවිදියට පසුබසිනව. බුදුපියාණන්වහන්සේ භවනිරෝධය ගැන ධර්මය දෙසනකොට පසුබසිනව. මක්නිසාද? මේ විදියට කළොත් අපේ ආත්මය නැතිවේය යන හැඟීමෙන්. අන්න ඒ විදියට ආත්ම ස්නේහය නිසා තමන්ගේ ඡායාව වැළඳගැනීමට තැත්කිරීමක් වගෙයි ඒක.

ඊළඟට අර විභව දෘෂ්ටියෙ තියෙන්නෙ තමන්ගේ සෙවනැල්ලට භය වෙලා, සෙවනැල්ලෙන් පලායාමට තැත්කිරීමක්. දැන් සමහර කෙනෙක් සෙවනැල්ල තමාගෙ ඉදිරිපිට වැටිල තියෙනකොට ඒකෙන් මිදෙන්න දුවන්න පටන්ගන්නව. කොයිතරම් දිව්වත් ඒ සෙවනැල්ල ඉස්සරහමයි. ඒක ඉක්මවා දුවන්න බැහැ. ඒක උත්සාහයක් පමණයි. ඒ වගේ තමයි උච්ඡේද දෘෂ්ටිය. ඒ දෘෂ්ටිමාත්‍රයෙන් කෙනෙකුට බෑ සසරින් මිදෙන්න. අවිද්‍යා, තෘෂ්ණා ආදී ඒ ක්ලේශ ධර්ම තිබෙනතාක්, 'මම මරණින් මතු නැති වෙනව' කියල හිතාගත්තු පලියට එයින් මිදෙන්නෙ නැහැ. ඔන්න ඔය විදියට අන්ත දෙකකට නැඹුරුඋන බවයි ඔතනින් පේන්නෙ. ඔය අන්ත දෙක ඔස්සේ ගමන් කළා අර ශාස්වත දෘෂ්ටියත් උච්ඡේද දෘෂ්ටියත්. නමුත් බුදු පියාණන් වහන්සේ මේ 'භූත' කියන වචනය ඉදිරිපත් කිරීමෙන් කළේ, මේ පඤ්චස්කන්ධය හටගත්තු දෙයක් බව, මේක හේතු ප්‍රත්‍යයන් නිසා හටගත්තු දෙයක් බව, දැක්වීමයි. ඉතිවුත්තකයේම සඳහන් වෙනව' - 'ජාතං

භූතං සමුප්පන්නං කතං සංඛතමද්ධුවං'[2] කියල. 'ජාතං භූතං සමුප්පන්නං' - මේ පඤ්චුපාදානක්ඛන්ධය ගැනයි කියැවෙන්නෙ. 'ජාතං' - උපන්, 'භූතං' - හටගත්, 'සමුප්පන්නං' - පැනනැඟුණු - ප්‍රතීත්‍යසමුත්පන්න කියන එකයි, හේතුප්‍රත්‍යයන්ගෙන් හටගත් කියන එකයි. 'කතං' - මේක කරනලද දෙයක්, සංඛතං - සකස් කරන ලද දෙයක්. කෘත්‍රිම සවභාවයක් මෙයින් හැඟෙන්නෙ. ඒ වගේම 'අද්ධුවං'. මේක අස්ථිර දෙයක්. අර 'සත් පදාර්ථයක් වගේ, සදාකාලික දෙයක් නොවෙයි කියන එකයි. පිළිබිඹුවක් පමණයි. එතකොට 'භූත' කියන වචනයෙ තියෙනව හේතුප්‍රත්‍යයන්ගෙන් හටගත් කියන ඒ අදහස. ඒක නිසා ඇත්තවශයෙන් ආත්මදෘෂ්ටිය ගත්තු අය භය උනාට මොකද, මේ නිවනින් කෙරෙන්නෙ ඇත්තවශයෙන්ම තිබෙන දෙයක් විනාශකිරීමක් නොවෙයි. මෙතන නිවනට භවනිරොධ කියල ඒ නමින් හැඳින්වුවාට මොකද බුදුපියාණන් වහන්සේගේ දර්ශනයට අනුව කෙනෙකුට තියෙන්නෙ 'භව' **තෘෂ්ණාවක්** පමණයි. ඇත්තවශයෙන්ම පැවැත්මක් නොවෙයි තියෙන්නෙ. සිටිනව කියල මාන්නයක් - අස්මිමානයක් - පමණයි. පැවැත්මක් පිළිබඳ එක්තරා මානයක් පමණයි, තියෙන්නෙ. සත්‍යවශයෙන් බලනකොට තියෙන්නෙ තෘෂ්ණාවක්. ඒක නිසා තමයි 'තණ්හා පොනොභවිකා' - නිතරම ඉදිරියට නැඹුරුවුනු භවනෙත්ති වශයෙන් තිබෙන ඒ තෘෂ්ණාව නිසා - ඒ භවතෘෂ්ණාව නිසා - ලෝක සත්ත්වයා සංසාරෙ දුවනව. නමුත් එක් එක් අවස්ථාවක් අරගෙන බැලුවාම, ඒ හැම අවස්ථාවකම 'භූත' තත්ත්වයක් - හේතු ප්‍රත්‍යයන් නිසා හටගත්තු දෙයක්. අර බූරුවෙක් සමහරවිට වාහනයක් ඇදගෙන යනව ඉදිරියෙන් කැරට් අලයක් පෙන්වනකොට. අන්න ඒ වගේ දෙයක්, මේ භවය ඔස්සේ දුවන සත්ත්වයා කරන ගමන. අන්න ඒක නිසා මෙතන තිබෙන්නෙ යම්කිසි සත්පදාර්ථයක්, එහෙම නැත්නම් ආත්මයක්, විනාශ කිරීමක් නොවෙයි. ධර්මානුකූලව බලනකොට භවනිරොධය කියල කියන්නෙ භවයක් හටගැනීමට හේතුවන අවිද්‍යා තෘෂ්ණා ආදිය ඉවත්කිරීමෙන්, ඒ හේතුව නැති කිරීමෙන්ම භවය නැතිකිරීමක්, දුක නැතිකිරීමක්.

අර උච්ඡේද දෘෂ්ටි ගත් අය බලාපොරොත්තු වෙන්නෙ දෘෂ්ටිමාත්‍රයෙන්ම තමන් නැතිවෙය කියල. නමුත් එහෙම කෙරෙන්නෙ නැහැ. මක්නිසාද, ඔවුන්ගේ ඇතුළත තිබෙන අවිද්‍යා තෘෂ්ණා උපාදාන නිසා මරණින් මතු සිටින්නෙ නැහැ කියල කොයි විදියෙ දෘෂ්ටියක් ගත්තත්, ඇත්ත වශයෙන්ම අවිද්‍යාව තිබෙන තාක්, තෘෂ්ණාව තිබෙනතාක්, යම්කිසි ධර්මපරම්පරාවක් අනුව පඤ්චුපාදානක්ඛන්ධය- 'උප්පජ්ජති දුක්ඛමිදං පුනප්පුනං'[3], මේ දුක්ගොඩ නැවත නැවත හටගන්නව. අන්න ඒ නිසා මෙතන තියෙන්නෙ, යථාභූත තත්ත්වය පිළිබඳ ගැඹුරු දර්ශනයක්. එවැන්නක් උඩ ඉඳගෙනයි බුදුපියාණන් වහන්සේ මේ මධ්‍යම ප්‍රතිපදාව ඉදිරිපත් කළේ. අර විදියට

කාමසුඛල්ලිකානුයෝගයටත්, අත්තකිලමථානුයෝගයටත් නැඹුරු නොවන අන්දමට, මධ්‍යම ප්‍රතිපදාවක් පෙන්වූයේ යථාභූත ඥාන දර්ශනය මත ඉඳගෙනයි. ඊළඟට අපි බලමු දැන් මෙතන භවය පිළිබඳව. මේ 'භව - විභව' කියන වචන සිහිපත් වෙනකොට සමහර කෙනෙකුට හිතෙන්න පුළුවන් ලෝකයේ පැවැත්ම පිළිබඳව. සමහර කෙනෙක් කල්පනාකරනව 'අත්ථි', එහෙමනැත්නම් 'ඇත' කියන වචනයය මේ ව්‍යාකරණයෙ ප්‍රධාන වචනය කියල. බොහෝවිට ඔය දෘෂ්ටිවාදීනුත් 'සියල්ල ඇත' - 'සියල්ල නැත' 'සබ්බං අත්ථි' 'සබ්බං නත්ථි' - ආදී වශයෙන් නොයෙකුත් දෘෂ්ටිවාද ඉදිරිපත් කරගෙන බුදුපියාණන් වහන්සේගෙන් ඒවාට යම්කිසි පිළිතුරක් බලාපොරොත්තු උනා. නමුත් බුදුපියාණන්වහන්සේ පෙන්නුව 'ඇත' 'නැත' කියන ව්‍යවහාරයට වඩා ප්‍රාථමික ස්වරූපය තමයි, මූලික වචනය තමයි 'අස්මි' කියන එක. 'අස්මිමාන' කියල කියන්නෙ. අපි ව්‍යාකරණයක් අරගෙන කල්පනා කරල බලනකොට ව්‍යාකරණයෙ ප්‍රධාන තැන ගත යුත්තේ මේ 'අස්මි' කියන වචනයයි. අපි සමහරවිට කල්පනා කරනව 'ඇත' කියන එකෙයි පළමුවන වචනය කියල, 'අත්ථි' කියන එකයි කියල. නමුත් 'අස්මි' කියන එකයි මුල් වචනය, ව්‍යාකරණයේ ආරම්භය. හරියට අර කුඤ්ඤවගේ. ලෝකය මැනීමට උපකාරවන කුඤ්ඤය වගෙයි, මේ අස්මිමානය. 'අස්මි' කියන වචනය ඇති උනාට පස්සෙ තමයි අනිත් දේවල් ඇතිවෙන්නෙ.

දැන් නිදසුනක් වශයෙන් අපි කිව්වොත් යම්කිසි දෙයක් තිබෙනව කියලා, ඊළඟට අහන ප්‍රශ්නය 'ඒක කොතැනද තියෙන්නෙ?' කියලයි. ඒක තියෙන්නෙ කොතැනද? ඒක තියෙන්නෙ එක්කො 'මෙතැන' එහෙම නැත්නම් 'එතැන' එහෙම නැත්නම් 'ඔතැන'. ඔය තුන් තැනින් එකක වෙන්න ඕන. එතකොට 'මෙතැන' නම් ඒක මෙතැනක් වෙන්නෙ කොහොමද? මා ඉන්න තැන. 'එතැන' වෙන්නෙ ඔහු ඉන්න තැන. 'ඔතන' වෙන්නෙ ඔබ ඉන්න තැන. ඔන්න එතකොට අර 'පුරිස' තුන එනව. උත්තම පුරුෂ, ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ. සමහර ව්‍යාකරණවල ප්‍රථම පුරුෂය තමයි ඈත ඉන්න එක්කෙනා. 'මම' තමයි උත්තම පුරුෂයා. ඔබ තමයි මධ්‍යම පුරුෂයා. ව්‍යාකරණයෙ සැකිල්ල ඔතනයි. ව්‍යාකරණයෙ මූලික ව්‍යුහය, මූලික රටාව, ඔතනයි තියෙන්නෙ. එතකොට 'මම වෙමි' 'ඔබ වෙහි' 'ඔහු වෙයි'. ඒ විදියට 'අස්මි' කියන, එහෙම නැත්නම් 'මම' කියන, දෘෂ්ටිකෝණය අනුවයි යම්කිසි දෙයක පැවැත්ම පිළිබඳව කථා කරන්න වෙන්නෙ. අර 'අත්ථි' 'නත්ථි' කියන ඒකාන්ත අස්තිත්වයක් හෝ ඒකාන්ත නාස්තිත්වයක් නැතෙයි කියලා බුදුපියාණන්වහන්සේ දැක්වූයෙ - ඒවා අන්ත දෘෂ්ටිහැටියට දැක්වූයේ - මෙන්න මේ නිසයි. 'මමෙක් 'ඇති උනාට පස්සෙ තමයි යම්කිසි දෙයක් තිබෙනව කියල එන්නෙ. ඒ තිබෙන එක, තිබෙන තැන, එතැන නම් ඒ මම නැති තැන. එහෙම නැත්නම් මට වඩා ඈත තැන.

ඔතැන නම් මා ඉදිරියෙ ඉන්න ඔබ ළඟ. මෙතැන නම් ඒක මා ළඟ. මෙයින් අපට පේනව මේ අස්මිමානය මුළුමහත් ලෝකයේම මුළුමහත් ව්‍යාකරණයේම, ආරම්භය වගෙයි - මේ 'අස්මි' කියන එක.

අපි කලින් අවස්ථාවක 'ඉත්ථභාව' 'අඤ්ඤථාභාව' කියන වචන දෙක ගැන කථාකරන කොටත්, ඔය විදියේ දෙයක් කියන්න සිද්ධඋනා, බුදුපියාණන්වහන්සේ තවත් විශේෂ කාරණයක් පෙන්නුම් කරනව. මේ 'අස්මි' කියන එක, මේ 'අස්මි' කියන හැඟීම, 'අස්මිමානය', අහේතු අප්‍රත්‍යව සිදුවන දෙයක් නොවෙයි. ඒ කියන්නෙ. හේතුවක් ප්‍රත්‍යයක් නැතිව ඇතිවන දෙයක් නොවෙයි. එහෙම ඇතිවන අස්මිමානයක් නම්, ඒක කවදාවත් නැතිකරන්න බැහැ. නමුත් යම්කිසි හේතුප්‍රත්‍ය නිසයි මේ 'අස්මි' කියන එක වෙන්නෙ. ඒ හේතුප්‍රත්‍ය නිසා තියන බව අඟවන වචනයක් තියෙනව. 'උපාදය' කියන එක. දැන් අපි 'පඤ්චුපාදානක්ඛන්ධ' කියල වචනයක් යොදනව. සාමාන්‍යයෙන් අපි කියනව 'උපාදානක්ඛන්ධ පහ, කියල. මේ 'උපාදාන' කියන වචනය බොහෝවිට පරිවර්තනය කරන්නෙ දැඩිව අල්වාගැනීම කියල. මේ දැඩිව අල්වාගැනීම කියල පාවිච්චි වන නිසා සමහර කෙනෙක් අහනව, එහෙම නම් ටිකක් බුරුලෙන් අල්ලාගත්තට වරදක් නැහැ නේද කියල. එහෙමත් සමහර කෙනෙක් අහනව. අන්න ඒ උපාදාන කියන වචනයේ පරිවර්තනය ඒ තරම්ම හරිය කියල කියන්න අමාරුයි. මෙතන 'උප' කියල කියන්නෙ සමීපාර්ථයෙන්. ඒ බව පේනව, දැන් සමහර තැන්වල තියෙනව, 'උපෙති උපාදියති' කියල. ඒ වචන දෙක එකට සඳහන් වෙනව. 'උපෙති' කියන්නෙ 'උප+ඉ' කියන ධාතුවෙ 'යාම' කියන අදහස තියෙනව - 'උපෙති' කියන්නෙ 'ළං වෙනව' උපාදියති කියන්නෙ 'ළං වෙලා අල්ලාගන්නව'. මෙතන අල්වාගැනීමක් පමණක් නොවෙයි. අල්වාගෙන ඉඳීමක්. එතකොට මේ මුළුමහත් පැවැත්ම තියෙන්නෙ ධර්මානුකූලව කල්පනාකරනකොට 'අල්ලාගෙන ඉඳීමක් මතයි. එහෙම නැත්නම් අල්ලාගැනීමක් මතයි. අහේතු අප්‍රත්‍යකව නොවෙයි.

දැන් මේකෙදි අපට මතක් කරන්න පුළුවන් අපි අර කලින් දේශනයෙදී කඹයක් වරපටක් ඇඹරෙන ආකාරය ගැන යම්කිසි උපමාවක් කළා. මේ එක් එක් උපමාවක් අපට නැවත නැවත මතක් කරගන්න වෙනව, ධර්මය පිළිබඳ යම්කිසි ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට. ඒ උපමාව අපි ඉදිරිපත් කළෝ, දැන් කෙටියෙන් කියතොත්, දෙදෙනෙක් යම්කිසි කඹයක් හෝ වරපටක් අඹරන්න පටවල් ගණනාවක් දඟ ගහනව. හැබැයි දඟගහන්නෙ දෙන්නම එක පැත්තටයි. එක දිසාවකටයි මේ දඟගහගෙන යන්නෙ. එහෙම දඟ ගහන කොට කොයිතරම් කාලයක් දඟගැහුවත් ඒක දඟවැටෙන්නෙ නැහැ.

එක පැත්තකින් වැටෙන දහේ අනික්පැත්තෙන් ලිහෙන නිසා. නමුත් යම්කිසි කෙනෙක් මැදින් අල්ලගත්තොත් මොකද වෙන්නෙ? මැදින් අල්ලාගෙන ඉන්නවනම්, අන්න කඹයක් වගේ දෙයක් ඇඹරෙනව. ඔන්න 'භවයත්' ඔය විදියෙ දෙයක්. අර උපාදානය නිසයි, අර අල්වාගෙන ඉඳීම නිසයි, මේ කඹය ඇඹරෙන්නෙ. වෙන පිටින් කෙනෙක් බලාගෙන ඉන්නකොට හිතෙනව මේ තැනැත්තා කඹයක් අල්ලාගෙන ඉන්නවයි කියල. නමුත් සිදුවන්නෙ මොකක්ද? අල්වාගෙන ඉඳීම **නිසා** කඹයක් වැනි දෙයක් ඇති වෙනව. එහෙම නැත්නම්, මේකයි ලෝකසවභාවය - 'යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්මං' - යමක් හටගන්නව නම් ඒ සියල්ල නිරුද්ධ වෙනව. හැම දහලීමක්ම දැහලීමකින් කෙළවර වෙනව, සවාභාවිකව. හැම **'දහලීමක්ම' 'දැහලීමකින්'** ඉබේම ඉවරවෙනව. නමුත් අර මැදින් උපාදානය නිසා අන්න ඒව එකතුවෙලා. අර පුද්ගලයගේ අත කිටි කිටියෙ තදවන තරමට - උපාදානය නිසා - මහ ගැට රාශියක් වැටෙනව, දහ රාශියක් එකතුවෙනව. අන්න ඒ විදියේ දෙයක් තමයි මේ. උපාදාන පච්චයා භවො' උපාදානය නිසයි භවය තියෙන්නෙ.

මේක මේ අපි උපමාවකට කිව්ව පමණක් නොවෙයි. මේකට අපට හේතු සාධක ඉදිරිපත් කරන්නත් පුළුවන් සූත්‍ර ආශ්‍රයෙන්ම. මේ 'උපාදාය' කියන වචනය විශේෂයෙන්ම මතක තබාගත යුතු එකක්. උපාදාන කියන්නෙ අල්ලාගැනීම පමණක් **නොවෙයි.** දැඩිව අල්ලාගැනීම කියන අදහසම නොවෙයි. ඇත්තවශයෙන්ම **'ළංවී** අල්ලාගැනීමක්'. මේ අල්වා ගැනීම නිසා එක්තරා විදියක සම්බන්ධතාවක් ඇතිවෙනව. අපි ඒකට තමයි දර්ශනික ව්‍යවහාර වශයෙන් 'සාපේක්ෂක' කියන වචනය යෙදුවෙ. 'සාපේක්ෂතාව' කියන එක, අපට බොහෝ අවසථාවල යොදන්න සිද්ධ උනා. සාපේක්ෂක කියන්නෙ එකකට එකක් අතර ඇති සම්බන්ධතාව. 'ඒක මේකට සාපේක්ෂකව පවතිනව'-අන්න එහෙම. දැන් අර පුද්ගලයගේ ග්‍රහණයට-අල්වාගෙන සිටීමට-සාපේක්ෂකවයි අර කඹය තියෙන්නෙ. එතකොට 'උපාදාය' කියන්නෙ 'උපාදාන' කියන වචනයෙ පූර්ව ක්‍රියාරූපය. මෙතන මේ සාපේක්ෂක කියන අදහස තියෙනව. ඒක ඉතාමත්ම පැහැදිලිවන වටිනා සූත්‍රයක් තියෙනව. ඛන්ධ සංයුත්තයෙ ථෙර වග්ගයෙ පුණ්ණ මන්තානිපුත්ත සවාමීන්වහන්සේ ආනන්ද සවාමීන්වහන්සේට දේශනාකරන සූත්‍රයක් තියෙනව. මෙන්න මේ විදියටයි ඒකෙ සඳහන් වෙන්නෙ -

'උපාදාය ආවුසො ආනන්ද අස්මීති හොති නො අනුපාදාය. කිඤ්ච උපාදාය අස්මීති හොති. නො අනුපාදාය. රූපං උපාදාය අස්මීති හොති නො අනුපාදාය, වෙදනං උපාදාය අස්මීති හොති නො අනුපාදාය, සඤ්ඤං උපාදාය අස්මීති හොති නො අනුපාදාය, සංඛාරෙ උපාදාය අස්මීති හොති නො අනුපාදාය, විඤ්ඤාණං උපාදාය අස්මීති හොති නො අනුපාදාය. උපාදාය ආවුසො

ආනන්ද අස්මීති හොති නො අනුපාදය, සෙයාථාපි ආවුසො ආනන්ද. ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනජාතිකො ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙවා උදකපත්තෙ. සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො උපාදාය පස්සෙය්‍ය නො අනුපාදාය එවමෙව ඛො ආවුසො ආනන්ද උපාදාය අස්මීති හොති නො අනුපාදාය'[4] ආදි වශයෙන් එතන සූත්‍රයෙ සඳහන් වෙන්නෙ. දැන් අපි මේක පරිවර්තනය කරල බලමු. ඉතාම වටිනා සූත්‍රයක්. අපි මෙතෙක් අර නොයෙකුත් උපමාවලින් දක්වපු කාරණා මේ සූත්‍රයෙන් පැහැදිලි වෙනව. 'ඇවැත්නි ආනන්දය, 'උපාදාය අස්මීති හොති' - මේ උපාදාය කියන වචනය පරිවර්තනය කිරීමත් ටිකක් අපහසුයි. ත්‍රිපිටක ග්‍රන්ථ පරිවර්තනයෙදී - ඒක වරදක් නැහැ - අනුපාදාය කියන එකට යොදල තියෙන්නෙ. 'නොනිසා' කියල. බොහොම අමාරුයි ඒක ප්‍රකාශ කරන්න. ඒ කියන්නෙ අර සාපේක්ෂතාව ඇඟවීමයි. හේතුප්‍රත්‍යයක් නිසා කියන එකයි ඒකෙ අදහස. උපාදාය ආවුසො ආනන්ද අස්මීති හොති' - අපි ඒක පරිවර්තනය කළොත් 'යම් කිසිවක් නිසා ඇවැත්නි ආනන්ද 'අස්මි' යන අදහසක් - 'වෙමි' - යන අදහසක් වෙයි. යම් කිසිවක් නිසා 'වෙමි' යන අදහසක් වෙයි. 'නො අනුපාදාය' 'නොනිසා නොවෙයි' ඒ කියන්නෙ, යම්කිසිවකට සාපේක්ෂතාවක් නැතිව නොවෙයි' කියන එකයි. 'නොනිසා නොවේ.'

ඊළඟට 'කිඤ්ච උපාදාය අස්මීති හොති නො අනුපාදාය' - කුමක් නිසා 'අස්මි' යන්නක් වෙයිද? කුමක් නොනිසාද? 'රූපං උපාදාය අස්මීති හොති නො අනුපාදාය' - පාළියේ වාක්‍යක්‍රමය අනුවයි දිගට දිගට යන්නෙ. නමුත් අපි අදහස ගත්තොත් රූපය නිසා, රූපය අල්ලාගැනීම නිසා, මෙතන සාපේක්ෂතාවයි කියන්නෙ - රූපය අල්ලාගැනීම නිසා, එහෙම නැත්නම් රූපය නිසා, 'අස්මි' යන්නක් වෙයි. ඒ වගේම, වේදනාව නිසා, සඤ්ඤාව නිසා, සංඛාර නිසා, විඤ්ඤාණය නිසා. මේ කියන පහෙන් කොයි එකක් හෝ අල්වා ගැනීම නිසා අස්මි යන අදහසක් වෙයි කියන එකයි මෙතන කියන්නෙ. ඊළඟට දෙනව හොඳ උපමාවක්.

ඇවැත්නි ආනන්දය යම් සේ - 'ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩන ජාතිකො' - හොඳට අලංකාර වී සිටීමට කැමති තරුණ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ - 'ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ' - එක්කෝ හොඳට සේදූ හොඳ පිරිසිදු කන්නාඩියක හෝ - 'අච්ඡෙ වා උදකපත්තෙ' පැහැදිලි දියබඳුනක හෝ - 'සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො' - තමාගේ මුහුණ බලන්නේ - 'උපාදාය පස්සෙය්‍ය නො අනුපාදාය' - අර උපාදාය කියන වචනයේ අදහස පැහැදිලි කිරීමටයි මේ උපමාව අරගෙන තියෙන්නෙ. 'උපාදාය පස්සෙය්‍ය නො අනුපාදාය' - එහෙම බැලීමේදී ඒ පෙනීම ඇතිවෙන්නෙ යම්කිසිවක් නිසයි -'නො අනුපාදාය' - නොනිසා

නොවේ. අන්න ඒ විදියට ඒ උපමාව අරගෙන පුණ්ණ මන්තානිපුත්ත ස්වාමීන්වහන්සේ පෙන්නුම් කරනව, ඒ විදියටම රූපයක් අල්ලාගැනීම නිසා, වේදනාවක් අල්ලාගැනීම නිසා, සඤ්ඤාවක් අල්ලාගැනීම නිසා, සංස්කාර අල්ලාගැනීම නිසා, විඤ්ඤාණය අල්ලාගැනීම නිසා, අර විදියට 'අස්මි' කියන හැඟීමක් එනව. කන්නාඩියක් දිහා බැලුවාම තමයි කෙනෙකුට එකපාරටම තමා ගැන සිහිවන්නෙ. සමහර අවස්ථාවල ඒකට ඇල්මක් ඇතිඋනත් නොඇල්මක් ඇතිඋනත් මේ මමෙයි කියන හැඟීමක් එනව. අන්න එතකොට කන්නාඩියෙ තියෙන මුඛ නිමිත්ත මුල්කරගෙන ඒක ළංකර ගැනීම නිසා-අපට අර උපාදාය කියන වචනය හොඳටම කිට්ටු කරගන්න පුළුවන් 'ළං වී අල්ලා ගැනීම' කියන අදහසට-ඒක නිසා ඇතිවන සම්බන්ධතාවක් නිසා අර හැඟීම ඇති වෙන්නෙ. 'වෙමි' කියන හැඟීමක් නොතිබුනත් කන්නාඩියක් ඉදිරියට ගියහැටියෙ එකපාරටම මතක්වෙනව 'ආ මේ ඉන්නෙ මම නේද' කියලා. ඔන්න ඔය අදහසයි, එතකොට පුණ්ණ මන්තානිපුත්ත ස්වාමීන්වහන්සේ ඒ සූත්‍රයෙන් ඉදිරිපත්කළේ.

මේ විදියට බලනකොට මේ අස්මි මානය ඇතිවන්නෙ අර උපාදානස්කන්ධය නිසායි. 'උපාදාන කියන' වචනයෙම එක්තරා ක්‍රියාරූපයක්, පූර්වක්‍රියා රූපයක්,තමයි 'උපාදාය' කියන එක. ඒකෙ තියෙනව ඊට වඩා ගැඹුරු අර්ථයක්. ඒක සම්බන්ධතාවක් අඟවන පදයක්. නිකම්ම අල්ලාගෙන ඉඳීම පමණක් නොවෙයි. අල්ලා ගැනීම නිසා යම්කිසි ධර්මතාවක් බලපානව. අරවිදියට ඒක පිළිබිඹු වෙන්න පටන්ගන්නව. කන්නාඩියෙ වගේ. එහෙම නැත්නම් දිය බඳුනෙ වගේ. පිළිබිඹුවීම නිසා අන්න මෝහනයක් ඇතිවෙනව 'මේ ඉන්නෙ මමයි' කියලා හැඟීමක් ඇතිවෙනව. 'මේ ඉන්නේ මමය' කියල ගත්ත නම්, 'මගේ **දේකුත්**' තියෙන්න ඕන. ඉතින් '**මම**' වෙනමයි, '**මගේ දේ**' වෙනමයි. ඔය දෙක බෙදාගන්න බැරිව තමයි ඊළඟට ලොකු ප්‍රශ්න ඇති වෙන්නෙ. 'මම' මොකක්ද 'මගේ දේ ' මොකක්ද? ඒ මහ ගැටලුව විසඳගන්න බැරුව තමයි අර සක්කායදිට්ඨිය විසි ආකාරයකට ගිහිල්ල තියෙන්නෙ.

විසිආකාර සක්කාය දිට්ඨිය හැදෙන හැටි, රූපය පිළිබඳව ගත්තොත් - රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තංවා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිංවා අත්තානං, - එක එකක් හතර ආකාරයකට බෙදිල යනව. ඒ කියන්නෙ, 'රූපං අත්තතො සමනුපස්සති'-අර දැකපු රූපය - අපි හිතමු මූන දැක්ක කියල - මේක මගේ ආත්මය කියල හිතා ගන්නව. එහෙම නැත්නම් 'රූපවන්තං වා අත්තානං' - මම මේ රූපය සහිත කෙනෙක්. 'රූපවන්ත' කෙනෙක් මම. එහෙමත් නැත්නම් - 'අත්තනි වා රූපං' - මගේ ආත්මය තුළ මේ රූපය තියෙනව. එහෙම නැත්නම්- 'රූපස්මිං වා අත්තානං' - මේ රූපය තුළ මා සිටිනව. ඔන්න ඔය ආකාරයට විසි විදියකට බෙදිල යනව අර සක්කාය දිට්ඨිය. මේ ඔක්කොම සිද්ධ වෙන්නෙ අන්න අර නාමරූප පිළිබිඹුව 'පිළිබිඹුවක් බව' තේරුම් නොගැනීම නිසයි.

එතකොට මේ නාමරූපය - 'පෙනෙනදෙය' - අල්ලාගැනීමේදී, අහුවෙන්නෙ ඔන්න ඔය පස්ආකාරයටයි. දැන් බොහොම දෙනෙකුට ලොකුගැටලුවක් තියෙනව මේ නාමරූපයත් මේ උපාදානස්කන්ධයත් කියන මේව කිට්ටු කරගන්නෙ කොහොමද කියල - මේ සංකල්ප දෙක. දැන් මෙතන, බලන බලන පැත්තෙ පේන්නෙ නාමරූපයයි. ඊළඟට ඒව අල්ලගන්න ගියාම අහුවෙන්නෙ මොකක්ද? රූප ගොඩක් අහුවෙනව. වේදනා ගොඩකුත් අහුවෙනව. සඤ්ඤාගොඩක්, සංස්කාරගොඩක් අහුවෙනව. විඤ්ඤාණගොඩකුත් අහුවෙනව. මේ විඤ්ඤාණයෙ තිබෙන මායාකාර සවභාවය ඒකයි. විඤ්ඤාණය හරියට දෙබිඩි චරිතයක් රඟපාන කෙනෙක් වගෙයි. දෙබිඩි චරිතයක් එතන තියෙන්නෙ. එතන අර පිළිබිඹුවන සවභාවය නිසාම, විඤ්ඤාණයෙ පිළිබිඹුවන සවභාවය නිසාම, ඒ 'කන්නාඩියත්' අල්ලගන්නව. අන්තිමට කන්නාඩියෙ පේන රූපය පමණක් නොවෙයි, කන්නාඩියත් බදාගන්නව. ඔන්න ඔය විදියෙ දෙයක් මෙතන තියෙන්නෙ. විඤ්ඤාණ ගොඩක් අල්ල ගන්නව. දැන් නාමරූපයත් විඤ්ඤාණයත් ගැන සෑහෙන විග්‍රහයක් මේ සූත්‍රය ආශ්‍රයෙන් කෙනෙකුට ඇතිකරගන්න පුළුවන්. තවදුරටත් මේ ගැන හිතනකොට කරුණු මතුකරගන්න පුළුවන්.

ඊ ළඟට අපි බලමු බුදුපියාණන් වහන්සේ මේ නාමයත් රූපයත් අතර ඇති අන්‍යොන්‍ය සම්බන්ධතාව විග්‍රහකිරීමේදී ඉතාමත්ම වටිනා වචන දෙකක් ප්‍රයෝජනයට ගත්ත. **'අධිවචනසම්ඵස්ස' 'පටිඝසම්ඵස්ස'** කියල. නාමයත් රූපයත් නිසා සපර්ශය ඇතිවන්නෙ කොහොමද කියන එක විග්‍රහ කිරීමේදී බුදුපියාණන්වහන්සේ දීඝනිකායෙ මහා නිදාන සූත්‍රයෙ විශේෂ ධර්ම සාකච්ඡාවක් වගේ දක්වනව.[5] බුදුපියාණන්වහන්සේ ආනන්දස්වාමීන් වහන්සේට ප්‍රශ්නෝත්තර මගින් කරුණු පැහැදිලිකර දෙනව. අධිවචනසම්ඵස්සයත් පටිඝසම්ඵස්සයත් කියන මෙන්න මේ දෙකම 'ඵස්ස' කියන වචනය තුළ තියෙනව. ඒ කියන්නෙ, නාමය අනුව ගිය අධිවචනසම්ඵස්සයකුත්, රූපය අනුව ගිය පටිඝසම්ඵස්සයකුත්. මේ කාරණය පාළියෙන් කියන්න ගියොත් ලොකු පටලැවිල්ලක් වගේ වෙනව. නිතර, නිතර පුනරුක්ති වශයෙන් යෙදෙන වචන මාලාවක් නිසා. ඒක නිසා අපි ඒක සිංහලයෙන්ම සරල වශයෙන් - බුදුපියාණන්වහන්සේ ආනන්දස්වාමීන් වහන්සේට ඒත්තු ගන්වන නිගමන හතර පමණක්, සිංහල වචනයෙන් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනව. කලින්ම කියන්න වෙන්නෙ ඒ සූත්‍රයෙ නිතර නිතර එන වචන හතරක් තියෙනව 'ආකාර', ලිංග, 'නිමිත්ත', 'උද්දෙස' කියල.

'ආකාර' කියන එක කාටත් පැහැදිලියි. ආකාරය කියන එක. අමුතුවෙන් සිංහල වචනයක් ඒකට ඕන නැහැ. 'ලිංග' කියල යොදන්නෙ එතන 'ලකුණ' කියන එකටයි. 'නිමිත්ත' කියල කියන්නෙ නිමිති. ඒකත් අර ලකුණ කියන අදහසමයි. 'උද්දෙස' කියල කියන්නෙ, සාමාන්‍යයෙන් උද්දෙස කියන එක මාතෘකා කියන වචනයෙන් පරිවර්තන ග්‍රන්ථ වල

තියෙනව. නමුත් ඒකෙ මූලික අදහස 'යම්කිසි දෙයක් මතුකොට දැක්වීම'. කියන්න හුඟක් දේවල් තිබෙන්න පුළුවනි. නමුත් ඒකෙ මුල් මාතෘකා වශයෙන් ටිකක් මතුකරල දීම තමයි 'උද්දෙස' කියල කියන්නෙ. දැන් සමහර සූත්‍රවල තියෙනව නිතර දකින්නට ලැබෙනව - 'උද්දෙස, නිද්දෙස, පටිනිද්දෙස කියල. සූත්‍රයෙ බුදුරජාණන්වහන්සේ කෙටියෙන් යම්කිසි දෙයක් ප්‍රකාශ කරල, ඒක ඊළඟට 'නිද්දෙස' කරල, ඊළඟට 'පටිනිද්දෙස' වශයෙන් තවත් දීඝ විස්තර දෙනව. ඒ විදියට බලනකොට 'උද්දෙස' කියන්නෙ - අර මාතෘකා කියන වචනය යෙදුවට වරදක් නැහැ - යම්කිසි කාරණයක් මතුකොට දැක්වීම. එතකොට මේ පද හතරෙම සමීප අර්ථ තියෙන්නෙ. සමීපාර්ථවත් පදහතරක්, ආකාරය, ලකුණ, නිමිත්ත, මාතෘකාව. දැන් මේ වචන හතර අනුව, මේ වචන හතර ප්‍රයෝජනයට අරගෙන, අපි නිගමන හතර ගැන කල්පනා කරල බලමු. බුදුපියාණන්වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට ප්‍රශ්නෝත්තර මගින් ඒත්තු ගන්වන නිගමන හතර මෙන්න මේවයි.

'යම් ආකාරවලින්, යම් ලකුණුවලින්, යම් නිමිති වලින්, යම් මාතෘකා වලින් නාම කායයක් - නාම ගොඩක් - පැනවිය හැකිවේද, පැනවෙයිද, එකී ආකාර ඒ ලකුණු, ඒ නිමිති ඒ මාතෘකා නැතිකල්හි, රූප කායයෙහි, අධිවචනසම්ඵස්සයක් නොපැනවිය හැකිය. ' ඒ පළමු නිගමනය.

දෙවෙනි නිගමනය: 'යම් ආකාරවලින්, යම් ලකුණුවලින්, යම් නිමිතිවලින් යම් මාතෘකා වලින් රූපකායයක් පැන වෙයිද - පෙන්නුම් කළ හැකි වෙයිද - ඒ ආකාර, ඒ ලකුණු ඒ නිමිති, ඒ මාතෘකා නැති කල්හි, නාමකායය පිළිබඳව පටිඝ සම්ඵස්සයක් පෙන්නුම් කළ නොහැකි වෙයි'. ඒ දෙවෙනි නිගමනය.

තුන්වෙනි නිගමනය: 'යම් ආකාරවලින්, යම් ලකුණුවලින්, යම් නිමිති වලින්, යම් මාතෘකාවලින්, නාමකායයක් හෝ රූපකායයක් හෝ පෙන්නුම් කළ හැක්කේද, ඒ ආකාර, ඒ ලකුණු. ඒ නිමිති. ඒ මාතෘකා නැතිකල්හි අධිවචනසම්ඵස්සයක්වත් පටිඝ සම්ඵස්සයක්වත් පෙන්වාලිය නොහැක.

හතරවැනි නිගමනය: 'යම් ආකාරවලින්, යම් ලකුණු වලින්, යම් නිමිතිවලින් යම් මාතෘකාවලින් නාමරූපයක් පෙන්නුම් කරනු ලැබෙයිද. ඒ ආකාර, ඒ ලකුණු ඒ නිමිති, ඒ මාතෘකා නැතිකල්හි සපර්ශයක් පෙන්නුම් කළ නොහැකිය.

දැන් අපි කෙටියෙන් නැවත මතක්කර ගත්තොත්, මුල් නිගමනයෙන් කියැවෙන්නේ - අර ආකාර ලකුණු නිමිති මාතෘකා කියල කියන්නෙ බොහෝදුරට සමීපාර්ථවත් පද - යම් යම් ලකුණු නිසා, යම් යම් ලකුණු මුල්කරගෙන නාමකායයක් - නාමරූප දෙකෙන් නාමගොඩක් - 'නාම'

කියන අංශය, පෙන්නුම් කරනු ලැබේද? ඒ ආකාර, ඒ ලකුණු ආදියක් නැත්නම් රූපකාය පිළිබඳව අධිවචනසම්ඵස්සයක් ගැන කථා කරන්න බැහැ.

දෙවෙනි නිගමනයෙන් කිව්වෙ යම් ආකාර ලකුණු ආදියෙන් රූපකායයක් පෙන්නුම් කරනු ලැබේද? ඒ ආකාර ලකුණු නැත්නම් නාමකායය පිළිබඳව පටිඝසම්ඵස්සයක් දක්වන්න බැහැ.

තුන්වැනි කාරණයේදී දෙකම එකතුකරල දක්වනව. තුන්වෙනි නිගමනය - යම් ආකාර, ලකුණු නිමිති ආදියෙන් නාමකායයක් හෝ රූපකායයක් හෝ දක්වනු ලැබේද? ඒ දෙකම නැත්නම්, අධිවචනසම්ඵස්සයක්වත්, පටිඝසම්ඵස්සයක්වත් දක්වන්න බැහැ.

හතරවෙනි නිගමනය: යම් ලකුණු නිමිති ආදියකින් නාමරූපයක් දක්වනවනම්, ඒ ලකුණු නිමිති ආදියක් නැත්නම් සපර්ශයකුත් දක්වන්න බැහැ. ඒ ලකුණු නිමිති ආදිය නැත්නම් සපර්ශය ගැන කථාකරන්න බැහැ.

එතකොට මේක බැලුවාම ප්‍රහේලිකාවක් වගේ, ගැටලුවක් වගේ. නමුත් මෙතෙන්දි අපි පළමුවෙන්ම කල්පනාකර බැලිය යුතුව තිබෙනව නාමරූප දෙක ගැන. අපි මුල්ම දේශනයේදී කළ විග්‍රහයෙන් නාම කියන වචනය හැදින්වූයේ, සාමාන්‍යයෙන් මෙකල බොහෝවිට හඳුන්වනව වගේ නැමීමක් කියන අර්ථයෙන් නොවෙයි. නාම කියල කියන එකට නම්කිරීමක් කියන අදහසයි අපි දුන්නෙ. මේ අධිවචන කියන වචනයෙ තියෙන්නෙත් මේ නම්කිරීම කියන අදහසයි. අධිවචන, නිරුත්ති, පඤ්ඤත්ති කියන්නෙ භාෂාව්‍යවහාරයෙ අංගෝපාංග. ඛන්ධසංයුත්තයෙ නිරුත්තිපථ සූත්‍රයේ[6] එහෙම සඳහන් වෙනව. නිරුත්තිපථා අධිවචනපථා පඤ්ඤත්තිපථා ආදී වශයෙන්.

නිරුත්ති අධිවචන පඤ්ඤත්ති කියන පද බොහෝදුරට සමානාර්ථවත් ඒවායි. අර්ථ එකිනෙකට ළඟින් යන්නෙ. ඒව අර භාෂාව්‍යවහාරය පිළිබඳ අංගෝපාංග හඳුන්වන දේවල්. අධිවචන කියල කියන්නෙ, ආරූඪ කරන ලද ව්‍යවහාර විධි. නිරුත්ති කියල කියන්නෙ යම්කිසි වචනයක් හැදිච්ච ආකාරය පෙන්නුම් කරනකොට එහෙම නිරුත්ති දෙනව කියනව. ඒ කියන්නෙ, හේතු කාරණා දැක්වීමේදී යොදගන්නා එක්තරා ව්‍යවහාර විධියක්. පඤ්ඤත්ති කියල කියන්නෙ, ප්‍රකට කොට දැක්වීම සඳහා - පඤ්ඤපෙති, පඤ්ඤාපෙති - පැණවීම් වශයෙන්. එතකොට, අරූඪකරල දක්වන සමහර ව්‍යවහාරවලට, වාග් ව්‍යවහාරවලට. අධිවචන නාමය යොදනව. හේතුකාරණා දැක්වීමේදී නිරුත්ති යොදගන්නව. ඊළඟට යම් යම් දේ පැනවීමේදී - 'මෙන්න මෙතැන සිට මේ විදියට හඳුන්වනු ලැබේ කියල - අන්න පඤ්ඤත්ති. මේව බොහෝ දුරට එකිනෙකට සමානයි. එතකොට මෙතන 'අධිවචන සම්ඵස්සය' තියෙන්නෙ. අපි 'නාම' කියන

එකට දීපු හැඳින්වීමට සමානයි. 'නාම' කියල කියන්නෙ 'නම් කිරීමක්' කියල අපි ගත්ත. මේ නම් කිරීමට අදාළ දෙයක් තමයි අධිවචන කියල කියන්නෙ. එතකොට මේ නාමකායය හා සම්බන්ධව තියෙනව එක්තරා විදියක - අර භාෂාව්‍යවහාරයට කිට්ටුවන අන්දමේ - හැඳින්වීම පිළිබඳ, හැඳින්වීමට උපකාරවන, නම් කිරීමට උපකාර වන, එක්තරා මූලධර්ම වර්ගයක් මෙතන මේ නාමකොටසෙ. ඊළඟට රූප කොටසෙ තියෙනව - අර 'පටිඝ සම්ඵස්ස' කියල හැඳින්වුවේ - 'පටිඝ' කියල කියන්නෙ 'හැපීම' 'ගැටීම' කියන එකයි. රූපයෙ තියෙනව ගැටෙන ලක්ෂණයක්. නාමයෙ තියෙනව හැඳින්වීමේ ලක්ෂණයක්. ඔය දෙකම එකතු වෙලයි 'ඵස්ස' කියන එක හැදෙන්නෙ. ඒකයි එතන වඩාත් ගැඹුරු තැන. අර 'ස්පර්ශය' කියන ප්‍රඥප්තියට අර දෙපැත්තම ඕනය කියන එකයි බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරන්නෙ. ඒ කියන්නෙ, වෙන විදියකට කියනවනම් නාමයත් රූපයත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව අවශ්‍ය දෙයක් හැටියටයි එතන දක්වන්නෙ. මක්නිසාද? අර කලින් කියවුනා - නාමයක් පෙන්නුම්කරන යම්කිසි ලකුණු නිමිති ආදියක් නැත්නම් රූපකාය පිළිබඳව අධිවචනසම්ඵස්සයක් ඇතිවෙන්නෙ නැහැ. ඊළඟට රූපයක් පෙන්නුම් කරන - රූපගොඩක් පෙන්නුම් කිරීමට උපකාර කරගන්න - ලකුණු ආදියක් නැත්නම් නාමකාය පිළිබඳව පටිඝසම්ඵස්සයක් පෙන්නුම් කරන්න බැහැ. මෙතන බැලුවාම එකකට එකක් පටහැනි දේවල් වගේ නමුත් අන්‍යෝන්‍ය සම්බන්ධයක් මෙතන තියෙන්නෙ. නාමකය පිළිබඳ අධිවචනය රූපයට උපකාරවෙනව. රූපකය පිළිබඳව - රූපකය කියනකොට එකපාරටම හිතට නැගෙන්නෙ අර ගැටීම කියන එක - ඒ පටිඝය නාමකයටත් උපකාර වෙනව. දැන් මෙතන මේ ගැඹුරු තැනක් නිසා එක්තරා විදියක උපමාවකින් අපි මේක තේරුම් කරන්න බලමු.

මුලින්ම මේ රූපකය පිළිබඳව. දැන් රූපකය පිළිබඳව අපි මෙතන ප්‍රකාශ කළා, අධිවචන සම්ඵස්සයක් ඇතිවෙන්නෙ නාමකයට අදාළ යම්කිසි අංගෝපාංග නිසයි කියල.

ඒක ඉතාමත්ම පහසුවෙන් තේරුම් කරන්න පුළුවනි, රූපකයට අදාළ දේවල් වශයෙන් දක්වන්නේ මහාභූතධර්ම - පඨවි, ආපො, තෙජො, වායො - මේ පඨවි, ආපො, තෙජො, වායො හඳුනාගන්නෙ කොහොමද? මේක තදද, බුරුල්ද කියල බලනව. ඊළඟට මේක සිසිල්ද උණුසුම්ද කියල බලනව. මේ හැම එකටම එතකොට අර වේදනා, සඤ්ඤා, චෙතනා, ඵස්ස, මනසිකාර කියන ධර්ම උපකාර වෙනව. මේ රූපයට අදාළ මහාභූතධර්ම හඳුනාගැනීමේදිත් අර නාමධර්ම උපකාර වෙනව.

අපි තවත් විදියකට මේක කල්පනාකරල බැලුවොත්, දැන් ඔය වඩුවන් මේසන්වරුන් එහෙම වැඩකරන තැනක අපි හොඳට කන්දීගෙන අහගෙන හිටියොත්, සමහරවිට ඒ අය යොදන භාෂාව්‍යවහාර නුහුරු වගේ පේනව. හරි අමුතු විදියෙ ව්‍යවහාර යොදනව. ඒ කියන්නෙ, තමන් භාවිතා කරන

උපකරණවලට, තමන් කරන වැඩවලට උපකාර කරගන්න දේවල් වලට, පණ තියෙන හැටියට සළකල ඔවුන් කථාකරනව සමහර අවස්ථාවල. ප්‍රාණත්වාරෝපනයක් කරනව. දැන් ඔන්න උළුවස්සක දෙරක් හයි කරනකොට සමහරවිට කියන්න පුළුවන්, ඒ දෙර බර වැඩිනම් එහෙම, 'මේ දෙරට ගායක් තියෙනව' කියල. දෙරට නොවෙයි ගාය වඩුවටයි තියෙන්නෙ. නමුත් ඒක වඩුව දෙරට බාර දෙනව. මේ හිත්පිත් නැති දෙර. 'දෙරට ගායක් තියෙනව'. එහෙමත් නැත්නම් කියන්න පුළුවන්. 'දෙරේ හේත්තුව හොඳයි'. දෙර කොහේවත් ගිහිල්ල හේත්තු වෙන්නෙ නැහැ. නමුත් මේ 'හේත්තුව' 'ගාය' ආදී වචන අර තනිකර රූපධර්ම වලට ආරෝපනය කිරීමක් තිබෙනව. ඔන්න ඔය ආරෝපනය කරන ගතිය අර 'අධිවචන' වචනයෙ තිබෙනව. අපි කලින්ම කීව අධිවචන ගැන කියනකොට 'ආරූඪකරන' කියල. 'රූඪි' වශයෙන්. 'රුළ්හි' වශයෙන්, 'ආරූඪ' කරනව' නාම ධර්මයෙන් 'ණයට' ගත්තු නාමකොටසින්, ණයට ගත්තු යම් යම් ලකුණු උපකාර කරගෙනයි, එතකොට රූපධර්මවල 'දෙරේ හේත්තුවක්' 'දෙරේ ගායක්' ගැන එහෙම කථා කරන්නෙ.

අපි ඒ ගැනම තව ටිකක් හිතනවනම්, දෙරපලු දෙකක ඒ ලෑලි දෙක එකකට එකක් 'හේත්තු වෙනව' කියල අපි කියනව. මේ හේත්තුව වෙන්නෙ කොහොමද? බැලුවහම ඊළඟට ප්‍රශ්නෙ අහන්න පුළුවන් වම් පැත්තෙ එකද දකුණු පැත්තෙ එකට හේත්තු වෙන්නෙ. දකුණු පැත්තෙ එකද වම් පැත්තෙ එකට හේත්තු වෙන්නෙ කියල. මෙතන එහෙමපිටින්ම තියෙන්නෙ අර නාමධර්මයන් පිළිබඳ, ඒ කියන්නෙ හිත පිළිබඳ කාරණයක්, යම් තැනකට **අවධානය** යොමුවෙනවනම් - මෙතනදි අපට ආයෙත් මතක්කරගන්න පුළුවන් 'කිංමූලක' සූත්‍රය, 'සමිද්ධි' සූත්‍රය ආදියෙදී අපි ප්‍රකාශකළා යමක් 'දෙයක්' වන්නෙ කොහොමද කියන ඒ කාරණය. බුදුපියාණන්වහන්සේගේ 'මනො පුබ්බංගමා ධම්මා' කියන ධර්මනියාමතාව අනුව 'ඡන්දමූලකා ආවුසො සබ්බෙ ධම්මා මනසිකාර සම්භවා. ඵස්ස සමුදයා' ආදී වශයෙන් එක්තරා සූත්‍රයක සඳහන් වන බව ප්‍රකාශ කළා.

ඒ වඩුවගේ 'ඡන්දය' යම්කිසි තැනකට ගියාද, මනසිකාරය යම් කිසි තැනකට ගියාද අන්න ඒ මනසිකාරයට තමයි **'හම්බ උනෙ'**. අර දෙරයි උළුවස්සයි වෙන්කර ගත්ත. එහෙම නැත්නම් දෙරේම ලෑලිදෙක වෙන්කරගෙන එකකට තව එකක් හේත්තු වෙනව කියල ව්‍යවහාරයක් පාවිච්චි කරනව. දෙරට 'ගායක්' ගැන කථා කරනව. මේ ඔක්කොම අන්න අර ඡන්ද මනසිකාර ඵස්ස ආදී 'නාම' පැත්තට ගැණෙන ඒ ධර්මයන් මුල්කරගෙන. මෙතන ප්‍රතීත්‍යසමුත්පාදය පිළිබඳව එක්තරා ගැඹුරු ධර්මතාවක් පෙනෙන්නෙ. බාහිර සිත්පිත් නැති දේවල් පිළිබඳව පමණක් නොවෙයි. මේ ජීව ශක්තිය ඇති අපේ ශරීරය ගැන කල්පනාකරල බැලුවත්,

දැන් මා ස්පර්ශකරන්නෙ මොකක්ද කියල ඇහුවාම - සාමාන්‍යයෙන් අපි ස්පර්ශය ගැන කල්පනාකරනකොට පළමුවෙන්ම අතගෑම ගැනයි හිතන්නෙ. ඒ කියන්නෙ අතයි. ඉතින් මම ස්පර්ශකරන්නෙ අල්ලාගෙන ඉන්න වටාපතය කියල කියන්න පුළුවන්. ස්පර්ශවීමේ වඩා ඕළාරික අවස්ථාව තමයි අල්ලාගැනීම. අල්ලාගැනීමට පාවිච්චි කරන්නෙ **'අත්ල'**. 'අත්ල' ගන්නව. අත්ල තමයි ප්‍රධානවශයෙන් අපි යමක් අල්ලගන්න පාවිච්චි කරන්නෙ. ඒකනිසා මොකක්ද අල්ලගෙන ඉන්නෙ? මොකක්ද ස්පර්ශ කරන්නෙ? කියල ඇහුවාම එකපාරටම මේ වට අත්ත අල්ලාගෙන ඉන්නව කියන්න පුළුවන්. නමුත් මේක අතහැරියාම කෙනෙකුට සැක හිතෙන්න පුළුවන් ආයෙත් ඇහුවොත් මම මොකක්ද ස්පර්ශ කරන්නෙ කියල. ඒක සමහරවිට බාහිර කෙනෙකුට හිතාගන්නවත් බැහැ. මොකක්ද ස්පර්ශ කරන්නෙ කියල. ඒක තමන්ගේ මනසිකාරය යම් තැනකට යොමුවෙනව නම් ඒ අනුවයි. මේ සිවුර ශරීරය ස්පර්ශකරනව කියන හැඟීම එන්න පුළුවන්. අන්න එතකොට කලින් මේ සිවුරයි මායි එකයි කියල හිතාගත්තු එක, ඊළඟට සිවුර වෙනමයි මා වෙනමයි - ශරීරය වෙනමයි. අන්න එතෙන්දී වෙන්නෙ අර විඤ්ඤාණයයි. විඤ්ඤාණය කියල කියන්නෙ මෙතන මේ ඉන්ද්‍රියඥානය පිළිබඳ එක්තරා අවස්ථාවක්. දැන් ඉදිරිපිට තිබෙන මේ දේවල් වලට මගේ ඇස් යොමු වෙලා තිබුනත්, අවධානය යොමුවන තාක් චක්ඛු විඤ්ඤාණය හට ගන්නෙ නැහැ. මේ ඇසයි, මේ රූපයයි කියල වෙන්කරල දැක්වීම තමයි මේ විඤ්ඤාණයෙන් කරන්නෙ. වෙන්කර දැක්වීම. ඒ වෙන්කර දැක්වීමෙන් පස්සෙ තමයි අනිත් ඔක්කොම පටන්ගන්නෙ. ඊළඟට අර දෙකක් හැටියට වෙන්කර ගත්තු දෙකත්, ඒ වෙන්කර දැක්වීමත්, කියන කාරණා තුන එකතු උනාම තමයි, 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො[7] ආදී වශයෙන් අන්න ස්පර්ශයක් ඇතිඋනා. අර දෙර ආදී දේවල් පිළිබඳවත් ඒ වගෙයි. එතකොට, මෙතන අර නාම ධර්මයන්ගේ - සිත පිළිබඳ - මනසිකාර, ඡන්ද, ඵස්ස ආදී ඒ සංකල්ප මුල් කරගෙනයි ඒ ද්‍රව්‍යධර්ම, සිත්පිත් නැති දේවල් පිළිබඳව හෝ අපි 'රූඪි' වශයෙන් ආරූඪ වශයෙන් - හැපීමක් ගැන ඝට්ටනයක් ගැන කථාකරන්නෙ. සම්ඵස්සය කියල කියන්නෙ, එකට හැපීම. මේ එකට හැපීමක් ගැන කථාකරන්න පුළුවන්වෙන්නෙ අන්න අර නාමධර්මයනුත් උපකාර කරගෙන. ඊළඟට දැන් අපි බලමු පටිඝසම්ඵස්සයක් වෙන්නෙ කොහොමද? දැන් මෙතන කියන විදියට අර රූප ධර්මයන්ගෙ පිහිටෙන් නාමධර්මයන් පිළිබඳ පටිඝසම්ඵස්සයක් ඇතිවෙන්නෙ කොහොමද? දැන් නාමධර්මයන් පිළිබඳව, අපි සමහරවිට හිතට අදහසක් ගැටුන කියල කියනව. ව්‍යවහාරකරනව. ස්පර්ශයේ ඉතාමත්ම ප්‍රකට අවස්ථාව තමයි ද්‍රව්‍ය පිළිබඳව අපට දකින්න ලැබෙන දේ. ඒ කියන්නෙ යම්කිසි දෙයක් තවත් දෙයක ගැටීම කියන අදහසයි, ස්පර්ශයේ පටිඝ අංශයෙන් හැඟෙන්නෙ. අන්න ඒ නිසාම තමයි - ඉතාමත්ම සැකෙවින්

මේ කාරණය පෙන්නුම් කරතොත් - ධාතු විභංග සූත්‍රයෙත්,[8] සංයුත්ත නිකායෙ ඵස්සමූලික සූත්‍රයෙත්[9] බුදුපියාණන්වහන්සේ උපමාවක් යොදනව - 'ද්වින්නං කට්ඨානං සංඝට්ටන සමොධානා' - කියන ඒ විදියට කෝටු කෑලි දෙකක් එකට ගැටීම, සපර්ශයට නිදසුනක් හැටියට දක්වනව. අන්න එතකොට සපර්ශය කියන එකේ මූලික අර්ථය අර විදියට කෝටු කෑලි දෙකක් එකට ගැටීම වගේ එක්තරා ඖළාරිකව පෙනෙන අවස්ථාවක්. නමුත් මේ ස්පර්ශයේ අර නාම පැත්තට සම්බන්ධයකුත් තිබෙන බවයි අපි අර වඩුවා පිළිබඳ උපමාවෙන් දැක්වුයේ. මේ දෙකම එකතු වෙන්න ඕන. මේ පටිඝසම්ඵස්සයත්, අධිවචන සම්ඵස්සයත් එකතු උනාට පස්සෙ තමයි අර 'නාමරූප පච්චයා ඵස්සො' - නාමරූපය නිසා ස්පර්ශය ඇති වෙන්නෙ. ඔන්න ඔය විදියට එතකොට මෙතන මේ නාමයත් රූපයත් අතර ස්පර්ශය කියන සංකල්පය එහෙම පිටින්ම නාමය ඇසුරුකරගත්තු අධිවචන පක්ෂයත් රූපය ඇසුරු කරගත්තු ඒ ගැටීම පිළිබඳ සංකල්පයත් ඒ දෙකම එකතු වෙලා තමයි මේ ස්පර්ශය ඇතිවෙන්නෙ.

මේකෙදිම අපට තවත් මතක්කරගන්න පුළුවන් කාරණයක් තියෙනව. මේ රූපය කියන එක. මේ 'රූප' කියන වචනය බෞධනිකායවල නොයෙකුත් ආකාරයට විග්‍රහකරන්න යෙදිල තියෙනව. බුදුපියාණන් වහන්සේ රූපය හැඳින්වුයේ කොහොමද? දැන් 'රූප' කියල කියනකොට නොයෙකුත් අර්ථ එන්න පුළුවන්. ඇසට පෙනෙන රූපය වෙන්න පුළුවන් එහෙම නැත්නම් ද්‍රව්‍ය හැටියට අපි සළකන ද්‍රව්‍යලෝකයේ භෞතික වශයෙන් සළකන රූපය වෙන්න පුළුවන්. මේක මහ ගැටලුවක් බවටත් පත්වෙලා තියෙනව. මේ රූප කියන එකෙන් අපි මොකක්ද අදහස් කරන්නෙ. බුදුපියාණන්වහන්සේ මේ රූප කියන එකට එක්තරා නිරුක්තියක් දෙනව. ඛන්ධ සංයුත්තයේ ඛජ්ජනීය සූත්‍රයෙ[10] රූපය හඳුන්වන්නෙ මේ විදියටයි. එතන ඒ උපාදානස්කන්ධ අතුරින් රූපස්කන්ධය තෝරන්නෙ. -

"කිඤ්ච භික්ඛවෙ රූපං වදෙථ? රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති, කෙන රුප්පති සීතෙනපි රුප්පති, උණ්හෙනපි රුප්පති, ජිඝච්ඡායපි රුප්පති පිපාසායපි රුප්පති, ඩංසමකසවාතාතප සිරිංසප සම්ඵස්සෙනපි රුප්පති, රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති" කිඤ්ච භික්ඛවෙ රූපං වදෙථ - කුමක්ද මහණෙනි රූපය කියන්නෙ? 'රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති. රුප්පනයවේ යන අදහසින් එයට රූපයයි කියනු ලැබේ - 'කෙන රුප්පති' කුමකින්ද රුප්පනයවෙන්නෙ? සීතලෙන් උෂ්ණයෙන්, කුසගින්නෙන්, පිපාසයෙන්, මැසි, මදුරු, සර්ප ආදීන්ගේ ස්පර්ශයෙන්, අවු වැසි සුළං, ආදී ස්පර්ශවලින් - ඔය කියන දේවල් වලින් රුප්පනය වෙනව. මේ රුප්පනය වන අර්ථයෙන්, රුප්පනය වන නිසා, ඒකට රූපය කියල කියනව.

මෙතන ඉතාමත්ම ගැඹුරු ධර්මයක් අඩංගුවෙලා තියෙනව. ඒ නිසාම නොයෙකුත් බෞද්ධ නිකායවල මේ සූත්‍ර පාඨයම නොයෙකුත් ආකාරයට විග්‍රහ කරනව. අර ලෝකයේ තිබෙන භෞතිකවාදී දර්ශනවලට වඩා වෙනස් මගක ගමන් කරලයි බුදුපියාණන්වහන්සේ මෙතන මේ 'රුප්පති' කියන වචනයක් යොදල තියෙන්නෙ. මේ සීත, උෂ්ණ ආදියෙන් රුප්පනය වන්නෙ ලෝකයේ සිත්පිත් නැති ගස් ගල් ආදිය නොවෙයි. මේ ශරීරය. එතකොට මේ ශරීරය තේරුම් කරල තියෙන්නෙ ජීවිතින්ද්‍රියක් ඇතුල්කරල පණගැන්විය යුතු පරමාණු මිටියක් හැටියට නොවෙයි. යෝගාවචරයාට ප්‍රත්‍යක්ෂ මේ රූපයයි. මේ රූපකායයි. ශාස්ත්‍රීය අංශයෙන් මේවා විග්‍රහකරන්න ගියාම මහ පටලැවිලි රාශියක් ඇතිවුනා. නමුත් මෙතන ඉතාමත්ම පැහැදිලියි. ප්‍රත්‍යක්ෂයට ළංකරගන්න පුළුවන්. මේ මුළු මහත් ධර්මය බුදුපියාණන් වහන්සේ දේශනා කළේ මේවා පිළිබඳ වචන රාශියක් එකතු කරගෙන නොයෙකුත් විදියේ ශාස්ත්‍රීය දර්ශන නිපදවා ගැනීමට නොවෙයි. 'එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය' - ඒකාන්තවූ නිර්වේදය විරාගය නිරෝධය සඳහායි. ඒක නිසා මේ 'රුප්පති' කියන වචනය මෙතන හඳුන්වපු ආකාරයත් හරියටම ගැලපෙනව. මැසිමදුරුවන්ගෙන් සීතලෙන් උෂ්ණයෙන් මේවයෙන් රුප්පනය වන නිසයි මේකට රූපය කියල කියන්නෙ. වෙන මේකෙ තියෙන පරමාණුවක් නිසා නොවෙයි. දැන් අපි තවදුරටත් මේ රුප්පන කියන වචනයේ තේරුම බලනවනම්, මේ අදහස තවත් තැනක සඳහන් වෙනව. සුත්තනිපාතයෙ පාරායණ වග්ගයෙ පිංගිය සූත්‍රයෙ එක්තරා වටිනා ගාථාවක මෙන්න මෙහෙම සඳහන් වෙනව - 'රුප්පන්ති රූපෙසු ජනා පමත්තා[11], ප්‍රමාදයට පත් ජනයා රූපයන්හි රුප්පනය වෙති' එතනත් රුප්පනය කියන වචනය යෙදෙනව. අපි තාම හරියට මේ රුප්පනය කියන එකට අර්ථයක් සොයාගත්තෙ නැහැ. ඒකට නිද්දෙසයෙ දෙන අටුවාව මෙහෙමයි, රුප්පනය කියන එක තෝරනව. 'රුප්පන්තීති කුප්පන්ති පීළයන්ති ඝට්ටයන්ති බ්‍යාධිතා දොමනස්සිතා හොන්ති[12], ඔය විදියටයි ඒක තෝරන්නෙ. 'කුප්පන්ති' කියන්නෙ කිපෙනව, කෝපවෙනව. 'පීළයන්ති' - පීඩාවෙනව, 'ඝට්ටයන්ති' - ගැටෙනව - 'බ්‍යාධිතා' - ඒ කියන්නෙ ලෙඩවෙනව 'දොමනස්සිතා හොන්ති' - දෝමනස් වෙනව. අර රුප්පනය කියන එකට දෙන්න පුළුවන් අර්ථ රාශියක් මෙතන ඉදිරිපත් කරල තියෙනව. කිපෙන, පෙළෙන, ගැටෙන, ලෙඩවෙන, දෝමනස්වෙන, මේ කියන අර්ථ රාශියක්. මේව ගස් ගල්වලට වෙන දේවල් නොවෙයි. ජීවමාන ශරීරයකට වෙන දේවල්. ඒකාන්ත නිර්වේදය සඳහා බුදුපියාණන්වහන්සේ ධර්මය දේශනා කළ බව අපි මතක් කර ගත්ත. දැන් මේ වචන රාශියටම ගැලපෙන සිංහල වචනයක් - මේ කාලයේ යෙදෙන සිංහල වචනයක් - අපි ළංකර ගත්තොත්, සමහරවිට '**ඉද්දෙනව**' කියන වචනය කියන්න පුළුවන්. ශාස්ත්‍රීය වචනයක් නොවන්න පුළුවන්. පාරිභාෂික ශබ්දයක් නොවන්න පුළුවන්.

නමුත් මෙතෙන්ට ගැලපෙනව. '**ඉද්දෙනව**'. මේ රූපසක්ඛන්ධය **ඉද්දෙනව** මේ කියාපු දේවල්වලින්.

මේ රූපස්කන්ධය කියන්නෙ නවදෙරක් ඇති මහ වණයක්. මේ මහවණය තුනී සම් වෙලුමකින් වෙළල තියෙනව. මේකට මැසිමදුරුවො පාත්උනත් සීතලක් උෂ්ණයක් ආවත් මේක ඉද්දෙනව. මේ තුවාලෙ ඉද්දෙනව. මේ මහවණය ඉද්දෙනව. එතකොට මේ ඉද්දෙන අර්ථයයි රූප්පනය වෙන කියන එකේ තියෙන්නෙ. ඒක තවත් අපට පැහැදිලිවෙනව සුත්තනිපාතයෙ එන උට්ඨාන සූත්‍රයෙන්. උට්ඨාන සූත්‍රයෙ සඳහන්වෙනව: 'ආතුරානං හි කා නිද්දා සල්ලවිද්ධාන රුප්පතං[13], ඒ කියන්නෙ කෙලෙස් ආතුර වූ, තණ්හා නමැති ඊතලයෙන් විදිනු ලැබ රුප්පනය වන්නවුන්ට - පීඩා විදින්නවුන්ට, කවර නම් නින්දෙක්ද? ඒ අර උත්සාහවන්ත වීම, අප්‍රමාද වීම, පිළිබඳව උට්ඨාන සූත්‍රයෙ දැක්වෙන ගාථාවක පදයක්. ඊතල වලින් විදිනු ලැබ රුප්පනය වන්නන්ට, පීඩා විඳින්නන්ට, කවර නම් නින්දෙක්ද? අන්න එතනත් රුප්පනය කියන එකේ මේ ඉද්දෙන ගතියයි තියෙන්නෙ. තුවාල වෙලා එයින් පීඩා විඳිනව. ඔන්න ඔය විදියට මේ 'රූප' කියන වචනයෙ අර්ථය අනුව අපට හිතාගන්න පුළුවන් මුල් කාලයේ ඉතාමත්ම සරලයි. අපි මුලදීම මුල්ම දේශනාවල ප්‍රකාශ කළා මේ සූත්‍රාගත ධර්මය ඉතාමත්ම සරලයි. මේ සරලත්වය තුළ තියෙනව යම්කිසි ගැඹුරක්. නිර්මල ජලාශයකයි පතුල බලන්න පුළුවන් වන්නෙ. මේ සරලත්වය නිසාම මේ සූත්‍රදේශනා ගැන එක්තරා උදාසීනත්වයක් පසුකාලෙක ඇතිවුනා. මක්නිසාද? සාමාන්‍ය ජනයා කැමතියි සංකල්ප රාශියකට. සමහරවිට ඒක සිදුවුනා භෞතිකවාදී දර්ශන රාශියකට. විශේෂයෙන්ම හින්දු දාර්ශනිකයන්ටත් ඔවුන් අනුව ගිය සමහර බෞද්ධ දාර්ශනිකයන්ටත්, ඒක සිද්ධවුනා. නවීන විද්‍යාවටත් ඒක සිඩවුනා. ඒ කියන්නෙ 'රූප' කියන වචනයෙ භෞතික පැත්තෙන් එළවගෙන ගියා. මේක මිරිඟුවක් ඔස්සේ දීවීමක් බව ඒ අය තේරුම්ගත්තෙ නැහැ. මේ රූපය විග්‍රහකරගෙන විග්‍රහකරගෙන ගිහින් අන්තිමට පරමාණු ගොඩක්, මහා සංකල්ප ගොඩක්, බදා ගත්ත. රූපය බෙදාගෙන බෙදාගෙන ගිහින් අන්තිමට සංකල්ප ගොඩක් **බදාගන්න** සිද්ධ වුනා. '**කණුවක්** බදා ගත්තත්, '**අණුවක්** බදා ගත්තත්, උපාදානය උපාදානයමයි. අන්න ඒක නිසා මෙතන මේ බුදුපියාණන්වහන්සේ දක්වා වදාළෙ මොකක්ද? මේ රූපයෙ තිබෙන ගැහැටින්, පීඩාවෙන් මිදීමට නම් කළ යුත්තේ මොකක්ද? රූප සඤ්ඤාවෙන් මිදීමයි. 'රූප සඤ්ඤා' කියන වචනයයි මෙතන වැදගත් වන්නෙ. ධර්මානුකූලව කල්පනා කරන කොට රූපය කියන එක භෞතික වශයෙන් සංකල්ප ගොඩකට නගල හෝ අණුදක්න ආදියෙන් පරීක්ෂා කරන්න ගියොත් වෙන්නෙ මිරිඟුවක් ඔස්සෙ යාමයි. ඒක නවීන විද්‍යාඥයා මෑතකදී තේරුම්ගත්ත - තමා යන්නෙ මිරිඟුවක් ඔස්සේ බව. මක්නිසාද තමා ඒ

රූපය විග්‍රහ කිරීමේදී පාවිච්චි කරන සිතෙන්ම ඒක එක්තරා විදියකට වෙනස් වෙන නිසා. ඒ කියන්නෙ නාමරූප ධර්මයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව තේරුම් නොගෙනයි මිරිඟුවක් ඔස්සෙ එලෙව්වෙ.

ඔන්න ඔය විදියෙ තත්ත්වයකට වැටෙන්නෙ නැහැ, මෙතන තිබෙන ප්‍රශ්නය රූපය නොවෙයි, රූප සඤ්ඤාව බව තේරුම් ගත්තොත්. ඒ කාරණය හොඳට පැහැදිලි වෙන ගාථාවක් අපි මුලින් අවසථාවක ප්‍රකාශ කළා එක්තරා දේශනයකදී. ඒක නැවතත් මතක්කරගැනීම හොඳයි. සංයුතත නිකායෙ ජටා සූත්‍රයෙ අඩංගු ගාථාවක්.

**යත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ඣති**

**පටිඝං රූපසඤ්ඤා ච - එත්ථ සා ඡිජ්ජතෙ ජටා**[14]

යම්තැනක නාමයත්, රූපයත්, පටිඝයත්, රූප සඤ්ඤාවත් සම්පූර්ණයෙන්ම උපරෝධනය වෙයිද. එතන මේ මුළුමහත් සංසාර ගැටලුව - අන්තො ජටා බහි ජටා - අවුල විසඳනුලැබේ. මුළුමහත් ධර්මයම එතන තියෙනව. යම්තැනක නාමයත්, රූපයත්, පටිඝයත්, රූප සඤ්ඤාවත් - 'පටිඝ' කිව්වෙ දෙව්ෂය නොවෙයි. මෙතෙන්දි පාවිච්චි කළේ 'ගැටීම' කියන අර්ථයෙන් - ඊළඟට රූප සඤ්ඤාව - පටිඝයත් රූපසඤ්ඤාවත් කියන මෙන්න මේව සම්පූර්ණයෙන්ම උපරෝධනය කරනු ලැබේද? ඒ කොතැනද කියන එකත්, අර අනිදස්සන විඤ්ඤාණය ගැන සඳහන් කළ දේශනාවලදී පැහැදිලි වෙන්න ඇති. ඒ අනිදසසන විඤ්ඤාණය එහෙම නැත්නම් නිර්වාණ තත්ත්වය - අන්න එතැන තමයි මුළුමහත් අන්තො ජටා බහිජටාව විසඳෙන්නෙ. අපි දිගටම පටිච්ච සමුප්පාදයට අදාළ කාරණා ප්‍රකාශ කරනකොට පැහැදිලි වෙන්න ඇති, එක පැත්තකින් බලනකොට නාමරූපයයි විඤ්ඤාණයයි අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව, අනිත් පැත්තෙන් බලනකොට නාමයයි රූපයයි අතර මහා පටලැවිල්ලක් අන්‍යෝන්‍යසම්බන්ධතාවක්. එතන තියෙන්නෙ 'අන්තො ජටා බහි ජටා' වක්.

එතකොට මුළුමහත් පටිච්චසමුප්පාදයේ - හරියට අර මහා ජලාසයක දියසුළියක කේන්ද්‍රසථානය වගේම - මෙන්න මෙතනයි, නාමයත් රූපයත් ඊළඟට නාමරූපයත්, විඤ්ඤාණයත් කියන මෙන්න මෙතනයි, මුළුමහත් පටිච්චසමුප්පාද ධර්මයේ ගැඹුරුම තැන. එතකොට මේ රූපසඤ්ඤාව ගැන අපි තව ටිකක් කල්පනාකරල බලනවනම් බුදුපියාණන්වහන්සේ දැක්වූ හැටියට රූපසඤ්ඤාවෙන් සිත මුදා ගැනීමයි කෙනෙකුගේ පරමාර්ථය විය යුත්තෙ. මේ රූපසඤ්ඤාව ඇතිවෙන්නෙ කොහොමද? අර ගැටීම නිසයි. හැපීම නිසයි රූප සඤ්ඤාවක් ඇතිවෙන්නෙ. දැන් අර මැසිමදුරු ආදීන් ඇවිල්ල පාත්උනාම තමයි අර රූපසඤ්ඤාව ඇතිවෙන්නෙ. වෙන එකක් තබා අපි කලින් සඳහන් කළා පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ධාතු පිළිබඳ තද බව, මොළොක් බව ආදිය තේරුම් ගන්නෙ අතින් අල්ලල. අපි

මේ මනුෂ්‍ය ශරීරය මිනුමක් හැටියට යොදාගෙන එක්තරා විදියක මිනුම් සමූහයක් කරගන්නව ඒ සතරමහා භූතයින් පිළිබඳව. මහාභූතයින්ගේ හොල්මන් අපට කවදාවත් සම්පූර්ණයෙන් අවබෝධ කරගන්න බැහැ. නමුත් අපේ ජීවිතේට ගැලපෙන ආකාරයට මනුෂ්‍ය ශරීරයෙන්, මහාභූත ධර්ම තේරුම් ගන්න උත්සාහ ගන්නව. ඒ ඒ සතුන් තමතමන්ගේ සපර්ශය ඒ ඒ මහාභූත ධර්ම ආශ්‍රයෙන් සකස්කර ගන්නව. එතකොට මෙතන එහෙම පිටින්ම තියෙන්නෙ රූප සඥ්ඥාවක්. මේ රූප සඥ්ඥාවෙන් හිත මුදාගැනීමයි එතකොට පරමාර්ථය. අර පටිසයත් රූපසඥ්ඥාවත් ඒ එක්කම නාමයත් රූපයත් - මේවායින් සිත මුදාගත්තොත් අන්න ඒ අවස්ථාවෙදි තමයි අනෙතාජටිත, බහිජටිත මේ සංසාර ගැටලුවෙන් මිදෙන්න පුළුවන් වන්නෙ. ඒ එක්කම අපි තව කාරණයක් කල්පනාකරල බැලුවොත්, ලෝකයේ භව විභව කියන දෘෂ්ටිදෙක - ඒ කියන්නෙ, ලෝකයේ ඒකාන්ත අස්තිත්වයත් හෝ ඒකාන්ත නාස්තිත්වයක් පිළිබඳ ඒ දර්ශන - බොහොම දර්ශනිකයින්ගේ හිත්වලට මහ ගැටළුවක් වෙච්ච දේවල්. අපි කලිනුත් සඳහන් කළා. 'සත්' 'අසත්' කියල. මේ මුළු මහත් ලෝකයම ඇතිවුනේ 'සත් කියන සදාකාලික පදාර්ථයකින්ද? එහෙම නැත්නම් 'අසත් කියල දෙයක් තිබිල ඊ ළඟට 'සත්' කියල දෙයක් ඇති උනාද? ඔය විදියෙ මහ ගැටළු රාශියක් ඇතිවුනා. මේ ඔක්කොම ඇතිවීමට හේතුවත් මෙන්න මේ රූපධර්මයන් පිළිබඳ එක්තරා වැරදි වැටහීමක්. ඒක අපට හැඟෙනව කලහ විවාද සූත්‍රයෙ එන එක්තරා ගාථා පාඨයකින්.

**'රූපෙසු දිස්වා විභවං භවඤ්ච - විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ'[15]**

රූපය පිළිබඳ ඇතිවීමත් නැතිවීමත් දැකල, මනුෂ්‍යයෙක් ලෝකයේ එක්තරා විනිශ්චයකට පැමිණෙනව. මොකක්ද මේ 'විනිශ්චය'?. ඒකාන්ත පැවැත්මක් සහ ඒකාන්ත විනාශයක් තියෙනව කියල, කෙනෙක් තීරණය කරන්නෙ අපට ඇසට පෙනෙන මේ රූප අනුවයි. මේ ඉදිරිපිට තිබෙන යන්ත්‍රය දැන් තියෙනව කියල අපි ඒකාන්ත වශයෙන් ගන්නව, මේකෙ හේතුප්‍රත්‍යයන් සළකන්නෙ නැතිව, ඊළඟට මේක විනාශ වුනු දවසට අන්න 'තිබුන' දැන් 'නෑ'. ඔන්න ඔය විදියට ඒකාන්ත දෘෂ්ටියක් ඇතිවෙන්නෙ මේ රූපය පිළිබඳ වැරදි අවබෝධයක් නිසා බව බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරල තියෙනව. එතකොට මෙතන ගැටලුව තිබෙන්නෙ රූප සඥ්ඥාව උඩ. ලෝකයා ගත්ත රූප සඥ්ඥාව පිළිබඳ එක්තරා මිථ්‍යාවක් නිසා ලෝකය අන්තගාමී දෘෂ්ටි දෙකකට නැඹුරු වෙලා තියෙනව. ඒකාන්ත අස්තිත්වයත්, ඒකාන්ත නාස්තිත්වයත්, භව විභව, කියල ඔය විදියට අන්ත දෙකකට පත්වෙලා තිබෙනව. අපි මෙතෙක් ප්‍රකාශ කළේ විශේෂයෙන්ම නාමරූප දෙකේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවත්, ඊට අනුව ඒක විඥ්ඥාණයෙ පිළිබිඹුවන ඡායාවක් සෙවනැල්ලක් පමණක් බවත්, වැටහීයන විදියෙ එක්තරා ධර්ම විවරණයක්.

## අධෝලිපි

1. බු.නි.I (ඉති.) 374 පිට (බු.ජ.24)
2. ඉති. දුක නිපාත, දුතිය වග්ග
3. ධ.ප. තණ්හා වග්ග
4. සං.නි III 180 පිට (බු.ජ. 15)
5. දී.නි II 90 පිට (බු.ජ. 8)
6. සං. නි. III 122 පිට (බු.ජ. 15)
7. සං. නි. II 114 පිට (බු.ජ. 14)
8. ම. නි. III 504 පිට (බු.ජ. 12)
9. සං. නි. IV 410 පිට (බු.ජ. 16)
10. සං. නි. III 148 පිට (බු.ජ. 15)
11. සු. නි. 314 පිට (බු. ජ. 25)
12. චු. නි. 402 පිට (බු. ජ. 34)
13. සු. නි. 98 පිට (බු. ජ. 25)
14. සං. නි. I.26 පිට (බු. ජ. 13)
15. සු. නි. 274 පිට (බු. ජ. 25)

# 11 වන

# ප්‍රශ්නය

# 11 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිම්පාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ එකොළොස් වන දේශනයයි මේ.**

නාමයත් රූපයත් ප්‍රත්‍යය කරගෙන, ඵස්සය හටගන්නේ නාමයෙන් කෙරෙන නම්කිරීමෙන්, රූපයට අධිවචන සම්ඵස්සයකුත්, රූපයෙන් ලැබෙන ගැටීමෙන්, නාමයට පටිඝසම්ඵස්සයකුත් සැලසෙන නිසා බව පසුගිය දේශනයේදී විස්තර කරන්නට යෙදුනා. ඵස්ස කියන වචනය ධර්මයේ යෙදිල තියෙන ආකාරයට ඒ ඵස්සය සම්පූර්ණ වන්නෙ මේ අධිවචනසම්ඵස්ස, පටිඝසම්ඵස්ස කියන අංග දෙක එකතු වෙලයි. ඒ වගේම රූප කියන වචනයට බුදුපියාණන් වහන්සේ දුන්න විශේෂ නිරුක්තියකුත්, අප පසුගිය දවසේ සඳහන් කළා - සංයුත්ත නිකායෙ ඛන්ධ සංයුත්තයේ ඛජ්ජනීය සූත්‍රයෙ සඳහන්වන නිරුක්තියක්. 'රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති' යනුවෙන් මේ රූපස්කන්ධය හඳුන්වල තියෙන්නෙ මෙය රුප්පනය වන නිසයි. මොනවයින්ද රුප්පනය වන්නෙ. සීතලෙන්, උෂ්ණයෙන්, කුසගින්නෙන්, පිපාසාවෙන්, මැසි මදුරු ආදීන්ගේ ස්පර්ශයෙන් ඒ විදියෙ දේවලින් රුප්පනය වන නිසා ඊට රූපය කියනව කියල බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනවා. මෙන්න මේ රුප්පන අර්ථය විග්‍රහ කිරීමේදී අපි මේ රූපස්කන්ධය තුවාලයකට සමාන කළ හැකි බවත් සඳහන් කළා.

අටුවා ආදියෙ තෝරල තිබෙන ආකාරයටත් මේ රුප්පන කියන වචනයට දෙන අර්ථ, කිපෙන, පෙළෙන, ලෙඩවෙන, දොම්නස් වෙන කියන ඒ අදහසුයි. ඒ අර්ථය දීල තියෙන්නෙ, මේ කිපෙන, පෙළෙන, ගැටෙන, දොම්නස්වන ගති සාමාන්‍යයෙන් පහසුවෙන් ඉද්දෙන තුවාලයක් ඇති කෙනෙකු තුළ පහළවන ප්‍රතික්‍රියා සිහිගන්වන දේවල්. මේ ඉද්දෙන ගතිය

නිසා පටිඝසම්ඵස්සයක් ඇතිවෙතැයි කීම ඒ නිසා ඉතාමත්ම අර්ථවත්. පටිඝ කියන වචනයේ මූලික අර්ථය නම් ගැටීමයි. රූප සඤ්ඤාවක් හටගන්නේ තුවාලය ඉද්දීමක් වැනි මේ ගැටීම, නාම ධර්මයන්ගේ පිහිටෙන් තේරුම් ගැනීමට උත්සාහ කිරීමෙනුයි. රූපයෙහි යමක් ගැටුනු විට, හටගන්නා දැනෙන - වේදනාව ඔස්සේ ඇති කරගන්නා රූපසඤ්ඤාව, එනම් රූපය හඳුනාගැනීම, අඳුරෙහි අන්ධයකුගේ අතපත ගෑමක් වගෙයි. අතට හසුවන රූපයේ නියම තත්ත්වය සැකහැර දැනගැනීමට සාමාන්‍යයෙන් ලෝකයා ඇස හැර බලනව. ඒ වගේම ඇසට පෙනෙන රූපයේ නියම තත්ත්වය දැන ගැනීමට අතගාල බලනව. මේ දෙකම අන්ධයෙකුගේ වැඩ වගෙයි. නමුත් මේ එක ක්‍රමයකින්වත් මුළාව සම්පූර්ණයෙන් ඉවත් කර ගැනීමට ලෝකයා අසමත් වෙනව. ඊට හේතුව ඝන සංඥාව අනුව නිගමනයකට බැසීමට පුරුදුවෙලා සිටින නිසයි. භව දිට්ඨියත් විභව දිට්ඨියත් යන අන්තදෙකට තුඩු දෙන්නේත් මේ රූපය පිළිබඳව ගත්තු ඝන සංඥාව බව අපට කලහවිවාද සූත්‍රයේ සඳහන් වන එක්තරා ගාථාධර්මයකින් පෙන්නුම් කරන්න පුළුවනි. අපි ගියවර ඒ ගාථාධර්මයත් උපුටා දැක්වුවා. 'රූපෙසු දිස්වා විභවං භවංච - විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ' රූපයන් පිළිබඳව විනාශයක් සහ පැවැත්මක් කියන මේ කාරණා දෙක දැකල ලෝකයේ මනුෂ්‍යයෙක් යම් කිසි නිගමනයකට එළඹෙනව. ඒකාන්ත වශයෙන් රූපධර්ම තියෙනව කියන හැඟීමක් ඇති කරගන්නව සාමාන්‍ය ලෝකයා. මේ ඇති කරගත්තු අදහස රූප සංඥාවක්, අර ගැටීම නිසා ඇතිකරගත්තු එක්තරා සංඥාවක්. මේ රූප සංඥාව කොයි මට්ටමකින් ගත්තත් මේක එක්තරා විදියක අන්ධයෙකුගේ නිගමනයක් වැනි දෙයක්. මෙන්න මේ අනුව තමයි ලෝකයේ භව විභව කියල අන්තගාමී දෘෂ්ටි දෙකක් තහවුරු වෙලා තියෙන්නෙ.

මේ රූප ධර්මයන් - ද්‍රව්‍යය - පිළිබඳව නොයෙකුත් විදියෙ මතිමතාන්තර එහෙමත් ලෝකයේ පවතින්නෙ ඒවා ඒකාන්ත වශයෙන් සත්‍ය දේවල් හැටියට ගැනීමෙන්. අතට අසුවන ඇසට පෙනෙන දේවල් ඒකාන්ත වශයෙන් පවතිනව කියන හැඟීමක් ලෝකයේ තියෙනව. එතකොට යම්කිසි දෙයක් යම්කිසි කාලසීමාවක් පවතිනව. ඊළඟට ඒක නැති වෙලා යනව. මේ අනුව ලෝකයේ හැම දෙයක්ම ඒකාන්ත වශයෙන් පවතිනවයි, ඒ වගේම එක්තරා අවස්ථාවකදී ඒව විනාශ වෙලා යනවයි කියල මේ විදියට භව විභව වශයෙන් අන්තගාමී දෘෂ්ටි දෙකක් ලෝකයේ පැනනැගිල තියෙනව. මේකත් රූපසංඥාවක්. මිරිඟුවක් පස්සෙ දිවීමක් වැනි දෙයක්. එක්තරා විදියක මුළාවක්. බුදුපියාණන් වහන්සේ ජටා සූත්‍රයේදි දක්වල තියෙන්නෙ නාමයත් රූපයත් පටිඝයත් රූපසඤ්ඤාවත් යම් තැනක නැති වෙනව නම් උපරෝධනය වෙනව නම්, සම්පූර්ණයෙන්ම නවත්වනු ලබනව නම්, අන්න එතන අන්තොජටා බහිජටා ඡරූපී මුළු

මහත් සංසාර ගැටලුවම විසඳෙන බවයි. කපාහරිනු ලබන බවයි. ඒක අපි කළ මේ විග්‍රහය අනුවත් තරමක් දුරට තේරුම් ගන්න පුළුවන්. මේ නාමයත් රූපයත්, ඒ වගේම පටිඝයත් රූප සඤ්ඤාවත්, මේ පදහතරම වැදගත් වෙනව. පටිඝ, රූපසඤ්ඤා, පටිඝසම්ඵස්ස අධිවචනසම්ඵස්ස කියන වචන දෙකට සමානයි.

එතකොට රූප සංඥාව ගැන විශේෂයෙන් යමක් කියනව නම්, මේ රූප සංඥාවට මූලික හේතුව වන්නේ ස්පර්ශයයි. ඒ නිසාම කලහවිවාද සූත්‍රයේ දක්වල තිබෙනව භව විභව දෘෂ්ටිදෙක පැන නැගීමට හේතු වන්නෙත් ස්පර්ශයයි කියල. ස්පර්ශය නිසා භව විභව දෘෂ්ටි ඇති වෙනව කියල. ස්පර්ශය පිළිබඳ විග්‍රහය ක්‍රමක්‍රමයෙන් ගැඹුරට ගෙන යන විදියෙ ප්‍රශ්නෝත්තර මාලාවක් සුත්ත නිපාතයෙ ඒ කලහවිවාද සූත්‍රයෙම දකින්නට ලැබෙනව.

'ඵස්සොනු ලොකස්මිං කුතො නිදානො' - ප්‍රශ්නය අහනව ලෝකයේ ස්පර්ශය කුමක් නිදානකොටද පවතින්නෙ, කුමක් හේතු කොට ගෙනද පවතින්නෙ, කියල. ඒකට දෙන පිළිතුර 'නාමංච රූපංච පටිච්ච ඵස්සො' නාමයත් රූපයත් නිසා ස්පර්ශය ඇතිවෙනව කියල. ඊළඟට අසන ප්‍රශ්නය, කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා - කුමක් නැතිවූ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකෙරෙත්ද? ඊට දෙන පිළිතුර - 'රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා' රූපය නැතිවූ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකෙරෙත්. ඊළඟට අසන ප්‍රශ්නයත් පිළිතුරත් ඉතාමත්ම වැදගත්, ඒ වගේම ගැඹුරු විදියෙ ධර්ම විග්‍රහයක්. ඒනිසා අපි ඒ ගාථා දෙකම සම්පූර්ණයෙන් ම උපුටා දක්වන්න උත්සාහ කරනව. ප්‍රශ්නය මේකයි.

**කථං සමෙතස්ස විභොති රූපං - සුඛං දුඛං වාපි කථං විභොති**
**එතං මෙ පබ්‍රෑහි යථා විභොති - තං ජානියාම ඉති මෙ මනො අහු**

'කථං සමෙතස්ස විභොති රූපං' - කෙසේ සමන්විත වූවහුට රූපය නැති වෙයිද? 'සුඛං දුඛංවාපි කථං විභොති - සැපදුක් දෙකද කෙසේ නම් කොයි ආකාරයකින් නැතිවෙයිද? 'එතං මෙ පබ්‍රෑහි යථා විභොති - මේව නැතිවෙන ආකාරය මට කියනු මැනව. 'තං ජානියාම ඉති මෙ මනො අහු' මේ කාරණාව දැනගනිමු යන අදහස මට ඇතිවිය. ඊළඟට ඒකට දෙන පිළිතුර මේකයි. මහා ආශ්චර්යවත් පිළිතුරක්.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී - නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී**
**එවං සමෙතස්ස විභොති රූපං - සඤ්ඤානිදානා හි පපඤ්චසංඛා**

ඒ කියන්නෙ, අර රූපය විභූත වූ, එහෙම නැත්නම් රූපය නැතවූ තත්ත්වයක් ලැබූ, ඒ වගේම සැපදුක් දෙක නැතිකර ගත් තත්ත්වයක් ලැබූ,

පුද්ගලයකු පිළිබඳවයි මේ විස්තරය කෙරෙන්නෙ. 'න සඤ්ඤසඤ්ඤී' ඒ තැනැත්තා සාමාන්‍ය ප්‍රකෘති සංඥාවෙන් සංඥී වූයේ නොවෙයි. ප්‍රකෘති සංඥාවෙන් සංඥී වූයේ නොවෙයි. ප්‍රකෘති සංඥාවෙන් යුක්ත තැනැත්තෙක් නොවෙයි. ඒ වගේම 'න විසඤ්ඤ සඤ්ඤී' - විකෘති සංඥාවෙන් යුතු, විසංඥ වූ පුද්ගලයෙකුත් නොවෙයි. සිහි නැති වුන පුද්ගලයෙකුත් නොවෙයි. නොපි අසඤ්ඤී - එ වගේම සංඥාවෙන් තොර තත්ත්වයකුත් නොවෙයි. නිරෝධ සමාපත්තියෙ, නැත්නම් අසඤ්ඤසත්ත ආදී ස්ථානවල සිටිනව වගේ, සංඥාව කොහෙත්ම නැති තත්ත්වයකුත් නොවෙයි. 'න විභූත සඤ්ඤී' - සංඥාව ඉක්මවූ තත්ත්වයකුත් නොවෙයි. 'එවං සමෙතස්ස විභොති රූපං' - මේ ඔක්කොම නොවේ නොවේ කියන ඒවයි. මුල්පද දෙකේම තියෙන්නෙ. තුන්වෙනි පදේ තියෙනව 'මෙන්න මෙසේ සමන්විත වූවහුව, රූපය නැතිවෙයි. සඤ්ඤානිදානා හි පපඤ්චසංඛා' - මක්නිසාද යත් - 'හි' කියල යොදල තියෙන්නෙ හේතුව දැක්වීමටයි, පපඤ්චසංඛාවෝ සංඥාව නිදාන කොට ඇති හෙයිනි.

එතකොට මෙන්න මේ ගාථාවෙ අර්ථවිග්‍රහය පිළිබඳ විශේෂයෙන් යමක් කියන්නට සිද්ධවෙනව. මක්නිසාද මහානිද්දේසයේ[1] මේක තෝරල තියෙන්නෙ - මේ ගාථාව තෝරල තියෙන්නෙ - චතුර්ථධ්‍යානය ලබාගත් කෙනෙක් ප්‍රථම අරූපධ්‍යානය වන ආකාසානඤ්චායතනය දෙසට සිත යොමු කරන අතුරු අවස්ථාව හැටියටයි. එහෙම තෝරන්න හේතුව මොකද අර 'න විභූතසඤ්ඤී' කියන එක එතන අරගෙන තිබෙන්නෙ අරූප සමාපත්තියත් නොවෙයි කියන අදහසින්. එතකොට, සාමාන්‍ය චිත්ත තත්ත්වයක් නොවෙයි. විසංඥ වූ තත්ත්වයකුත් නොවෙයි. අසඤ්ඤසත්ත නිරොධ ආදී තත්ත්වයකුත් නොවෙයි. අරූපසමාපත්තියකුත් නොවෙයි. එතකොට ඉතින් ඉතුරු වෙන්නෙ මෙන්න මේ විදියේ අතුරු අවස්ථාවක් පමණයි. ඒක නිසා වෙන්න ඇති මහානිද්දේසයෙ මේක තෝරන්නෙ 'ආරුප්පමග්ගසමඞ්ගී' කියල. අරූපධ්‍යාන වලට යන මාර්ගයේ සිටිය තැනැත්තෙකුගේ චිත්තතත්ත්වය හැටියටයි ඒක තෝරන්නෙ. ඒ වගේම අනෙකුත් අටුවාවලත් ඒ විදියට තෝරනව. නමුත් මෙතන කල්පනා කරල බලන කොට මේ සූත්‍රයේ සැකැස්ම අනුවත්, ධර්මවිග්‍රහය ඉදිරිපත් කරල තිබෙන ආකාරය අනුවත් කල්පනා කරල බලනකොට මෙතන තියෙන්නෙ ඊට වඩා ගැඹුරු තත්ත්වයක්. ලෝකෝත්තර තත්ත්වයක් මෙතන තිබෙන්නෙ. රූපය සමතික්‍රමණය වශයෙන් ඔය අරූපධ්‍යාන ආදියෙදී කෙරෙන විදියෙ එහෙම නැතිකිරීමක් නොවෙයි මෙතන. ලෝකෝත්තර වශයෙන්, ප්‍රහාණ වශයෙන්ම, ඉක්මවීමක් මෙතනින් හැඟෙන්නෙ. විශේෂයෙන්ම මේ අවසාන පදයෙන් කියැවෙනව සඤ්ඤානිදානා හි පපඤ්ච සංඛා'. මේ පපඤ්චසංඛා කියන එක විදර්ශනාවට අයිති පදයක්. ඒ වගේම අර ඒ සූත්‍රයේ මුල ඉඳලම එන්නෙ විදර්ශනාවට හුරු ගැඹුරු අන්දමේ ප්‍රශ්නමාලාවක්. ඒක

අපට දක්වන්න පුළුවන්. කලහවිවාද සූත්‍රය ගාථා 16 කින් සමන්විත සූත්‍රයක්. ඒකෙ පළමුවෙනිම ගාථාව - ගාථාවෙන් නගන ප්‍රශ්නය:

**කුතො පහූතා කලහාවිවාදා - පරිදෙවසොකා සහ මච්ඡරාච**
**මානාතිමානා සහ පෙසුනාච - කුතො පහූතා තදිඞ්ඝ බ්‍රෑහි**

කුතො පහූතා කලහාවිවාදා - කලහ විවාදයෝ කොතනින් හටගත්තාහුද? ඒ වගේම පරිදෙවසොකා සහ මච්ඡරාච - සෝක පරිදේව හැඬීම් වැළපීම් මච්ඡරිය ඒ වගේම මාන අතිමාන කියන ක්ලේශධර්ම, කේලාම් කීම ආදිය මේ හැම කෙලෙස් ධර්මයන්ම ඇතිවෙන්නෙ කොතනින්ද කියන එකයි මූලික ප්‍රශ්නය. ඒ ප්‍රශ්නයට පිළිතුරුදීම් වශයෙන් තමයි, මේ සූත්‍රය, ගාථා 16 කින් සමන්විත මේ සූත්‍රය, ක්‍රමක්‍රමයෙන් විකාශනය වන්නෙ. ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යායයට අනුව කලහවිවාදවලට හේතුව හැටියට දක්වනව - 'පියා පහූතා කලහා විවාදා' යම් යම් දෙවල් ප්‍රිය වශයෙන් සැළකීම නිසා කලහ විවාද ආදිය ඇතිවෙන බව දක්වනව. හරියට දම්වැලක පුරුක් වගේ විකාශනය වන්නේ. මේ සූත්‍රය. ඊළඟට ප්‍රශ්නකරු අහන ප්‍රශ්නය ඒ 'පිය' කියන අදහස ඇතිවන්නෙ කොහොමද? ඒකට හේතුව හැටියට දක්වන්නෙ ඡන්දය - 'ඡන්ද නිදානානි පියානි ලොකෙ'. ලෝකයේ ප්‍රිය හැටියට සළකන දේවල් ඡන්දය, කැමැත්ත, ඕනෑකම, ආසාව ආදිය මුල්කරගෙනයි. ඒ ඡන්දය මුල්කරගෙනයි ප්‍රිය කියන අදහස ඇති වන්නෙ. ඊළඟට ඡන්දය ඇතිවන්නෙ මොකක් නිසාද? කියන ප්‍රශ්නය අහනව. ඒකට හේතු වශයෙන් දක්වන්නෙ 'සාතං අසාතං' සාත අසාත කියල කියන්නෙ, සාමාන්‍ය වශයෙන් දක්වන්න පුළුවන්, සැප දුක් වේදනා කියල. මනාප අමනාප වේදනා කියලත් ගන්න පුළුවන්. සැපදුක් වේදනා තමයි අර ඡන්දයට හේතුව හැටියට දක්වන්නෙ. ඊළඟට මේ 'සාතං අසාතං' කියන භේදයට හේතුව අහනව. ඒකට තමයි ප්‍රකාශ කරන්නෙ 'ඵස්ස' හේතුවයි කියල. ඵස්සය නිසයි අර සැපදුක් වේදනා ඇතිවෙන්නෙ. ඊළඟට අහනව ස්පර්ශයට හේතුව කුමක්ද කියල. ඒක අපි දැනටමත් සඳහන් කරලයි තියෙන්නෙ. 'ඵස්සො නු ලොකස්මිං කුතො නිදානො' කියල අහපු ප්‍රශ්නය. අපි මේ විවරණය ආරම්භ කළෙත් එතැනින්, ඒකට දුන්න පිළිතුර 'නාමංච රූපංච'. එතකොට ඵස්ස කියන දම්වැලේ මෙහායින් තියෙන්නෙ නාමරූපය. ඔන්න ඊළඟට නාමරූපයටත් මෙහායින්, ඊටත් වඩා ගැඹුරට යන තැන තමයි මෙතන දැන් අපි ඇවිල්ල තියන තැන, 'න සඤ්ඤසඤ්ඤී' ආදී ගාථාව. මක් නිසාද - 'රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා, මෙතන අහන ප්‍රශ්නයත් හරි අමුතු විදියයි. ස්පර්ශය නිකම්ම නිරුද්ධවීමක් නොවෙයි මෙතන කියන්නෙ. ස්පර්ශයෝ ස්පර්ශ නොකරන්නේ කෙසේද? කියන එක. කවර අවස්ථාවකද කියන එක. එතකොට 'රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා' රූපය නැති වූ කල්හි ස්පර්ශයෝ

ඝපශී නොකෙරෙත්. ඊට පිළිතුරු වශයෙන් තමයි 'න සඤ්ඤ සඤ්ඤී' ආදී ගාථාව දේශනා කරල තියෙන්නෙ. ඊට වඩා ගැඹුරු ලෝකොත්තර වශයෙන් විමුක්ත තත්ත්වයක්. සුඛදුක්ඛ ඒ වගේම රූප-රූප සංඥාවයි මෙතන කියවෙන්නෙ. මෙතන සංඥාව පිළිබඳ ප්‍රශ්නයක්. මේ මුළු මහත් විග්‍රහයම කුළුගැන්වෙන අවස්ථාව තමයි මේ කියන 'න සඤ්ඤසඤ්ඤී ආදී ගාථාව ඒක 13 වෙනි ගාථාව හැටියටයි තියෙන්නෙ. සාමාන්‍යයෙන් එබඳු ධර්ම විග්‍රහයක් කෙළවර වන්නෙ නිර්වාණයෙන්. නිවනින් කූළු ගන්වන්නෙ. ඒක නිසා නිවන් සිතක් පිළිබඳ තත්ත්වයයි මෙතනින් කියැවෙන්නෙ. ප්‍රතිෂේධ හතරක් මෙතන තියෙනව. නෑ නෑ නෑ නෑ කියල හතරක් මෙතන තිබෙනව.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී -නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී**

මේ 'නෑනෑ' හතරම. අර ලෝකෝත්තර විදියේ එක්තරා 'සඤ්ඤා' මට්ටමක්. පුදුම විදියේ සඤ්ඤා මට්ටමක් මේක. එතකොට මේ සඤ්ඤා ශීර්ෂයෙන් මේ ධර්මයෙ ගැඹුරුම අංශයක් පිළිබඳ විග්‍රහයක් මෙතන කියන්නෙ.

මක්නිසාද, බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කළා මෙතන 'රූපයෙන් ගැලවීමට නම් රූප සංඥාවෙන් ගැලවෙන්න ඕන. ඒක ඉතාමත්ම ගැඹුරු දෙයක්. අර අන්තො ජටා බහි ජටා සූත්‍රයේ සඳහන් කළ 'නාමං ච රූපං ච,' පටිඝං රූපසඤ්ඤා ච - එතන රූපසඤ්ඤා කියල කීම විශේෂයි. සාමාන්‍ය ලෝකයා එතෙක් හිතුවෙ - බුදුපියාණන්වහන්සේ පහළවන තාක් - වෙන එකක් තබා තාපසවරු පවා හිතුවෙ, රූපයෙන් මිදීමට නම් අරූපය අල්ලගන්න ඕන කියල. අපි කලින් දේශනාවක සඳහන් කළා අරූපය බදාගැනීම හරියට අර රාත්‍රියේ හොල්මනක් දැකල බය වෙලා යකෙක්ය කියල හිතාගෙන යකාගෙන් බේරීමට දිවීම වගේ. යකත් අරගෙනයි දුවන්නෙ. අන්න ඒ වගේ අර අරූපයෙත් තියෙනව රූප සඤ්ඤාවක්, රූපසඤ්ඤාව සංස්කාර මගින් ඇත්කරනව. ධ්‍යාන බලයෙන් රූපය කියන අදහස යටපත් කරනව. නමුත් රූප සඤ්ඤාව නැතිවුනේ නැහැ.

එතකොට බුදුපියාණන් වහන්සේ මේ සමුච්ඡේද ප්‍රහානය පිළිබඳව ලෝකයට දුන්න පණිවිඩය මොකක්ද? සඤ්ඤාව පිළිබඳ එක්තරා ගැඹුරු ධර්මතාවක් අවබෝධකර ගැනීමෙන් තමයි රූපයෙන් මිදෙන්න පිළිවන්වන්නෙ. එතෙක් සංසාරයෙම කරකැවෙනව. එතෙක් අරූපලෝකවල කොයිතරම් කල්පගණනක් ඇත් වෙලා හිටියත් ආපසු රූපයට කැරකිලා එනව. මක්නිසාද? අර රූපයෙ හොල්මන තියෙනව අරූපය තුළ. අන්න ඒක නිසා තමයි බුදුපියාණන්වහන්සේට කලින් සිටි තාපසවරුන්ට බැරිවුනේ මේ සංසාරෙන්, භවයෙන් මිදෙන්න. මේ භව විභව දෘෂ්ටි පිළිබඳ

මහා ගැඹුරු විග්‍රහයක් මේ කලහවිවාද සූත්‍රයෙ සම්පූර්ණයෙන්ම තියෙන්නෙ. මෙතන මහා නිද්දෙසයට වඩා වෙනස් විවරණයක් දීම, සමහර විට කෙනෙක් හිතන්න පුළුවන්, ධර්මයට ගහන පහරක් කියල. නුවණැති කෙනෙකුට විමසා බැලීමටයි මේ කාරණා ප්‍රකාශ කරන්නේ. මේ 13 වැනි ගාථාවෙන් කියැවෙන්නෙ එතකොට නිවනින් කුළුගැන්වුණු අවස්ථාවයි. ඒක වඩාත් පැහැදිලි වෙනව 14 වෙනි ගාථාවෙන්. ඒ ප්‍රශ්නකරු ප්‍රකාශකරනව - යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො - අඤ්ඤං තං පුච්ඡාම් තදිඞ්ඝ බ්‍රෑහි

අපි යමක් ඇසුව නම් ඒක ප්‍රකාශකළා. ඒ කියන්නේ මුලදි අහපු ප්‍රශ්නය දැන් විසඳිල ඉවරයි කියන එක. 13 වෙනි ගාථාව වෙනකොට අපි යමක් ඇසුවමෝද එය අපට ප්‍රකාශ කර තිබේ. 'අඤ්ඤං තං පුච්ඡාම' 'අපි වෙන දෙයක් දැන් අසමු' කියල වෙන දෙයකුයි ඊළඟට අසන්නෙ. මොකක්ද ඒ අසන්නෙ

**එත්තාවතග්ගංනු වදන්ති හෙකෙ**
**යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතාසෙ**
**උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො**

ඒ කියන්නෙ අර ප්‍රශ්නකරු ඊළඟට මේ තත්ත්වය තේරුම් ගන්න බලනව, භව විභව දෘෂ්ටි ආශ්‍රයෙන්, 'යක්ඛ කියන වචනය යොදන්නෙ ආත්ම' කියන අදහසින්. ආත්ම, සත්ත්ව, කියන අදහසින්. එතන තියෙනව එක්තරා විදියක මිථ්‍යාදෘෂ්ටියක්, 'යක්ඛස්ස සුද්ධිං' කියන්නෙ මේ ආත්මයේ සුද්ධිඅවස්ථාව හැටියට සළකලයි, මේ ප්‍රශ්නය අහන්නෙ. ඒ කියන්නෙ මෙය ආත්මයේ ඉහලම ශුද්ධ අවස්ථාව හැටියට ලෝකයේ සිටින පණ්ඩිතයින් ප්‍රකාශකරනවද? කියල ඒ ප්‍රශ්නකරු අහනව. ප්‍රශ්නයට උත්තර දුන්නටත් පස්සේ ඒක තේරුම්ගන්න කරන උත්සාහයක් මේ. එතකොට ඒකට දෙන පිළිතුර කුමක්ද?

**එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ - යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතාසෙ**
**තෙසං පනෙකෙ සමයං වදන්ති - අනුපාදිසෙසෙ කුසලා වදානා**

'ඇතැම් පණ්ඩිත කෙනෙක්, මෙයත් මේ ආත්මයක ශුද්ධ අවස්ථාව හැටියට දක්වනව. ඒ පණ්ඩිතයින්ගෙන්ම තවත් කොටසක් මේක උච්ඡේදය හැටියටත් තේරුම්කරනව' කියල ඔන්න අවසාන ගාථාවෙන් භව විභව දෘෂ්ටි පිළිබඳ මේ විපරීත අදහස එහෙම පිටින්ම ප්‍රතික්ෂේප කරනව.

**එතෙ ච ඤත්වා උපනිස්සිතාති - ඤත්වා මුනි නිස්සයෙ සො විමංසී**
**ඤත්වා විමුත්තො න විවාදමෙති - භවාභවාය න සමෙති ධීරො**

'එතෙ ච ඤත්වා උපනිස්සිතාති මේ කියාපු පණ්ඩිත මත දෙකම 'උපනිස්සිත' යයි දැනගෙන - 'උපනිස්සිත' කියන්නෙ දෘෂ්ටි උපනිශ්‍රිත

දෘෂ්ටිවලට හේත්තුවෙලා ඇතිකරගත්තු අන්ත දෙකක් බව තේරුම් අරගෙන, 'ඤත්වා' කියන වචනය තුන් තැනකම සඳහන් වෙනව 'ඤත්වා මුනි' මේ මුනිවරයා, මේ රහතන්වහන්සේ 'නිස්සයෙ සො විමංසී' ලෝකයේ තිබෙන නිශ්‍රයයන් - නිස්සය කියන වචනය ගැන අපි බොහොම දේ ප්‍රකාශ කළා පසුගිය දේශනාවල. ලෝකයා හේත්තු වී සිටින යම් යම් දෘෂ්ටි ආදී දේවල් - ඒ නිශ්‍රය පිළිබඳ වීමංසන බුද්ධියක් ඇති ඒ මුනිවරයා 'ඤත්වා විමුත්තො' ඒ අවබෝධය නිසාම විමුක්තව - 'න විවාදං එති' ලෝකයා සමඟ විවාදයට එන්නෙ නැහැ. මක්නිසාද? භවාභවාය න සමෙති ධීරො' භව විභව දෙපැත්තටම වැටෙන්නෙ නැහැ. ඒ කියන්නෙ, මේ නිවන - භව විභව දෙපැත්තටම - ශාසවත උච්ඡේද දෙපැත්තටම වැටෙන්නෙ නැහැ කියලයි ඒ සූත්‍රය කෙළවර වන්නෙ.

අප කළ මේ විග්‍රහයේ යුක්ති අයුක්ති භාවය තවදුරටත් කෙනෙකුට විමසා බලන්න පුළුවනි. සුත්තනිපාතයෙම පාරායණ වග්ගයේ එනව උපසීව සූත්‍රය කියල සූත්‍රයක්, [2]අපි කලිනුත් සමහර අවස්ථාවල ඒකෙන් උඩෘත කරල දැක්වුවා. එතන නිවන සඳහන් වෙනව එක්තරා උපමාවකින්. ඒ කියන්නෙ රහතන් වහන්සේගේ විඤ්ඤාණ නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂ අවස්ථාව සඳහන් කළාට පස්සෙ-ඒක සඳහන් කරන්නෙ එක්තරා උපමාවකිනුයි, අච්චි යථා වාතවෙගෙන ඛිත්තො-අත්ථං පලෙති න උපෙති සංඛං. හරියට, ගිනිසිල වාතයෙන්, සුළඟින්, විසිකරනු ලැබ, අත්ථං පලෙති අසතයට ගියා, නැති වුනා කියන එකයි. ගිනිසිල නිවිලගියා. න උපෙති සංඛං-නිවිල ගියාට පස්සෙ ඒකට කියන්න වචනයක් නැහැ. නිවිල කොහේද ගියේ? උතුරටද? නැගෙනහිරටද? ආදී වශයෙන් ඒ විදියට දිශා වශයෙන්වත් ප්‍රකාශ කරන්න බැහැ. නිවිල ගියා කියනව මිසක්, ඊට වැඩි දෙයක් කියන්න බැහැ. එහෙම ප්‍රකාශ කළාට පස්සෙ එතෙන්දි උපසීව මාණවකයා - ඒ අර බ්‍රාහ්මණමාණවකයෙක්-ශාසවත දෘෂ්ටියෙහි පිහිටාගෙන සිටින නිසා අසනව මේ සූත්‍රයේ ඇසුවා වගේම ප්‍රශ්නයක්. පිළිතුරු දුන්නටත් පස්සේ, අරක තෝරගන්න බලනව භවවිභව දෘෂ්ටි වශයෙන්. මෙන්න මේ විදියයි උපසීව සූත්‍රයෙ අසන ප්‍රශ්නය-

**අත්ථංගතො සො උදවා සො නත්ථි - උදාහු වෙ සස්සතියා අරොගො**
**තං මෙ මුනි සාධු වියාකරොහි - තථා හි තෙ විදිතො එස ධම්මො**

'අත්ථංගතො සො උදවා සො නත්ථි' ඒ මුනිවරයා අස්තයට ගියාද එහෙම නැත්නම් උච්ඡේද වශයෙන් නැති වුනාද? එහෙමත් නැතිනම් 'උදාහු වෙ සස්සතියා අරොගො' නිරෝගීව යම්කිසි ශාස්වත තත්ත්වයක් ලැබුවාද? ඔන්න ඔය විදියට බොහෝ තැන්වල අපට පේනව සූත්‍රවල, බුදුපියාණන්වහන්සේ නිවනින් කුළුගන්වල යම්කිසි දේශනාවක් දේශනා කළාම, අසාගෙන සිටින සාමාන්‍යජනයා, අර දෘෂ්ටියෙන් මිදුන නැති පුද්ගලයින්, ඒක තේරුම් ගන්න උත්සාහ කරනව භව විභව දෙක ඔස්සෙ. අන්න ඒ විදියේ අවස්ථාවක් උපසීව සූත්‍රයෙ තියෙන්නෙ. කෙනෙකුට තවත්

නිදර්ශනයක් අවශ්‍ය නම් සොයාගන්න පුළුවනි පොට්ඨපාද සූත්‍රයෙන්, දීඝ නිකායෙ පොට්ඨපාද සූත්‍රයෙන්. [3]එතනදි බුදුපියාණන් වහන්සේ මේ මුළුමහත් නිර්වාණ ප්‍රතිපදාවම දක්වන්නෙ සංඥා ශීර්ෂයෙන්. ඒකත් මේ සඤ්ඤා කියන වචනයෙ වැදගත්කම පෙන්නුම් කරන සූත්‍රයක්.

'අනුපුබ්බාභිසඤ්ඤා නිරොධ සම්පජානසමාපත්ති' කියන මහ දිග වචනයකින් එතන දක්වනව ඒ නිර්වාණගාමී ප්‍රතිපදාව. විශේෂයෙන්ම එතන අන්‍ය තීර්ථකයින්ම බුදුපියාණන්වහන්සේගෙන් ඉල්ලා සිටිනව අපට මේ අභිසඤ්ඤා නිරෝධය පිළිබඳව කියා දෙන්න කියල. ඒ විදියට බුදුපියාණන් වහන්සේ අභිසඤ්ඤා නිරෝධය පිළිබඳව මහා දීර්ඝ විස්තරයක්, ගැඹුරු විස්තරයක්, ඉදිරිපත් කළාට පස්සෙ පොට්ඨපාද පරිබ්‍රාජකය අසනව මෙන්න මෙහෙම ප්‍රශ්නයක්.

'සඤ්ඤා නු බො පුරිසස්ස අත්තා උදාහු අඤ්ඤාසඤ්ඤා අඤ්ඤා අත්තා' ඔක්කොමත් කිව්වට පස්සෙ අසනව සංඥාව කියන එක පුරුෂයෙකුගේ ආත්මයද? එහෙම නැතිනම් සංඥාව එකක්ය ආත්මය වෙන එකක්ය, කියන එකද තත්ත්වය කියල. අන්න ඒ විදියට ආත්ම අදහසින් තොරව ආත්ම දෘෂ්ටියෙන් තොරව මේ ධර්මය තේරුම් ගැනීමට හැකියාවක් ඒ බ්‍රාහ්මණයින් තුළ තිබුණෙ නැහැ. ඒකයි මේ විදියේ ප්‍රශ්න අසන්නෙ. එතකොට මෙච්චර දුර අපි ගියේ මේක විශේෂ කාරණයක් නිසා. මහානිද්දෙසයෙ පවා මේක තෝරල තිබුනත් අඩාල නිගමනයක් දීල තියෙන්නෙ මේ න සඤ්ඤසඤ්ඤී ආදි ගාථාවට. කිසිම විදියකින් අන්‍යතීර්ථකයින්වත් ඒ චතුර්ථධ්‍යානයෙ ඉඳල අරූපධ්‍යානයට යොමුවන විදියෙ අතුරු අවස්ථාවකට ආත්මයේ ශුද්ධ අවස්ථාවය කියල ප්‍රකාශ කරල නැහැ. ප්‍රකාශ කරන්නෙ නැහැ. එහෙම එකක්. ඒ අතුරු අවස්ථාව කියන එක විශේෂයෙන් සැළකිය යුතු දෙයක් නොවෙයි.

එතකොට මේ ප්‍රකාශ කළ අදහස් කීපයම තව දුරටත් සනාථවන නිබ්බාන පටිසංයුත්ත සූත්‍රගණනාවක්ම සමහර විට අපේ මේ දේශනා මාලාවේ ඉදිරියට හමුවෙන්න පුළුවනි. 'න සඤ්ඤසඤ්ඤී' ආදී ගාථාව සාමාන්‍යයෙන් කෙනෙකුට අමතක කරන්න අපහසුයි ඒකෙ අමුතු සවභාවය නිසාම. අන්න ඒ ගාථාව අපට නිතර සඳහන් කරන්න සිද්ධ වෙනව. ඒකට සමාන නිබ්බානපටිසංයුත්ත සූත්‍ර රාශියක් අපට ඉදිරියට හමුවන්න පුළුවනි. එතෙක්, එක්තරා සුළු ඉඟියක් දීමක් වශයෙන් අපි කලිනුත් සඳහන් කළ උපමා දෙකක් නැවතත් මතක් කරන්න කැමතියි. එකක් තමයි බුදුපියාණන්වහන්සේගෙම උපමාවක් ඵෙණපිණ්ඩූපම සූත්‍රයෙන්[4] අප දැක්වූ 'මායූපමඤ්ච විඤ්ඤාණං' විඤ්ඤාණය මායාවක් හැටියට. මේ කාලයේ වචනයක් යොදනව නම් විජ්ජාවක්. විජ්ජා දැක්මක්. බුදුපියාණන්වහන්සේ

ඒක හොඳ උපමාවකින් දක්වල තියෙනව. අර සකන්ධ පහම ගැන සඳහන් කරන අවස්ථාවෙ විඤ්ඤාණය පිළිබඳව හරියට මායාකාරයෙක් හරි මායාකාරයෙකුගේ අතවැසියෙක් හරි මහාමාගීයේ යම්කිසි මායාවක් විජ්ජාවක් දක්වනව. යම් කිසි නුවණැති පුද්ගලයෙක් යෝනිසෝ මනසිකාරයෙන් යුක්තව මේක නරඹන අතර තේරුම් ගන්නව මේක හිස් දෙයක් 'රිත්තකං තුච්ඡකං අසාරකං' එහෙම තේරුම් ගන්නව කියල ප්‍රකාශ කරනව, එතකොට විඤ්ඤාණයේ ඒ හිස් සවභාවය තේරුම් ගත්ත නම් යම් කෙනෙක්, ඒක හරියට අර විජ්ජාදැක්මක තිබෙන සියලුම සූත්තර, කපටිසූත්තර, තේරුම් ගත්ත වගේ තත්ත්වයක්. දැන් අපි ටිකක් හිත යොමු කරල බලමු මේ විජ්ජා දැක්මක් නරඹන අය දිහා, විජ්ජාදැක්මක් නරඹන කොට සමහරුන්ගෙ කටවල් ඇරිල. පුදුමය නිසා ත්‍රාසය නිසා නොයෙකුත් වචනත් කියවෙනව. නමුත් යෝනිසෝමනසිකාරයෙන් යුත් යම්කිසි පුද්ගලයෙක්, විනිවිද දකින ප්‍රඥාවෙන් යුක්ත පුද්ගලයෙක්, මේ විජ්ජාදැක්ම දිහා බලාගෙන ඉන්න අතරෙ මේකෙ ඇති රහස සම්පූර්ණයෙන්ම වටහාගත්ත නම්, ඒ පුද්ගලයා කොහොමද මේ විජ්ජාව දිහා බලාගෙන ඉන්නෙ. අපි ටිකක් කල්පනා කරල බලමු.

බලං ඉන්නෙ හිස් බැල්මකින්. හිස් බැල්මකින් බලාගෙන ඉන්නෙ. ඒකටම තමයි - මතක් කරගන්න පුළුවනි 'විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතොපහං', 'අනන්ත' - ඒ විජ්ජාවෙ ඇලිල නැහැ. ඒ විජ්ජාව අන්තකරගෙන නැහැ, අරමුණු කරගෙන නැහැ. ඒ බැල්ම. ඒ වගේම 'අනිදස්සනං' - විජ්ජාව පෙනෙන්නෙ නැහැ ඒ බැල්මට, විජ්ජාවෙන් මිදිල තියෙන්නෙ ප්‍රඥාවෙන්. 'සබ්බතොපහං' - ආලෝකයක් තියෙනව. ප්‍රඥා ආලෝකය නිසා විජ්ජාවෙ තියෙන කළුපාට රහස් ඔක්කොම ප්‍රඥා ආලෝකයට යටයි. එතකොට මේ පුද්ගලයා බලාගෙන ඉන්නෙ හිස් බැල්මකින්. මේ පුද්ගලයා දිහා යම්කිසි කෙනෙක් - අර විදියට මෝහයෙන් කටත් ඇරගෙන බලාගෙන ඉන්න කෙනෙක් - බැලුවොත් මේ පුද්ගලය ගැන හිතන්නෙ කොහොමද? මේ පුද්ගලයගෙ තත්ත්වය කොහොමද? අර අයත් එක්ක සංසන්දනය කරහම, සමහරවිට හිතන්න පුළුවන් මේ පුද්ගලයා විජ්ජාව දකින්නෙ නැහැ කියල. බලන්නෙ නැහැ කියල. එහෙම නැතිනම් සිහිසන් නැතිව ඉන්නව කියල. එහෙම නැත්නම් සංඥාවෙන් එහෙම පිටින්ම මිදිල කියල. අන්න ඒ විදියේ මේ හිස්බැල්ම පිළිබඳ අදහසක් තමයි ඔය 'න සඤ්ඤසඤ්ඤී ආදියෙන් ප්‍රකාශ වෙන්නෙ. ඒ කියන්නෙ සාමාන්‍ය ලෝකයාගේ ඒ මෝහයෙන් යුක්ත සංඥා වලට රැවටෙන විදියෙ සංඥාව තමාගේ සංඥාව කරගත්තු කෙනෙකුත් නොවෙයි. 'න විසඤ්ඤ සඤ්ඤී' කියන්නෙ ලෝකයා ඒ සංඥාව නැතිවුනයි කියල හිතන කලාන්ත වූ පුද්ගලයෙකුත් නොවෙයි මේ.

'නොපි අසඤ්ඤී'-සංඥාව නැතිවූ යම්කිසි ධ්‍යානයකට සමවැදිල ඉන්න කෙනෙකුත් නොවෙයි. 'න විභූතසඤ්ඤී' - ඒ විදියටම සංඥාව ඉක්මවූ

තත්ත්වයකුත් නොවෙයි. ඔන්න ඔය විදියේ ප්‍රතිෂේධ හතරකින් දක්වල තිබෙන්නෙ අන්න අර ප්‍රඥාවෙන් විමුක්ත පුද්ගලයාගේ හිස් බැල්මයි. ඒකයි ලෝකයාට තේරුම් ගන්න අමාරු.

දැන් මේ බුදුපියාණන්ගේ උපමාවටම තරමක් දුරට හෝ අනුරූපව - අනවශ්‍ය නවීකරණයක් හැටියට සමහරවිට කෙනෙක් හිතන්න පුළුවනි - නමුත් අපි කීප අවස්ථාවක සඳහන් කරන්න යෙදුන අර චිත්‍රපටි ලෝකය, කාටත් අවබෝධ කරගන්න පහසු උපමාවක් ඒක. සිනමා ලෝකය පිළිබඳව දවල් කාලයේ චිත්‍රපටියක් පෙන්වන අවස්ථාවෙ ජනෙල් දොරවල් ආදිය වසාගෙන යම්කිසි වෛවර්‍ණ චිත්‍රපටියක් ප්‍රදර්‍ශනය කරනව. හදිසියේම අර දොරවල් ආදිය යම්කිසි ප්‍රමාදයකින් ඇරුන. ඇරිලගියා. ඒ අවස්ථාවේ සිනමා නැරඹූ පුද්ගලය තුළ ඇතිවන වෙනස කොහොමද? එතැනදීත්, ඒ පුද්ගලයාටත් ඇතිවෙන්නෙ හිස් බැල්මකුයි, ඒ චිත්‍රපටිය තවදුරටත් පෙන්වනව වෙන්න පුළුවනි. නමුත් අර පුද්ගලයට ඒ චිත්‍රපටිය පෙනෙන්නෙ නැහැ දැන්. අපි අර කිව්ව තදංග නිරෝධයක් සිද්ධ වෙනව ඒ පුද්ගලයා තුළ. මේ දේශනා හැම එකකම පරමාර්ථය හැටියට දක්වන්නෙ 'එතං සන්තං එතං පණීතං' ආදී පාඨයයි. ඒ පාඨය අනුව එක්තරා විදියක තදංග නිරෝධයක් අර පුද්ගලයා තුළත් සිද්ධ වෙනව. 'සබ්බසංඛාර' කෙසේ වෙතත් ඒ චිත්‍රපටිය හා සම්බන්ධ සිනමා දර්‍ශනය හා ඇතිවුන සංස්කාරයන් ඒ අවස්ථාවට සමනය වෙනව. උපධි වශයෙන් සළකනවනම් යම්කිසි අත්දැකීම් රාශියක් - යම්කිසි අත්දැකීම් රාශියක් මත පිහිටලයි කෙනෙක් චිත්‍රපටියෙ ඉදිරි දර්‍ශන දෙස බලන්නෙ - ඒ අත්දැකීම් රාශියත් ගිලිහිල ගිහිල්ල. උපධිපටිනිස්සග්ගයත් වෙල. 'තණ්හක්ඛයො' ඒ චිත්‍රපටිය පිළිබඳ තිබුනු තණ්හාව, ආසාව, සිදිල ගිහිල්ල. 'විරාගො' අර චිත්‍රපටයෙ තිබුනු වෛවර්‍ණභාවය විවර්‍ණ වෙලා හේදිලා ගිහිල්ල. 'නිරොධො' චිත්‍රපටය දැන් ඒ පුද්ගලයාට නැවතිල. 'නිබ්බානං' ඒ පුද්ගලයාගේ සන්තානය දැන් නිවිල. ඔන්න ඔය විදියට බලනකොට, ඒ පුද්ගලයගේ හිස් බැල්මත්, අර විජ්ජාව බලන යෝනිසෝමනසිකාරයෙන් යුක්ත ප්‍රඥවන්තයගෙ හිස් බැල්මත් තේරුම් කිරීමටයි මේ පද හතර යොදල තියෙන්නෙ.

එතකොට මේ ගාථාවෙ විශේෂත්වයක් හැටියට අපට කියන්න තියෙන්නෙ අර අගපදය' - සඤ්ඤානිදානා හි පපඤ්චසංඛා' ඒක ඉතාමත්ම වැදගත්. 'මක්නිසාදයත් පපඤ්ච සංඛාවෝ සඤ්ඤව නිදනය කොට ඇති හෙයිනි'. මේ පපඤ්ච කියන වචනය බුඩධර්‍මයේ අතිශයින්ම ගැඹුරු අංශයක් පෙන්නුම් කරන වචනයක්. මේ වචනය ගැන සෑහෙන තැකීමක් නැති නිසා තමයි බෞද්ධනිකායයන් රාශියක් පැන නැගුනෙත්. අපේම බෞඩදර්‍ශනයෙ පවා නොයෙකුත් ව්‍යාකූල විදියේ අදහස් මේ නිවන පිළිබඳව පැන නැගුනෙත් මේ 'පපඤ්ච' කියන වචනය ගැන සෑහෙන

තැකීමක් නැති නිසයි. ඒක නිසා අපි මෙතන ඉඳල මේ 'පපඤ්ච' යන්න තේරුම්ගැනීමට සෑහෙන කාලයක් යොදවන්න බලාපොරොත්තු වෙනව. මේ 'පපඤ්ච' කියන වචනය සූත්‍ර ධර්මයේ යම්කිසි ගැඹුරු අර්ථයකින් යෙදී ඇති බවට ඉතාමත්ම පැහැදිලි සාධකයක් වශයෙන් අපට ඉදිරිපත් කරන්න පුළුවනි එක්තරා කාරණයක්.

සාමාන්‍යයෙන් බුදුපියාණන්වහන්සේ එකම කාරණයකට, එකම ප්‍රස්තුතයකට, අදාළ ධර්මසමූහයක් පෙළගස්වනකොට, ඒ ධර්මවලින් ඉතාමත්ම ගැඹුරු, ඉතාමත්ම වටිනා දෙය අගටයි සඳහන් කරන්නෙ, දේශනාව කුළුගැන්වීම වශයෙන්. අඞ්ගුත්තර නිකායෙ ඒක බොහෝ විට දක්නට ලැබෙනව. අංක වශයෙන් දක්වනව කාරණා රාශියක් එහෙම දක්වල අගට දක්වන්නෙ වැදගත්ම දේ. ඒක සාමාන්‍ය රීතියක් වශයෙන් අප සළකනවානම්, අපට සොයාගන්න පුළුවනි පපඤ්ච ශබ්දය ඇතුළත් සූත්‍ර හතක්ම ඒ විදියේ රටාවක් ඇතිව. ඒ කියන්නෙ අවසානයට සඳහන් වන්නෙ පපඤ්ච කියන පදය. පපඤ්ච පදයෙ වැදගත්කම එයින් පේනව. අපට ඉතාමත්ම පැහැදිලි නිදර්ශනයක් දැන් සොයාගන්න පුළුවන් අඞ්ගුත්තර නිකායෙ අට්ඨක නිපාතයෙ තිබෙනව අනුරුද්ධ සූත්‍රය කියල සූත්‍රයක්

අනුරුද්ධ ස්වාමීන්වහන්සේ පාචීනවංසදායේ භාවනානුයෝගීව සිටින අවස්ථාවක ධර්මානුකූල විතර්ක හතක් ඇතිවුනා.

**අප්පිච්ඡස්සායං ධම්මො නායං ධම්මො මහිච්ඡස්ස. සන්තුට්ඨස්සායං ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්ස. පවිවිත්තස්සායං ධම්මො නායං ධම්මො සංගණිකාරාමස්ස. ආරද්ධවිරියස්සායං ධම්මො නායං ධම්මො කුසීතස්ස. උපට්ඨිතසතිස්සායං ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස. සමාහිතස්සායං ධම්මො නායං ධම්මො අසමාහිතස්ස. පඤ්ඤවතො අයං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස.**[5]

ඒ විදියේ විතර්ක හතක් ඇති උනා. මේ ගැන හිත හිතා හුහක්වෙලා අනුරුද්ධ ස්වාමීන්වහන්සේ එක්තරා විදියක ධර්ම ප්‍රීතියකින් වෙන්න ඇති, කල්පනා කරමින් හිටියෙ. ගණන හත නිසාත්, පඤ්ඤව අගට එන නිසාත් මෙච්චරයි හිතන්න පුළුවන් විතර්ක කියල හිතුව වෙන්න පුළුවනි. නමුත් බුදුපියාණන් වහන්සේ ඊට යොදුන් ගණන් ඈත භෙසකලා වනයේ වැඩ වෙසෙමින් අනුරුද්ධ ස්වාමීන්වහන්සේගේ හිත වැඩකරන ආකාරය බලාගෙන හිටිය. දැකල තේරුම් ගත්ත මේ හතෙන් සම්පූර්ණ නැහැ. වැඩේ සම්පූර්ණ නැහැ. අඩුවක් තියෙනව කියල මනෝමය කයකින් අනුරුද්ධ ස්වාමීන්වහන්සේ ඉදිරියෙ පෙනීසිටල 'සාධු සාධු' කියල ඒ විතර්ක හතටත් ප්‍රශංසාකළා ඒවා මහා පුරුෂ විතර්ක හැටියට. ඒවත් හිතන්න හැබැයි මෙන්න අටවැන්නකුත් මේකට එකතුකරගන්න කියල අටවෙනුවත් අමුතු එකක්

බුදුපියාණන් වහන්සේ ඉදිරිපත් කළා. මොකක්ද ඒ ?

**'නිප්පපඤ්චාරාමස්සායං ධම්මො නිප්පපඤ්චරතිනො නායං ධම්මො පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො'**

එතකොට මේක විග්‍රහකරන්න කලින් අපට මේ සඳහන් කළ දේවල්වල අර්ථයත් ප්‍රකාශ කරන්න සිද්ධ වෙනව. මේ මුල් හත අපි ගත්තොත් - **අප්පිච්ඡස්සායං ධම්මො නායං ධම්මො මහිච්ඡස්ස**- ඒ කියන්නෙ මේ ධර්මය අල්පේච්ඡ පුද්ගලයාටය. ඉච්ඡාවන්, ආසාවන්, වැඩි පුද්ගලයාට නොවේ.

**සන්තුට්ඨස්සායං ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්ස** - මේ ධර්මය ලද දෙයින් සතුටු වන ගුණය ඇති පුද්ගලයාටය. ලද දෙයින් සතුටු නොවන පුද්ගලයාට නොවේ.

- **පවිවිත්තස්සායංධම්මො නායං ධම්මො සංගණිකාරාමස්ස** -
  මේ ධර්මය විවේකයට කැමති තැනැත්තාටය. පිරිස්මැද ජීවත්වීමට කැමති පුද්ගලයාට නොවෙයි.
- **ආරද්ධවිරියස්සායං ධම්මො නායං ධම්මො කුසීතස්ස** - මේ ධර්මය අරඹනලද වීර්යය ඇති පුද්ගලයාටය. කුසීතයාට නොවෙයි.
- **උපට්ඨිතසතිස්සායං ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස** - මේ ධර්මය එළඹ සිටි සිහි ඇත්තාටය. මුළාවූ සිහිඇත්තාට නොවේ.
- **සමාහිතස්සායං ධම්මො නායං ධම්මො අසමාහිතස්ස** - මේ ධර්මය සමාධිය සහිත තැනැත්තාටය. අසමාහිත පුද්ගලයාට නොවෙයි.
- **පඤ්ඤවතො අයං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස** - මේ ධර්මය ප්‍රඥාවන්තයාටය. ප්‍රඥව නැති පුද්ගලයාට නොවේ.

  ඒකට එකතු කළා අටවැනි එක. එතකොට අපි පපඤ්ච කියන වචනයේ අර්ථය තවම නිගමනය නොකළ නිසා ඒ විදියටමයි පරිවර්තනය කරන්න වෙන්නෙ.
- **නිප්පපඤ්චාරාමස්සායං ධම්මො නිප්පපඤ්චරතිනො නායං ධම්මො පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො** - මේ ධර්මය නිප්පපඤ්චයෙන් සතුටුවන්නාවූ නිප්පපඤ්චයෙහි ඇලුනු තැනැත්තාටය මේ ධර්මය පපඤ්චයෙන් සතුටුවන පපඤ්චයෙහි ඇලුනු පුද්ගලයාට නොවේ. බුදුපියාණන්වහන්සේ එකතු කළ අටවෙනි එක මේකයි.

මෙන්න මේ අටවෙනි මහා පුරිස විතක්කයත් එකතුකරගෙන අනුරුද්ධ ස්වාමීන්වහන්සේ භාවනා කරල රහත්උනා. රහත්වෙලා එක්තරා ප්‍රීති වාක්‍යයක්, උදානයක් ප්‍රකාශකළා. ඒ උදාන ගාථාදෙකෙන් හෙළිවෙනව මේ නිප්පපඤ්චය පිළිබඳ පණිවිඩය - බුදුපියාණන්වහන්සේ දුන්න

අටවැනි එක - විශේෂයෙන් උන්වහන්සේට රහත්වීමට උපකාරී වූ බව. ඒ බව ප්‍රකාශවෙන්නෙ -

**'යථා මෙ අහු සංකප්පො - තතො උත්තරි දෙසයි**
**නිප්පපඤ්චරතො බුද්ධො - නිප්පපඤ්චං අදෙසයි.**
**තස්සාහං ධම්මමඤ්ඤාය - විහාසිංසාසනෙ රතො**
**තිස්සො විජ්ජා අනුප්පත්තො - කතං බුද්ධස්ස සාසනං'**

'යථා මෙ අහු සංකප්පො- මගේ සිතිවිලි කොයි ආකාරයටද තිබුනෙ මම හිත හිතා හිටියෙ යමක්ද, 'තතො උත්තරි දෙසයි ඊට වඩා ඉහළ යම්කිසි දෙයක් දේශනා කළා බුදුරජාණන්වහන්සේ. 'නිප්පපඤ්චරතො බුද්ධො නිප්පපඤ්චං අදෙසයි'-නිප්පපඤ්චයට ඇලුනාවූ ඒ බුදුපියාණන් වහන්සේ නිප්පපඤ්ච තත්ත්වයක් මට දේශනා කළා. 'තස්සාහං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො'-උන්වහන්සේගේ ධර්මය තේරුම් අරගෙන මම සාසනයෙහි ඇලුම්ව වාසය කළා. 'තිස්සො විජ්ජා අනුප්පත්තො, කතං බුද්ධස්ස සාසනං-ත්‍රිවිද්‍යාවට මා පැමිණියා, බුදුපියාණන්වහන්සේගේ අනුසාසනය මා කරල නිම කළා. මෙයින් අපට පෙනෙනව පපඤ්ච කියන වචනය කොයිතරම් වැදගත් එකක්ද කියල. අපේ නිවනට උපකාරවන ඉතාමත්ම වැදගත් අදහසක් මෙතන තිබෙන්නෙ. පපඤ්ච පදේට මුල්තැන දුන්න සූත්‍ර හැටියට අපට සඳහන් කරන්න පුළුවන්, නම් වශයෙන්, කලහවිවාද සූත්‍රය සක්කපඤ්හ[6] සූත්‍රය චූලසීහනාද සූත්‍රය[7] මධු පිණ්ඩික සූත්‍රය[8]. ඒ සූත්‍ර ගණනාවකම තිබෙනව මේ පපඤ්ච කියන වචනයට අගතැනට යෙදීමෙන් වැදගත් තැනක් දීල. මේ පපඤ්ච කියන වචනයෙ අර්ථය තේරුම් ගැනීමට උපකාරවන සූත්‍ර අතුරින් ඉතාමත්ම වටිනා සූත්‍රයක් තමයි මධුපිණ්ඩික සූත්‍රය. ඒක නිසා අපි මෙතන ඉඳල මධුපිණ්ඩික සූත්‍රය ගැනත් ප්‍රමාණවත් විග්‍රහයක් කරමු.

මේ මධුපිණ්ඩික සූත්‍රය ඇත්තවශයෙන්ම අවස්ථාතුනකින් විකාශනය වන සූත්‍රයක්. හරියට ජවනිකා තුනක් වගෙයි. මේ සූත්‍ර විග්‍රහයට බසින්න කලින්, මේ මධුපිණ්ඩික කියන සූත්‍ර නාමය ගැනත් පොඩි හැඳින්වීමක් කිරීම සමහරවිට සුදුසු වෙන්න පුළුවනි. මේ සූත්‍රදේශනාව අවසානයේදී ආනන්ද ස්වාමීන්වහන්සේ බුදුපියාණන්වහන්සේට ප්‍රකාශ කරනව "ස්වාමීනි හරියට අර කුසගින්නෙන් පෙළෙන පුද්ගලයෙකුට මී පිඩක් ලැබුනහම ඒ පුද්ගලය මේ මී පිඩ යම් යම් පැත්තකින් රස බලයිද? ඒ ඒ පැත්තෙන්ම කෙළවර නොවන නිමක් නැති මී පැණි ගලාගෙන එන්නේද? ඒ අන්දමින්ම මේ ධර්ම පර්යායය, මේ සූත්‍රය, යම්කිසි නුවණැති භික්ෂුවක් ප්‍රඥාවෙන් පරීක්ෂාකරතොත් එයින් සතුටක් චිත්ත ප්‍රසාදයක් ලබනව. ස්වාමීනි මේ සූත්‍රදේශනාවට දියයුතු නම මොකක්ද?" කියල බුදුපියාණන් වහන්සේගෙන්

විමසනව. අන්න ඒ අවස්ථාවෙ තමයි බුදුපියාණන්වහන්සේ මේ සූත්‍රයට නම දී වදාළෙ. එහෙමනම් ආනන්ද මේ සූත්‍රයට මධුපිණ්ඩික කියල කියන්න.

'මීපිඩ' කියල ප්‍රකාශ කරන්න. මේ 'මී පිඩේ සම්පූර්ණ රසය උරාගන්න අපට ශක්තිය මදි. ඒ වගේම සමහරවිට කාලවේලාවත් මදිවෙන්න පුළුවනි අද.

නමුත් ටිකක් හරි මේ ගැන ප්‍රකාශකරනව නම්, මේ සූත්‍රයේ පළමුවැනි ජවනිකාව-පළමුවැනි අවස්ථාව - හැටියට තියෙන්නෙ බුදුපියාණන්වහන්සේ කිඹුල්වත්පුර මහාවනයේ දිවා විහරණයෙහි වැඩසිටිනව. ඒ අවස්ථාවේ දණ්ඩපාණී නමැති ශාක්‍යයා-ඒ කියන්නෙ හැරමිටියක් බස්තමක් වැනි දේකුත් අරගෙනයි ඒ පුද්ගලයා ඇවිදින්නෙ - බුදුපියාණන්වහන්සේ ළඟට ඇවිත් ඉතාම කෙටි ප්‍රශ්නයක් ඇසුව. 'කිංවාදී සමණො කිමක්ඛායී' 'ශ්‍රමණය ඔබේ වාදය කුමක්ද? ඔබ කුමක්ද ප්‍රකාශ කරන්නෙ'. ඒකට බුදුපියාණන් වහන්සේ දුන්න පිළිතුර ඉතාම දිග පිළිතුරක්.

**යථාවාදී ඛො ආවුසො සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය න කෙනචි ලොකෙ විග්ගය්හ තිට්ඨති යථා ච පන කාමෙහි විසංයුත්තං විහරන්තං තං බ්‍රාහ්මණං අකථංකථිං ඡින්නකුක්කුච්චං භවාභවෙ වීතතණ්හං සඤ්ඤා, නානුසෙන්ති එවංවාදී ඛො අහං ආවුසො එවං අක්ඛායි.**

මේ පිළිතුර පරිවර්තනය කිරීමත් ලේසි වැඩක් නොවෙයි.

'ඇවැත්නි දෙවියන් සහිත, මරුන් සහිත බඹුන් සහිත මේ ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත මේ ප්‍රජාවෙහි, යම් බඳු දෘෂ්ටි ඇත්තෙක් කිසිවකු සමගත් වාදනොකර සිටීද, එසේම කාමයන්ගෙන් වෙන්ව, සිඳින ලද කුකුස් විචිකිච්ඡා ඇතිව, භවය විභවය පිළිබඳ තෘෂ්ණාවද පහකොට වාසයකරන්නාවූ ඒ බ්‍රාහ්මණයා - බ්‍රාහ්මණය කියල කියන්නෙ රහතන්වහන්සේ පිළිබඳවයි - ඒ බ්‍රාහ්මණයා වෙත සංඥාවෝ ලැග නොගනිද්ද, සංඥාව අනුසය වශයෙන් ලැග ගන්නේ නැත්ද අන්න එබඳු වාදයක් අන්න එබඳු ධර්මයක් මම ප්‍රකාශ කරනව' කියලයි බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්නෙ. මේ පිළිතුරේ මහ පුදුම ගැඹුරක් තියෙනව. ඒ කියන්නෙ සාමාන්‍යයෙන් ලෝකයේ යම්කිසි වාදයක් ප්‍රකාශ කරනව නම්, ඒ වාදය අනිත් වාදත් එක්ක ගැටෙන එක සවාභාවික දෙයක්. ඒ වගේම යම්කිසිවක් ප්‍රකාශකරනව නම් ඒ ප්‍රකාශකරන දේ පිළිබඳ සංඥාවල් ඒ පුද්ගලය තුළ තිබෙනව. නමුත් මේ බුදුපියාණන්වහන්සේ දීල තියෙන පිළිතුර පරස්පර විරෝධී කියමනක් වගෙයි.

කෙටියෙන් ගත්තොත් අපට සලකාගන්න පුළුවනි, විශේෂ ලක්ෂණ දෙකක් තියෙනව මේ බුදුපියාණන්වහන්සේ දුන්නු පිළිතුරේ. එකක් තමයි

බුදුපියාණන්වහන්සේගේ වාදය යම් බඳුද ඒ වාදය අනිකුත් වාද සමඟ ගැටෙන්නේ නැහැ. ඒ වගේම බුදුපියාණන් තුළ සංඥාවල් අනුසය වශයෙන් නැහැ. 'සඤ්ඤා' කියන වචනය එතන යෙදීමත් විශේෂයි. අපි දැන් සඤ්ඤ ගැන විශේෂ අවධාරණයකුත් කළා. බුදුපියාණන්වහන්සේ තුළ සඤ්ඤා අනුසය වශයෙන් නැහැ - එහෙම නැත්නම් - බුදුපියාණන්වහන්සේ දක්වන ඒ වාදයෙ. මේක ඇහුවහම මේ දණ්ඩපාණී ශාක්‍යයා කළදේත් දක්වල තියෙනව. අපි මේකට ජවනිකා කියල කිව්වෙත් නිකං නොවෙයි. ඊළඟට මේ දණ්ඩපාණී ශාක්‍යයා මොකද කළේ? ඒක සූත්‍රයෙ දක්වන්නෙ - හිස සළල, දිවහොලවල, නලළෙහි රැළි ගන්වා ගෙන, දණ්ඩපාණී ශාක්‍යයා පිටත් වෙලා ගියා. බුදුපියාණන්වහන්සේගේ පිළිතුරෙන් සද්ධාවක්වත් කිසිම වෙනසක්වත් සිදුඋනේ නැහැ ඒ පුද්ගලයා තුළ. එතකොට එතනින් ඒ අවසථාව ඉවරයි.

ඊළඟට අපට දක්නට ලැබෙන්නෙ බුදුපියාණන්වහන්සේ හැන්දැයාමෙ සංඝයා වහන්සේලා මැද - දම්සභා මණ්ඩපයේ කියල අපට කියන්න පුළුවන් - වැඩ ඉන්නව. ඒ අවසථාවෙ බුදුපියාණන්වහන්සේ ප්‍රකාශකළා මම මෙහෙම දිවාවිහාරයෙන් වැඩ ඉන්නකොට, මෙහෙම කෙනෙක් ආව, මෙහෙම ප්‍රශ්නයක් ඇසුවා මම ඊට මෙහෙම පිළිතුරක් දුන්න කියල. එතකොට ඒ පිරිසගෙන් එක් සංඝයාවහන්සේ නමක් බුදුපියාණන් වහන්සේගෙන් ඇසුව බුදුපියාණන්වහන්සෙ කළ ප්‍රකාශයෙ අදහස කුමක්ද? මොකක්ද මේක තේරුම කියල. ඔන්න එතකොට අරකටත් වඩා දීර්ඝ එක්තරා පාඨයක් බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කරනව.

> **'යතොනිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසංඛා සමුදාචරන්ති එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං එසෙවන්තො රාගානුසයානං එසෙවන්තො පටිඝානුසයානං එසෙවන්තො දිට්ඨානුසයානං එසෙවන්තො විචිකිච්ඡානුසයානං එසෙවන්තො මානානුසයානං එසෙවන්තො භවරාගානුසයානං එසෙවන්තො අවිජ්ජානුසයානං එසෙවන්තො දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවංතුව පෙසුඤ්ඤමුසාවාදානං එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති' -**

මේක ප්‍රකාශකරල - මේකටත් ජවනිකාව කියල කියන්නෙ හේතු සහිතවයි - මේ තරම් දිග ප්‍රකාශයක් කරල බුදුපියාණන්වහන්සේ එහෙමම හුනස්නෙක් නැගිටල විහාරගෙට පිවිසියා. අර භික්ෂූන්වහන්සේලට මොකක්ද සිද්ධ උනේ කියල අපට හිතාගන්න පුළුවනි. ඇසුව පාඨයටත් වඩා දිග පාඨයක් ප්‍රකාශකළා. ඒකත් සම්පූර්ණ නැහැ. ඒකෙ අසම්පූර්ණභාවය ඇත්තවශයෙන්ම මේක පරිවර්තනය කරනකොටයි තේරෙන්නෙ.

අර මුල් පාඨයත් ගැටලුවක් හැටියට - ප්‍රහේලිකාවක් තුළ ප්‍රහේලිකාවක් වගේ - ඉදිරිපත් කරල තියෙන්නෙ. 'යතොනිදානං භික්ඛු පපඤ්චසඤ්ඤාසංඛා සමුදාචරන්ති'-මහණෙ යම් හේතුවක්, යම් කරුණක් නිසා පපඤ්චසඤ්ඤාසංඛාවෝ, පුරුෂයකු අභිභවනය කරත්ද, මැඩලත්ද, එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං'- අන්න ඒ කාරණය පිළිබඳව අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං කියන පදතුනේ අදහස අපට ගන්න පුළුවනි, ඒ කාරණය පිළිබඳව සතුටු විය යුත්තක් හෝ කියාපෑ යුත්තක් හෝ බැඳීසිටිය යුත්තක් හෝ නැත්නම්, 'එසෙවන්තො රාගානුසයානං' එයම රාග අනුසයන්ගේ කෙළවරය. එයම පටිඝ අනුසයන්ගේ කෙළවරය. එයම දිට්ඨි අනුසයන්ගේ කෙළවරය. එයම විචිකිච්ඡා අනුසයන්ගේ කෙළවරය. එයම මාන අනුසයන්ගේ කෙළවරය එයම භවරාග අනුසයන්ගේ කෙළවරය. එයම අවිජ්ජා අනුසයන්ගේ කෙළවරය. එයම දඬුගැනීම් ආයුධ ගැනීම්, කලහ විග්‍රහ විවාද, බහින් බස්වීම් කේලාම් කීම් ආදී මේ සියලු අකුසල් වලද කෙළවරය. 'එත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති- මේ සියලු පාපී අකුසල ධර්ම සම්පූර්ණයෙන්ම, නිරවශේෂයෙන්ම නිරුද්ධවේ. මෙතන වඩාත් ගැටළුව වන්නෙ අර මුල කියාපු වචන ටිකයි. 'යතො නිදානං' යම් කාරණයක් නිසා පපඤ්ච සඤ්ඤා සංඛාවෝ පුරුෂයකු මැඩලත්ද එහිලා සතුටු වියයුත්තක් කියාපෑ යුත්තක් බැඳීසිටිය යුත්තක් නැත්නම් තමයි ඔය කියාපු විදියට අනුසය ආදී සියලු කෙලෙස් සම්පූර්ණයෙන්ම, නිරවශේෂ වශයෙන්ම ප්‍රහීන වන්නෙ. එතකොට බුදුපියාණන්වහන්සේ නැගිට ගියාට පස්සෙ මේ සංඝයාවහන්සේලාට කර කියාගන්න දෙයක් නැහැ. වටපිට බලනකොට මහාකච්චාන ස්වාමීන්වහන්සේ ඉන්නව. ඉතින් මහාකච්චාන ස්වාමීන්වහන්සේට ආරාධනා කළා 'ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ විසිනුත් බොහෝ අවස්ථාවල ඔබවහන්සේට ප්‍රශංසා කරල තියෙනව කෙටියෙන් දේශනා කළ දෙවල් දීර්ඝවශයෙන් විවරණය කිරීමට දක්ෂයෙකු හැටියට. කරුණාකරල අපට මේක විග්‍රහ කරන්නෙයි කියල. මහා කච්චාන ස්වාමීන් වහනසේත් ටිකක් අදිමදි කළා. නමුත් පසුව මේ බලවත් ඇවිටිල්ල නිසා ඔන්න ඊළඟට දෙනව විවරණයක්.

දැන් අපි එන්නෙ සූත්‍රයේ තුන්වෙනි අවස්ථාවටයි. මහා කච්චාන ස්වාමීන් වහන්සේ දෙන විවරණයයි ඊළඟට අපි ප්‍රකාශ කරන්නෙ. 'චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො ඵස්ස පච්චයා වෙදනා යං වෙදෙති තං සඤ්ජානාති යං සඤ්ජානාති තං විතක්කෙති, යං විතක්කෙති තං පපඤ්චෙති යං පපඤ්චෙති තතො නිදානං පුරිසං පපඤ්චසඤ්ඤාසංඛා සමුදාචරන්ති අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු ' - ඇත්තවශයෙන්ම ඇසත් රූපයත් පළිබඳව පමණක් නොවෙයි ඉන්ද්‍රිය හය පිළිබඳවමත් ඒ විදියට ඒ සූත්‍රයෙ සඳහන් වෙනව. ඒ එක එකක් නොකිව්වට තේරුම් ගැනීම පහසුයි.

පරිවර්තනය වශයෙන් ගත්තොත් මෙහෙමයි ගන්න තියෙන්නෙ 'චක්ඛුඤ්ච ආවුසො පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං'-ඇවැත්නි ඇසද රූපද නිසා චක්ඛුවිඤ්ඤාණය උපදී. තිණ්ණං සංගති ඵස්සො-මේ තුනෙහිම එකතුවීම එක්තැන් වීම ස්පර්ශයයි. 'ඵස්ස පච්චයා වෙදනා - ස්පර්ශය ප්‍රත්‍යය කරගෙන වේදනාව ඇතිවෙයි. ඊළඟට' යං වෙදෙති තං සඤ්ජානාති - යමක් විඳියිද එය හඳුනා ගනියි. යං සඤ්ජානාති තං විතක්කෙති' - යමක් හඳුනාගනීද එය පිළිබඳව විතර්ක කරයි. යං විතක්කෙති තං පපඤ්චෙති' - යමක් පිළිබඳව විතර්ක කරයිද ඒ පිළිබඳව ප්‍රපඤ්ච කරයි. යං පපඤ්චෙති තතො නිදානං පුරිසං පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති - යමක් පිළිබඳව පපඤ්චකරයිද 'තතො නිදානං' අන්න දැනුයි විස්තර වුනෙ. අර 'යතො නිදානං, එකට අවශ්‍ය අනිකුත් වචනය ආවෙ දැනුයි. 'තතො නිදානං, එමනිසා එය නිදාන කරගෙන 'පුරිසං පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති' පපඤ්ච සඤ්ඤා සංඛාවෝ පුරුෂයකු - අර කියාපු ඉන්ද්‍රිය ඥානය මෙහෙයවූ පුද්ගලයාව - මැඩපත්වනව, අභිභවනය කරනව. කුමක් පිළිබඳවද? - අතීතානාගත පච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙය්‍යෙසු රූපෙසු' - අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න - වර්තමාන - කියන කාලත්‍රයටම අයත් ඇසින් බලා දතයුතු රූපයන් පිළිබඳව, අතීතයේ බලපු රූපත් අනාගතයේ බලන්න තියෙන රූපත් මේ දැන් පෙනෙන රූපත් පිළිබඳව, පපඤ්ච සඤ්ඤා සංඛාවන් අභිභවනය කරනව කියල. ඒ විදියටම තමයි කනත් ශබ්දයත් ආදියෙදි. අවසාන වශයෙන් සිතත් ධර්මයනුත් පිළිබඳවත් මේ ආකාරයටම සඳහන් කෙරෙනව මහා කච්චාන ස්වාමීන්වහන්සේගෙ විග්‍රහයෙ. මෙතනදිත් අපට යම්කිසිවක් කියන්න සිද්ධවෙනව - අටුවාවෙ මේක විග්‍රහකරල තිබෙන ආකාරය. [9]මේ සූත්‍රයෙ පපඤ්ච සඤ්ඤා සංඛා පදයෙ ගැඹුරු අර්ථය හෙළිවෙන ආකාරයටම නොවෙයි මේක විග්‍රහකරල තියෙන්නෙ.

ඒකට විශේෂ හේතුවක් වන්නෙ මුලින් කියාපු පාඨය තේරුම් කිරීමේදී අටුවාව මෙතන තියෙන කාරකය පිළිබඳ විශේෂත්වය නොතකා හරිනව. ඒ කියන්නෙ මේක ආරම්භ කෙරෙන්නෙ කොහොමද? භාවකාරකයෙන් 'චක්ඛුඤ්ච ආවුසො පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං' - ඇසත් - 'පටිච්ච' කියන වචනය එතනත් ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායයට එකඟව - ඇසත් රූපයනුත් ප්‍රත්‍යයකරගෙන චක්ඛුවිඤ්ඤාණය උපදිනව. තිණ්ණං සංගති ඵස්සො' - මේ තුනෙහිම එකතුවීම ස්පර්ශයයි. ඵස්ස පච්චයා වෙදනා' - ස්පර්ශය ප්‍රත්‍යයකරගෙන වේදනාව. අන්න එතන ඉඳල විශේෂත්වයක් තියෙනව. යං වෙදෙති තං සඤ්ජානාති යං සඤ්ජානාති තං විතක්කෙති යං විතක්කෙති තං පපඤ්චෙති' ඔය විදියට ඇත්තවශයෙන්ම අවස්ථා තුනකට බෙදන්න පුළුවන් ඉන්ද්‍රිය ඥානය පිළිබඳව දක්වල තිබෙන මේ විස්තරය, මහා කච්චාන ස්වාමීන් වහන්සේ කළ විස්තරය. භාවකාරකයෙන් ආරම්භ

වෙන්නෙ. වේදනා අවස්ථාවට පත් උනාට පස්සෙ තියෙන්නෙ 'යං වෙදෙති තං සඤ්ජානාති' - යමක් විඳීද එය හඳුනාගනී. යමක් හඳුනාගනීද ඒ පිළිබඳව විතර්කකරයි. අපි මෙහෙම පරිවර්තනය කළාට මොකද අටුවාව මේක තෝරන්නෙ 'සඤ්ඤා සඤ්ජානාති' විතක්කො විතක්කෙති'. ඔන්න ඔය විදියට - අර පුද්ගලයෙකු කරනදෙයක් හැටියට නොවෙයි එතන දක්වල තිබෙන්නෙ. 'ඒ කියන්නෙ, ඔන්න වේදනාව ඇති වෙනව. ඒ වෙලාවට සඤ්ඤාව ඉදිරිපත් වෙලා ඒ වේදනාව හඳුනාගන්නට. ඊළඟට විතර්කය ඉදිරිපත්වෙලා සඤ්ඤාව පිළිබඳව විතර්ක කරනව. ඊළඟට පපඤ්චය නැඟී හිටල විතර්කය පිළිබඳව ප්‍රපඤ්ච කරනව. ඔය විදියටයි අටුවාව තෝරන්නෙ. එයින් අර මහා කච්චාන ස්වාමීන්වහන්සේ මේ විග්‍රහයේදී මේ විදියට කර්තෘ කාරකයක් දැමීමේ අදහස අමතක වෙලා තිබෙනව.

යම්කිසි විශේෂ අර්ථයකිනුයි මෙතන ඒක යොදල තියෙන්නෙ. බුදුපියාණන්වහන්සේ අර 'යතො නිදානං භික්ඛු පුරිසං පපඤ්චසඤ්ඤාසංඛා සමුදාචරන්ති' ආදීවශයෙන් දැක්වූ 'පපඤ්චසඤ්ඤාසංඛා' පුද්ගලයෙකු මැඩලන ආකාරය විග්‍රහකිරීමටයි මහා කච්චාන ස්වාමීන්වහන්සේ මේ විදියට මේ ධර්ම සමූහය තුන් ආකාරයකින් දක්වල තියෙන්නෙ. ආරම්භය භාවකාරක වශයෙන්. ඊළඟට තිබෙන්නෙ කර්තෘකාරක වශයෙන්. අර පුද්ගලයා වේදනාවෙන් පස්සෙ තමා අතට ගන්නව වැඩේටික. 'යං වෙදෙති තං සඤ්ජානාති' - අර වේදනාවෙන් පස්සෙ එය හඳුනා ගන්නව. ඒ හැඳිනීම පිළිබඳව ඊළඟට විතර්ක කරනව. ඒ විතර්ක පිළිබඳව ප්‍රපංච කරනව. ඔන්න තුන්වෙනි අවස්ථාව ඒ හැමටම වඩා ඕළාරිකයි. ක්‍රමක්‍රමයෙන් ඉන්ද්‍රිය ඥානය ඕළාරික වන ආකාරයයි මහාකච්චාන ස්වාමීන්වහන්සේ පෙන්නුම් කරන්නෙ. තුන්වෙනි අවස්ථාව ඉතාමත්ම ඕළාරිකයි. ඒක කුමක්ද? යං පපඤ්චෙති තතො නිදානං පුරිසං පපඤ්චසඤ්ඤා සංඛා සමුදාචරන්ති - එතන 'පුරිසං' කියල කියන්නෙ. කර්ම විභක්ති රූපය එයින් හැඟෙන්නෙ. අර ඉන්ද්‍රිය ඥානය මෙහෙයවූ පුද්ගලයාව මැඩ පවත්වනව අර පපඤ්චසඤ්ඤාසංඛාවන්. ඒ 'සංඛා' කියන වචනය පවා දීර්ඝ විස්තරයකින් විවරණය කළයුත්තක්. කුමක් හෝ වේවා පපඤ්ච සඤ්ඤා සංඛාවෝ අර ඉන්ද්‍රිය ඥානය මෙහෙයවූ පුද්ගලයාව මැඩලනවා. අභිභවනය කරනව. අන්න ඒ විදියෙ දෙයක් මෙතනින් කියවෙන්නෙ. අන්න ඒ මැඩලීම නිසා තමයි අර කියාපු විදියට අර ක්ලේශරාශිය ලෝකයේ ඇතිවෙන්නෙ. පපඤ්ච කියන වචනයේ වැදගත්කම එතනිනුත් අපට පේනව.

මේක අපි පොඩි උපමාවක් වශයෙන් දක්වතොත් - මෙතන මේ වන සිද්ධිය - සාමාන්‍ය ජන කථාවක් තියෙනව මන්ත්‍රකරුවන් තුන්දෙනෙක් කැලයක් මැදින් යනකොට ව්‍යාඝ්‍රයකුගේ ඇටසැකිලි දැකල ඒ තුන්දෙනාම එකතුවෙලා ඒ ව්‍යාඝ්‍රයා යථා තත්ත්වයට පත්කරන්න කථාකරගත්ත.

එක්කෙනෙක් ඇටටික එකතු කරල ව්‍යාඝ්‍රයගෙ රූපය මැව්ව. තව කෙනෙක් මසුත් එකතු කළා. තුන්වෙන්නා පණදුන්නා. පණදුන්නට පස්සෙ මොකද උනේ ව්‍යාඝ්‍රයට ගොදුරු උනා අර මන්ත්‍රකාරයො. අන්න ඒ වගේ දෙයක්. සංකල්ප පිළිබඳ විතර්ක පිළිබඳ ගැඹුරු දර්ශනයක්, මේ සූත්‍රයේ සඳහන් වෙන්නෙ. මේක මීපිඩක් කියල බුදුපියාණන් වහන්සෙ ප්‍රකාශකළේ, ආනන්දස්වාමීන්වහන්සෙ ප්‍රකාශකළේ, නිකං නොවෙයි. මෙතන තියෙනව සම්පූර්ණ රහස, සියලුම දෘෂ්ටිවාද පිළිබඳ සංඥවල් අනුසය වශයෙන් ලැග ගැනීම පිළිබඳ රහස මෙතන තියෙනව. සංකල්ප විතර්ක පිළිබඳව බෞද්ධ දර්ශනයේ එන, ඒ වගේම වාග්විෂය පිළිබඳව, අපි එදිනෙදා ව්‍යවහාර කරන වචන පිළිබඳව, ප්‍රඥප්ති පිළිබඳව යම්කිසි ගැඹුරු දර්ශනයක් මෙතැනින් හෙළිවෙනව.

අපි තවම 'පපඤ්ච' පිළිබඳව අර්ථ වශයෙන් ප්‍රකාශ කළේ නැහැ. කෙටියෙන් සඳහන් කරනවනම් මේ 'පපඤ්ච' කියන වචනයේ නිරුක්තිය සළකා බැලුවොත් - වාග් ප්‍රපංචය ' කියන වචනය සාමාන්‍යයෙන් ව්‍යවහාරයෙ යෙදෙනව. ඒ කියන්නෙ 'වාග් බාහුල්‍යය' වචන වැඩිපුර යෙදීම, එහෙම නැත්නම් පමණට වඩා විස්තර කිරීම. කියල ඒ අදහස කියැවෙනව ප්‍ර පූර්ව-පඤ්ච් ධාතුවෙන් එන වචනයක් තියෙනව. ඒකෙ අදහස විහිදීයාම. විස්තාරකිරීම. ඒ අර්ථ තියෙනව. ප්‍රපංචයෙන් බොහෝවිට සිදුවන්නෙ එක්තරා විදියක මෝහනයක් අවුල් වීමක්. ඒ අර්ථයත් තියෙනව. තවත් සමහර තැන්වල මේ පපඤ්ච වචනය යොදනව කෙටියෙන් ප්‍රකාශකළ දෙයක් වඩා සවිස්තරව දැක්වීමට. අර පුද්ගලයින් හතර දෙනෙක් ගැන සඳහන් වෙනව උග්ඝටිතඤ්ඤු විපඤ්චිතඤ්ඤු නෙය්‍යො පදපරමො[10] කියල. එතන තියෙනව 'විපඤ්චිතඤ්ඤු' කියන එක. ඒකත් මේ පපඤ්ච පදයට ටිකක් සමානයි. කෙසේ හෝ මේ පපඤ්ච පදය සාමාන්‍යයෙන් වාග්ව්‍යවහාරය වශයෙන් බලනකොට එක අර්ථයක් තියෙනව. එක්තරා විදියක අනවශ්‍ය වාග් බාහුල්‍යයක්. වචන වැඩිවීමක් නිසා ඇතිවන මෝහනයක්. නමුත් මෙතන ඊට වඩා ගැඹුරක් දකින්න පුළුවනි. ඒ කියන්නෙ මේක සාමාන්‍ය කථා ව්‍යවහාරය පිළිබඳ දෙයක් නොවෙයි සිත පිළිබඳවයි. ඉන්ද්‍රිය ඥානය පිළිබඳවයි. ඇත්ත වශයෙන්ම විතර්කවලට පස්සෙ එන අවස්ථාවක් හැටියට මේ පපඤ්චය දක්වල තියෙන්නෙ. විතක්ක විචාර කියන වචන දෙකෙනුත් අපට පේනව විතර්කයට පසුව විචාරය යොදල තියෙන්නෙ අර විතර්කයෙම තියෙන සිත දුවවන ස්වභාවයක්. දූරඞ්ගමං එකචරං[11] ආදී වශයෙන් සිතේ තිබෙන දුවන ස්වභාවය මේ විතර්ක උඩයි යන්නෙ. විතර්ක, සංකල්ප - අන්න ඒ දිවීමෙන් ඇතිවන බරපතලම මෝහනයක්, මෝහයක්, හෙළිවෙනව මේ පපඤ්ච කියන වචනයෙන්.

## අඩෝලිපි

1. මහා නි. 380-382 පිටු (බු.ජ.33)
2. සු.නි. 328-330 පිටු (බු.ජ.25)
3. දී.නි. I 390 පිට. (බු.ජ.7)
4. සං.නි. III 244 පිට (බු.ජ.15)
5. අං.නි. V 136 පිට (බු.ජ.22)
6. දී.නි. II 416 පිට (බු.ජ.8)
7. ම.නි. I 158 පිට (බු.ජ.10)
8. ම.නි. I 276 පිට (බු.ජ.10)
9. ප.සූ. II 63 පිට (හේ.මු.)
10. අං.නි. II 260 පිට (බු.ජ.9)
11. ධ.ප. චිත්ත වග්ග

# 12 වන

# ඡේදය

# 12 වන දේශනය

**"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"**

"එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං."

"මෙය ශාන්තය මෙය ප්‍රණීතය එනම් සියලු සංස්කාරයන්ගේ සංසිඳීම, සියලු උපධීන් අතහැර දැමීම, තණ්හාව ක්‍ෂය කිරීම, නොඇල්ම නම් වූ විරාගය, නැවැත්ම නම් වූ නිරෝධය, නිවීම නම් වූ නිබ්බානය."

**අතිපූජනීය මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන ගරුතර යෝගාවචර මහා සංඝ රත්නයෙන් අවසරයි. නිබ්බාන යන මාතෘකාව යටතේ පවත්වනු ලබන දේශනා මාලාවේ දොළොස්වන දේශනයයි මේ.**

කාලයේ වැල්ලෙන් වැසීගිය බෞද්ධදර්ශනයේ ඉතා ගැඹුරු අංශයක් හෙළිකර ගැනීමට උපකාර වන පපඤ්ච නිප්පපඤ්ච යන පද දෙක, පසුගිය දේශනය ආරම්භයේදී අපි මතුකර ගත්තා. මධුපිණ්ඩික සූත්‍රයෙන් ආරම්භ කළ අර්ථවිවරණයේදී අපට මෙතෙක් මතුඋනේ, මෙතෙක් අපට පැහැදිලි උනේ, මේ පපඤ්ච යන්න ඉන්ද්‍රියඥනයේ එක්තරා ඕළාරික අවස්ථාවක්, මෝරාගිය අවස්ථාවක්, පෙන්නුම්කරන වචනයක් බවයි. සාමාන්‍යයෙන් භාෂාව්‍යවහාරයේදී දිග්ගැස්සීම, විස්තර කිරීම, වචන වැඩිපුර යෙදීම, යන අර්ථ ඇති පපඤ්ච යන පදය, ඉන්ද්‍රියඥානය පිළිබඳව යෙදෙනකොට ඊට වඩා විශේෂ අර්ථයක් පෙන්නුම් කරන බව, අපට මධු පිණ්ඩික සූත්‍රයෙන් පෙනීගියා. ඉන්ද්‍රිය ඥානය පිළිබඳව කල්පනා කරල බලනකොට, මේ පපඤ්චයෙන් කෙරෙන්නෙ, සංඥා මත පිහිටල විතර්ක කරල ඒ විතර්ක උඩ පපඤ්ච කිරීම නිසා අතීත, වර්තමාන, අනාගත කියන කාලත්‍රයට අයත් ඒ ඒ ඉන්ද්‍රිය ආරම්මණයන් පිළිබඳව ඇතිවන පපඤ්ච සඤ්ඤ සංඛා නමැති දෙයක් ඒ ඉන්ද්‍රිය ඥනය මෙහෙය වූ පුද්ගලයාව මැඩපවත්වන බව, යටපත්කරන බව, මධුපිණ්ඩික සූත්‍රයෙන් අපට පෙනීගියා.

මෙයින් අපට තේරෙනව ඉන්ද්‍රියඥානය නිසා මනුෂ්‍යයකු තුළ ඇතිවන යම්කිසි මෝහනයක්, ඉහවහායාමක්, ව්‍යාකුල තත්ත්වයක්, මේ පපඤ්ච යන වචනයෙන් හැඳින්වෙන බව. අටුවාචාරීන්වහන්සේලා මේ වචනයට අර්ථකීමේදී බොහෝ විට උපකාර කරගත්තේ 'පමත්ත' 'පමාද' 'මදන' යන වචනයි. 'කෙනට්ඨෙන පපඤ්චො මත්ත පමත්තාකාර පාපනට්ඨෙන[1] මේ

එක තැනක දෙන විවරණයක්, කවර අර්ථයකින් පපඤ්ච වේද? මත්වූ, අතිශයින් මත්වූ, ආකාරයකට පමුණුවන අර්ථයෙන්ය කියල ඒ විදියට විවරණය කරනව. තවත් තැනක කියනව 'පපඤ්චිතාව හොනති පමත්තාකාරපපත්තා[2] ප්‍රපංච වූවාහුවෙති. එනම් ප්‍රමත්ත තත්ත්වයට, අතිශයින් මත්වූ තත්ත්වයට, පත්වූවාහු වෙති. එහෙම නැත්නම් සමහර අවස්ථාවල කියනව 'මදනාකාර සණ්ඨිතො කිලෙස පපඤ්චො[3] කියල මත්කරවන ආකාරයෙන් පිහිටි කෙලෙස් පපංචය' කියල ඔයවිදියටත් තේරුම් කරනව. බැලුබැල්මට මේ පපඤ්ච කියන පදය පමාද කියන වචනයට සමානයි. සමානාර්ථවත් හැටියට සළකන්න පුළුවන්. නමුත් එක්තරා සියුම් අර්ථභේදයක් තියෙනව. පමාද කියන වචනයෙන් හැඟෙන්නෙ, මූලික නිරුක්ති වශයෙන් බැලුවත්, අතිශයින් මත්වීම කියන අදහසයි, මූලිකව තිබෙන්නෙ. එයින් අපට හැඟෙන්නෙ මත්වීම නිසා ඇතිවන නිෂ්ක්‍රියත්වයක් එහෙම නැත්නම් අකර්මණ්‍ය භාවයක්. වැඩ කර ගන්න බැරිබවක් වගේ හැඟෙනව මේ ප්‍රමාද කියන වචනයෙන්. ඒ නිසා සාමාන්‍යයෙන් සිදුවෙන්නෙ කළයුතු වැඩය පැහැරහැරීමක්. එහෙම නැත්නම් අතපසුවීමක්. ඒ ප්‍රමාදයෙන් වනදේ. නමුත් අපි කලින් දැක්වුවා පපඤ්ච කියන වචන නිරුක්ති වශයෙන් බලනකොට, විහිදීයාම, විස්තාරය, වචන වැඩිපුර යෙදීම, කියන අදහස තියෙන නිසා ඒ වචනයේ එයින් අපට හැඟෙන්නෙ නැහැ නිෂ්ක්‍රියත්වයක්, ඒ කියන්නෙ අකර්මණ්‍යබවක් හැඟෙන්නෙ නැහැ. ඒ වෙනුවට අපට හිතාගන්න තියෙන්නෙ යම් කිසි අනිසි මගක යාමක් නිසා, නිසිමඟ අතහැරල අනිසිමග යාමක් නිසා, නොමග යාමක් නිසා බලාපොරොත්තුවන අර්ථයට නොපැමිණීම කියන එකයි.

අපි මේක පොඩි උපමාවකින් තේරුම් කරන්න බලමු. පමාද - පපඤ්ච කියන දෙකේ අර්ථ වෙනස. දැන් අපි කොළඹ යන කෙනෙකුට හදිසි පණිවිඩයක් ගෙනයන්න දුන්නාම ඒ තැනැත්තා ළඟම ඇති මත්පැන්හලට ගිහිල්ල මත්පැන් බීල පැත්තකට වෙලා නිදාගත්තොත් අන්න ප්‍රමාදය. එහෙම නැතිව මේ තැනැත්තා කොළඹට යන කෙටිපාර තියෙද්දි වෙන වංකගිරිමාර්ගයකින් මහවටරවුම් මාර්ගයකින් ගිහිල්ල අන්තිමට නුවරට ගියොත් අන්න පපඤ්චය. ඔන්න ඔය විදියට පමාද පපඤ්ච කියන වචනදෙකේ සියුම් අර්ථ භේදයක් තියෙනව. මේ අපි දැක්වූ උපමාවට තරමක් කිට්ටුකරන්න පුළුවන් නිදර්ශන වශයෙන් දැක්විය හැකි ගාථා යුගලයක් අපට හමුවෙනව අංගුත්තර නිකායෙ ඡක්ක නිපාතයෙ -

**යො පපඤ්චං අනුයුත්තො - පපඤ්චාභිරතො මගො**
**විරාධයී සො නිබ්බානං - යොගක්ඛෙමං අනුත්තරං**
**යොච පපඤ්චං හිත්වාන - නිප්පපඤ්චපදෙ රතො**
**ආරාධයී සො නිබ්බානං - යොගක්ඛෙමං අනුත්තරං**[4]

මේ පළමුවෙනි ගාථවෙ අදහස - 'යො පපඤ්චං අනුයුත්තො පපඤ්චා -භිරතො මගො 'යම් මෝඩ පුද්ගලයෙක් ප්‍රපංචයෙහි යෙදුනේද, ප්‍රපංචයෙහි ඇලුනේවේද හෙතෙම අනුත්තර යොගක්ඛෙම නම් වූ නිවනින් ඈත්වෙයි. දෙවෙනි ගාථාව - යොච පපඤ්චං හිත්වාන නිප්පපඤ්චපදෙ රතො-නමුත් යම් කෙනෙක් පපංචය අතහැරල නිප්පපංච මාර්ගයෙහි ඇලුනේවේද, ඒ තැනැත්තා අනුත්තර යොගක්ඛෙම නම් වූ නිවනට පැමිණෙනව. ළං වෙනව'

මෙන්න මේ විදියට අපට තේරුම්ගන්න පුළුවනි මේ 'පපඤ්ච' 'පමාද' කියන වචන දෙකේ යම්කිසි වෙනසක් තිබෙන බව. ඒ වගේම අටුවාවල බොහෝවිට මේ පපඤ්ච කියන එක ඉතාම සරල අන්දමින් තෝරන්නෙ තණ්හාමානදිට්ඨිවලට කියන වෙනත් නමක් හැටියටයි. තණ්හාදිට්ඨිමානානං එතං අධිවචනං[5] ඔය විදියට දක්වනව. පපඤ්ච කියන එක තෘෂ්ණාමාන දෘෂ්ටි කියන ඒ ප්‍රධාන කෙලෙස් තුනට අධිවචනයක් - වෙනත් වචනයක් හැටියට තෝරනව. නමුත් එයින්ම පපඤ්ච කියන වචනයේ අර්ථය තේරුනා නොවේ. ඒවා නිදසුන් තමයි. කාරණයත් ඇත්ත. මක්නිසාද මධුපිණ්ඩික සූත්‍රයෙන්ම අපට පෙනී ගියා, ඒ සූත්‍රයේ සඳහන් උනා 'අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසෙතබ්බං කියල වචන තුනක්. අභිනන්දිතබ්බං කියන්නෙ සතුටුවිය යුත්තක්. අභිවදිතබ්බං කියන්නෙ කියාපෑ යුත්තක්. අජ්ඣොසෙතබ්බං කියන්නෙ බැඳී රැඳී සිටිය යුත්තක්. මේ වචන තුන යොදන්නෙ සූත්‍රවල බොහෝවිට තණ්හාමාන දිට්ඨි කියන කෙලෙස් තුන හැඳින්වීමටයි. 'එතං මම, කියල තණ්හා වශයෙන් සතුටුවීම-අභිනන්දිතබ්බං 'එසො අහං අස්මි' මේ මම වෙමි කියල මාන වශයෙන් කියාපෑමක්-අභිවදිතබ්බං, එසො මෙ අත්තා-මේ මගේ ආත්මයයි කියල දෘෂ්ටි වශයෙන් බැඳී සිටීමක්-අජ්ඣොසෙතබ්බං, එතකොට මේ අටුවාවෙ තණ්හා මාන දිට්ඨි ආශ්‍රයෙන් පපඤ්ච යන වචනය තෝරන එක බොහෝදුරට සහේතුකයි. නමුත් මෙතන විශේෂත්වයක් හැටියට දක්වන්න තිබෙන්නෙ මේ පපඤ්ච කියන වචනයේ අර මූලික අර්ථය අනුවම සංකල්ප විතර්ක මගින් කෙනෙකුගේ සිතුවිලි ලියලා අතුඉති විහිදා පැතිරී ආකුල ව්‍යාකුල වන බවක් මේ පපඤ්ච කියන වචනයෙන් හැඟෙනව. ඒකතමයි අර පපඤ්ච සඤ්ඤා සංඛාවලට අර පුද්ගලය යටත්වෙනව කියල කියන්නෙ. මෙතනදී අපට උපකාර වෙනව මේ 'සංඛා' කියන වචනයෙ අර්ථය තේරුම් ගැනීමත්. මේ සංඛා කියන වචනය අටුවාවෙ තෝරන්නෙ 'පපඤ්ච සඤ්ඤා සංඛාති එත්ථ කොට්ඨාසා කියල සංඛා කියන වචනය තෝරන්නෙ 'කොටස' කියන එකෙන්-'කොට්ඨාසා[6]. එහෙම ගත්තොත් පපඤ්චසංඛා කියල කියන්නෙ පපඤ්ච කොටස්, අමුතු තේරුමක් නැහැ ඒ 'සංඛා' කියන වචනයෙ එහෙම ගත්තොත්. නමුත් මේ පපඤ්ච සඤ්ඤා සංඛා' 'පපඤ්ච සංඛා' ආදී පද සූත්‍රවල යෙදෙන ආකාරය ගැන හොඳට පරීක්ෂා කරල බැලුවොත්, මේ කොටස් කියන අර්ථයට වඩා යම්කිසි ගැඹුරු අර්ථයක් මෙතන තියෙනව. අපි දන්නව 'සංඛා'

සමඤ්ඤා පඤ්ඤත්ති' කියන්නෙ පර්යාය පද, 'සමානාර්ථවත් පද. සංඛා සමඤ්ඤා පඤ්ඤත්ති - මේ වචන තුනෙන් පඤ්ඤත්ති කියන වචනය කාටත් පැහැදිලි වචනයක්, ප්‍රඥප්තිය - යමක් හැඳින්වීමට දෙන නම. ඒ ප්‍රඥප්ති කියන වචනය ආශ්‍රයෙන්ම ගත හැකි තව පද දෙකක් තමයි සංඛා සමඤ්ඤා කියන්නෙ. 'සංඛා' කියල කියන්නෙ ගණන් ගනු ලැබීම, ගිණීම. සමඤ්ඤා කියන්නෙ, එකමුතුව හැඳින්වීම. 'ගිණීම' හැඳින්වීම. පැනවීම ඔය වචන තුන බොහෝදුරට ලෝකව්‍යවහාර පිළිබඳව යෙදෙන වචන තුනක් - සංඛා සමඤ්ඤා පඤ්ඤත්ති'

එතකොට අපට මේ පපඤ්ච පිළිබඳ ප්‍රශ්නයට කෙලින්ම අදාල කරගත හැකි අඳමේ වටිනා උඩෘතපාඨයක් ලැබෙනව සංයුත් සඟියේ ඛන්ධ සංයුත්තයේ නිරුත්ති පථ සූත්‍රයෙන්. ඉතාම වටිනා සූත්‍රයක්.

**තයො මෙ භික්ඛවෙ නිරුත්තිපථා අධිවචනපථා පඤ්ඤත්තිපථා අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා න සංකීයන්ති න සංකීයිස්සන්ති අප්පතිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. කතමෙ තයො. යං භික්ඛවෙ රූපං අතීතං නිරුද්ධං විපරිණතං අහොසීති තස්ස සංඛා අහොසීති තස්ස සමඤ්ඤා අහොසීති තස්ස පඤ්ඤත්ති න තස්ස සංඛා අත්ථීති න තස්ස සංඛා භවිස්සතීති[7].**

ඔය විදියට සූත්‍රය යන්නෙ. අපි දැනට මේ ප්‍රකාශකළ ටික පරිවර්තනය කරන්න බලමු. 'තයො මෙ භික්ඛවෙ නිරුත්තිපථා අධිවචනපථා පඤ්ඤත්තිපථා 'මහණෙනි' මේ නිරුක්ති මාර්ග තුනක්, අධිවචන මාර්ග තුනක්, ප්‍රඥප්ති මාර්ග තුනක් තිබෙනව. 'ඒවා ගැන විශේෂයෙන් කියල තියෙන්නෙ මොකක්ද? 'අසංකිණ්ණා අසංකිණ්ණපුබ්බා න සංකීයන්ති න සංකීයිස්සන්ති අප්පතිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි' නුවණැති - මහණ බමුණන් කවදාවත් මිශ්‍ර කරන්නෙ නැති, කවලම් කරන්නෙ නැති, අතීතයේ කවලම් කර නොගත්, දැන් කවලම් කර නොගන්නා, අනාගතයේත් කවලම් කරගන්නෙ නැති, ඒ වගේම පිළිකුල් වශයෙන් ඉවත නොදැමිය යුතු විදියේ ව්‍යවහාර මාර්ග තුනක් තිබෙනව. මොනවද මේ ව්‍යවහාර මාර්ග තුන? 'යං භික්ඛවෙ රූපං අතීතං නිරුද්ධං විපරිණතං අහොසීති තස්ස සංඛා අහොසීති තස්ස සමඤ්ඤා අහොසීති තස්ස පඤ්ඤත්ති-'මහණෙනි යම් රූපයක් ඉක්ම ගියේද, නිරුද්ධ වුයේද, වෙනස් වුයේද, එය ගණන් ගනු ලැබෙන්නෙ 'අහොසි' කියන ක්‍රියාපදයෙන්. 'විය'. අහොසි කියල පාළියෙන් කියන්නෙ 'විය' කියන එකයි. 'අහොසීති' තස්ස සංඛා අහොසීති තස්ස සමඤ්ඤා අහොසීති තස්ස පඤ්ඤත්ති න තස්ස සංඛා අත්ථීති න තස්ස සංඛා භවිස්සතීති'-එයට ව්‍යවහාර කරන්නෙ නැහැ 'අත්ථි' කියල එයට ව්‍යවහාර කරන්නෙ නැහැ 'භවිස්සති' කියල. ඒ කියන්නෙ යම් රූපයක් ඉක්ම ගියාද, ඊට දෙන ව්‍යවහාරය 'අහොසි' කියන එකයි ඉක්ම ගියා කියල කියනව මිසක් 'ඒක තියෙනව' කියල කියන්නෙ නැහැ. 'ඒක වන්නේය' කියල කියන්නෙ නැහැ.

මේ කියන්නෙ කාලත්‍රය පටලවා නොගත යුතු බවයි. මේ විදියට දිගටම මේ සූත්‍රය යනව. ඒ අතීත වූ රූපයට අතීත ක්‍රියාපදයයි යොදන්නෙ. අතීත දෙයක් තියෙනව කියල හිතාගන්නෙ නැහැ. අනාගත දෙය තියෙනව කියල හිතාගන්නෙත් නැහැ ගියදේ ගියා. තිබුන දේ තිබුන. තිබෙන දේ තිබෙනව. බොහෝවිට සිදුවන දෙයක් තමයි, වර්තමාන අර්ථයෙන් ගන්නව අනාගත දේත්. අතීත දේත් වර්තමාන අර්ථයෙන් ගන්නව. මේකයි ලෝකයාට තියෙන ලොකුම පටලැවිල්ල. ඒක නිසා තමයි අර නුවණැති ශ්‍රමණ බ්‍රාහ්මණයින් මේවා කවලම් කර ගන්නෙ නැත්තෙ. අතීතය පිළිබඳව ඒ විදියට කිව්ව. වර්තමානය පිළිබඳවත් ඒ විදියට ප්‍රකාශ කරනව. රූප වේදනාදී පඤ්චස්කන්ධය ගැනම කියැවෙනව. යම් රූපයක් හෝ වේදනාවක් හෝ සඤ්ඤාවක් හෝ අතීත නම් ඊට අහොසි කියන ක්‍රියාපදය යොදන්නෙ. 'අත්‍ථි' 'භවිස්සති' ආදියක් යොදන්නෙ නැහැ. ඒ වගේම යම් රූපවේදනා ආදියක් දැන් තිබෙනවද වර්තමාන වශයෙන් තිබෙනවද - පච්චුප්පන්න වශයෙන් - ඊට තිබුනයි කියල ප්‍රකාශ කරන්නෙ නැහැ. අනාගතයෙ වෙනවයි කියල ප්‍රකාශකරන්නෙ නැහැ. ඔයි විදියට මෙන්න මේ කාලත්‍රය පිළිබඳ ව්‍යවහාර විධි නිරවුල්ව, කවලම් කර නොගෙන පාවිච්චි කිරීම පිළිබඳවයි මේ නිරුත්ති පථ සූත්‍රයෙ සඳහන් වෙන්නෙ. මෙතෙනදි අපට පෙනෙනව මේ 'සංඛා' කියන වචනය කොයිතරම් දුරට යෙදිල තියෙනවද කියල. මේ සූත්‍රය පුරාම 'සංඛා' සංඛ්‍යා 'ගිණීම' කියන අර්ථයෙන් යෙදිල තියෙනව. මේ වචන තුන ගැන අපි තව දුරටත් කල්පනා කරල බලමු. සංඛා සමඤ්ඤ පඤ්ඤත්ති කියන එක. මෙතන විශේෂයෙන් අධිවචන පඤ්ඤත්ති නිරුත්ති කියලත් යොදල තියෙනව. ඊළඟට සංඛා සමඤ්ඤා පඤ්ඤත්ති. මේ වචන ඔක්කොම එක පවුලෙ අය වගේ. බොහොම එකිනෙකට සමානයි. ලෝක ව්‍යවහාර පිළිබඳ ප්‍රශ්නයට අදාළ දෙයක්. භාෂාව පිළිබඳ, භාෂා ව්‍යවහාරය පිළිබඳ, ප්‍රඥප්තිය පිළිබඳ, ප්‍රශ්නයට මේ පපඤ්චසඤ්ඤසංඛා කියන පදය ළං වන බව අපට මේ අනුව හිතාගන්න පුළුවනි. ප්‍රපංච සංඥවෙන් ඇති කරගන්නා ගිණීම්.

මේ 'සංඛා' කියන වචනය ගැන අපි විශේෂයෙන් කල්පනාකරල බැලුවොත් ඇත්තවශයෙන්ම භාෂාව්‍යවහාරයේදී 'සංඛා' කියන්නෙ ගණන් ගනු ලැබීමයි. සමහරවිට අකුරටත් වැඩිය ප්‍රාථමික සවරූපයක් දරනව ඉලක්කම භාෂාව්‍යවහාරය ගැන කල්පනාකරල බලන කොට. සංඥාව කියල කියන්නෙ යම්කිසි දෙයක් පිළිබඳව නිත්‍යවශයෙන් එක්තරා නිමිත්තක් ගැනීමයි. මේ සංඥවෙ ලක්ෂණයක් තමයි නිමිති ගැනීම. නිමිති ගැනීම් මගින් තමයි කෙනෙක් හඳුනාගන්නෙ. රූපසඤ්ඤා සද්දසඤ්ඤ ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ආදී වශයෙන් සංඥ වලින් කෙරෙන්නෙ නිමිති ගැනීමක්. අපි දන්නව කැලයක් මැදින් පිරිසක් යනවනම් යම්කිසි ගමනක් යාමට, ආපසු ඒමට මග සොයා ගැනීමට පොරවක් අරගෙන අර දෙපස ගස්වල හොඳට පෙනෙන සළකුණක් යාදනවා. ඔන්න

ඔය විදියෙ දෙයක් තමයි මේ සංඥ ගැනීමත්. අඳුරේ අන්ධයෙකුගේ අතපතගෑමක් වගේ කියල අපි සඳහන් කළා. ඒ වගේ මේ සිතිවිලිවල තියනව සවභාවයක් අර වේදනාව දැනුනට පස්සේ සංඥවක් ගන්නව. ඉතින් ඒක රූප සඤ්ඤවක් වෙනව. සද්ද සඤ්ඤවක් වෙනව. මේ සංඥවත් එක්කම බැඳිල තියෙනව නිත්‍ය සංඥව. සංඥව කියන්නෙම කොටින්ම නිත්‍ය සංඥවක්. නිත්‍ය බවක්, ගොනුකර ගැනීමක්, මේ සංඥව පිළිබඳව තියෙනව. ඒ මොකද, ආයිත් එනකොට අඳුනගන්න විදියට ඒක නොවෙනස්ව තියෙන්නෙ ඕන. සංඥවම ඒ තරම් මිරිඟු සවභාවයක් ගන්නෙත් ඔය ප්‍රශ්නය නිසයි. සඤ්ඤවෙ නිමිති ගැනීම් සවභාවය තියෙනව. ඇත්ත වශයෙන් සඤ්ඤ කියල කියන්නෙත් - නිමිත්ත, සංකේතය, සළකුණ, කියන ඔය අදහස්මයි සඤ්ඤ කියන වචනයෙ තියෙන්නෙ. එතකොට, ඒ සඤ්ඤවෙන් කරන්නෙ හඳුනාගැනීමයි. හඳුනා ගත්තට මදි. මේක ලෝකයා අතර, සමාජයේ, හඳුන්වා දෙන්නත් සිද්ධ වෙනව. හඳුනාගැනීමත්, හඳුන්වාදීමත් කියල දෙකක් තියෙනව. අන්න ඒක තමයි අර 'සඤ්ඤ' කියන එක ළඟට තියෙන්නෙ - 'සංඛා' - හැඳින්වීම, ව්‍යවහාරකිරීම. ඒ දෙක එකටයි යන්නෙ. එතකොට සංඛා - සමඤ්ඤ පඤ්ඤත්ති වලින් අපි සිංහලට ගත්තොත් 'සංඛා' කියන එකට ගන්න පුළුවන් 'ගිණීම' කියල. ගණන් ගැනීම, ගොණුකර ගැනීම, එහෙම නැත්නම් එකතුකර දීම කියන අදහසයි. දැන් සංඛ්‍යාව කියල කියන්නෙ පහේගොඩවල් හයේ ගොඩවල් කියල කියන්නෙ - එකතු කරල ගන්නව. එකින් එක වෙන් කරල ගන්නෙ නැතිව. ඒක ලෙහෙසියි. අපේ වැඩවලට පහසුවීම සඳහා. ව්‍යවහාර වැඩවලට, පොදුවැඩවලට පහසුයි, මේ සංඛ්‍යාවක් තිබීම. ඒක නිසා භාෂාවෙ මූලිකම ප්‍රාථමිකම ලකුණ තමයි සංඛ්‍යාව - ඉලක්කම. එතකොට සමඤ්ඤ කියල කියන්නෙ එකතු වෙලා හැඳින්වීම්. 'අප මේකට මෙහෙම කියමු' කියල පොදු සම්මුතියක් ඇති කරගන්නව. එක එක්කෙනා එක එක විදියට කියන්න ගියොත් බැහැ අදහස් හුවමාරු කරගන්න. 'පඤ්ඤත්ති' කියල කියන්නෙ ඒ විදියට නමක් ආරූඪකිරීම. එක්කො අඩබෙර ගහල හරි, වෙනක්‍රමයකින් හරි, 'මෙතැන් සිට මෙයට මෙසේ ව්‍යවහාර කළ යුතුයි' කියල පනවනව. ඔන්න ඔය විදියට සංඛා සමඤ්ඤ පඤ්ඤත්ති බොහෝ දුරට එකිනෙකට සමාන අදහසක් ගෙන දෙනව. එයිනුත් අර සංඛා කියන එක ඉතාම ප්‍රාථමික සවරූපයක් දරනව - ගොනුකරදීම. මේ ගොනුකිරීම, මේ එකතුකරකීම, ඉලක්කම් වලට පමණක් නොවෙයි භාෂාවටත් පොදු දෙයක් බව බොහෝ සූත්‍රවලින් පෙනීයනව සඞ්ඛං ගච්ඡති' කියන පාඨයෙන්. 'සඞ්ඛං ගච්ඡති' කියල කියන්නෙ ව්‍යවහාරයට යෙයි කියන අදහසටයි. ගණන්ගනු ලැබේ කියන එකයි. හොඳ නිදර්ශනයක් අපට සොයා ගන්නට පුළුවනි. මහාහත්ථිපදොපම සූත්‍රයෙන්. ශාරිපුත්‍ර මහාසවාමීන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට කරන දේශනාවක තියෙනව මෙන්න මෙහෙම -

**සෙය්‍යථාපි ආවුසො කට්ඨඤ්ච පටිච්ච වල්ලිඤ්ච පටිච්ච තිණඤ්ච පටිච්ච මත්තිකඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො අගාරන්තෙව සංඛං ගච්ඡති එවමෙව ඛො ආවුසො අට්ඨිඤ්ච පටිච්ච නහාරුඤ්ච පටිච්ච මංසඤ්ච පටිච්ච චම්මඤ්ච පටිච්ච ආකාසො පරිවාරිතො රූපන්තෙව සංඛං ගච්ඡති**[8]

'යම් සේ' ඇවැත්නි, ලීද, වැල්ද, තණකොළද මැටිද, නිසා, - ඒවා උපකාරකරගෙන ඒවා පිහිටකරගෙන - අවකාශයේ යම්කිසි කොටසක් අවුරනු ලැබුයේ එයට 'ගෙය' කියල ව්‍යවහාරය වේද, - අගාර කියල කියන්නෙ 'ගෙය' - ගෙය කියල නමක් වැටෙනව අරව ටික එකතු කරල එක්තරා රටාවකට, එක්තරා සැලැස්මකට, හැදුවාම. අන්න ඒ විදියටම ඇටත් නහරත් සමත් මසුත් එකතු කරල- ඒ විදියෙ උපකරණ ටික එකතුකරල- එක විදියකට තැබුවාම ඕකට 'රූප'කියල කියනව. ඉතින් මෙයින් අපට පෙනෙනව 'අගාර' කියල කියන ගෙයත් ඒ වගේම රූපයත් පඤ්ඤත්ති හැටියටමයි සැරියුත් ස්වාමීන්වහන්සේ මෙතන මේ දක්වල තියෙන්නෙ. ගෙය කියල කිව්වත් එක්තරා විදියක ප්‍රඥප්තියක්. අන්න එතකොට පඤ්ඤත්ති අර්ථයෙන් මේ සංඛා කියන එක එතන යෙදිල තියෙනව. අගාරන්තෙව සංඛං ගච්ඡති.

අපි තවත් නිදර්ශනයක් ගනිමු, බුදුපියාණන්වහන්සේගේම වචන වලින්, ඒ නිදර්ශනය ඉතාමත්ම වැදගත් වෙනව, භාෂාව, ව්‍යාකරණය, තර්කය, පිළිබඳව. මේ බෞද්ධ දර්ශනයෙ තිබෙන ඉතාම ගැඹුරු අංශයක්. ඒක ඇත්ත වශයෙන් පපඤ්ච ශබ්දයට හුඟක්ම කිට්ටුයි. පපඤ්ච පදය තේරුම්කර ගැනීමට ඉතාමත්ම උපකාරවන දෙයක්. දීඝනිකායෙ පොට්ඨපාද සූත්‍රයේ ඒක එන්නෙ. එතැනදි බුදුපියාණන්වහන්සේ චිත්ත හත්ථිසාරිපුත්ත නමැති පරිබ්‍රාජකය අමතලයි මේ ප්‍රකාශ කරන්නෙ.

**සෙය්‍යථාපි චිත්ත, ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං නවනීතම්හා සප්පි සප්පිම්හා සප්පිමණ්ඩො. යස්මිං සමයෙ ඛීරං හොති නෙව තස්මිං සමයෙ දධීති සංඛං ගච්ඡති න නවනීතන්ති සංඛං ගච්ඡති න සප්පීති සංඛං ගච්ඡති න සප්පිමණ්ඩොති සංඛං ගච්ඡති ඛීරං ත්වෙව තස්මිං සමයෙ සංඛං ගච්ඡති**[9]

අපි මේ සූත්‍රය කොටස් තුනකට බෙදලයි තේරුම් කරන්න බලන්නෙ. පළමුවෙන්ම දෙන්නෙ මේ උපමාවයි. බුදුපියාණන්වහන්සේ පළමුවෙන්ම ඉදිරිපත් කරනව උපමාව. චිත්ත කියල කියන්නෙ සිත නොවෙයි අර පුද්ගලයගෙ නමයි. 'චිත්ත, යම්සේ එළදෙනගෙන් කිරිත්, කිරෙන් දී කිරිත්, දීකිරෙන් වෙඩරුත්, වෙඩරුවෙන් ගිතෙලුත්, ගිතෙලින් ගිතෙල් මණ්ඩයත් ලැබෙයි ද , යම් අවස්ථාවක කිරි හැටියට තියෙනවද ඒ අවස්ථාවට දී කිරි කියල කියන්නෙ නැහැ. වෙඩරු කියල කියන්නෙ නෑ. ගිතෙල් කියල කියන්නෙ නෑ. ගිතෙල් මණ්ඩය කියල කියන්නෙ නෑ. ඛීරංත්වෙව තස්මිං සමයෙ සංඛං ගච්ඡති-එය ගණන් ගනු ලබන්නේ, එයට දෙන ව්‍යවහාරය,'කිරි'

කියලමයි. ඒවගේම ඒ උපමාව දිගටම යනව. ඊළඟට දීකිරි ගැන කියනව. යම්කිසි අවස්ථාවක දීකිරි හැටියට තියෙනවනම් ඊට වෙඬරු කියල කියන්නෙ නැහැ. ගිතෙල් කියල කියන්නෙ නැහැ. ගිතෙල් මණ්ඩය කියල කියන්නෙ නැහැ. ඊට කියන්නෙ දී කිරි කියල. ඔන්න ඔය විදියට ඒක 'සංඛා'. ඔන්න එතකොට උපමාවයි අපි දුන්නෙ ඉස්සෙල්ල. ඒ උපමාවෙමත් පේනව එක්තරා ගැඹුරක්. මෙතන මේ කියන්නෙ අපි කවුරුත් දන්න කිරි දීකිරි ගැන තමයි. නමුත් යම්කිසි ගැඹුරු දෙයක් මෙතන ප්‍රකාශ කරන්නෙ, බුදුපියාණන්වහන්සේ. ඊළඟට ඔන්න උපමේය එනව -

**එවමෙව බො චිත්ත යස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති නෙව තස්මිං සමයෙ මනොමයො අත්තපටිලාභොති සංඛං ගච්ඡති න අරූපො අත්තපටිලාභොති සංඛං ගච්ඡති ඔළාරිකො අත්තපටිලාභොත්වෙව තස්මිං සමයෙ සංඛං ගච්ඡති**

එසේම චිත්ත, යම් අවස්ථාවක ඕළාරික ආත්ම ප්‍රතිලාභයවේද - මේ කියන්නෙ ඕළාරික කියල කියන්නෙ රළු ගොරෝසු කියන අදහසයි- මෙතන මේ කියන්නෙ කාමලොක, රූපලොක අරූපලොක, එහෙමනැත්නම් කාමභව, රූපභව අරූපභව වශයෙන් දක්වන අවසථා පිළිබඳවයි. මුල් එක නම් මේ සාමාන්‍ය මනුෂ්‍ය ශරීරය පිළිබඳ පඤ්චකාම සම්පත්තියෙන් යුතු රළු අවසථාවයි. 'කබලිංකාරාහාර භක්ඛො, ආදී වශයෙන් දක්වනව රළු ආහාර වලින් යැපෙන්නාවූ ආත්ම ප්‍රතිලාභය. මේ ආත්ම තත්ත්වය ආත්මය කියලම නොවෙයි මෙතන ප්‍රකාශකරන්නෙ, ආත්ම ප්‍රතිලාභයක් එක්තරා තත්ත්වයක් කියන එකයි. මේ අවස්ථාවක කෙනෙක් අර කාමභවතත්ත්වයේ සිටිනවනම්, ඒ ආත්මප්‍රතිලාභය ඒ පුද්ගලයට තියෙනවනම්, ඒ අවස්ථාවෙ ඊට ව්‍යවහාර කරන්නෙ නැහැ මනෝමය ආත්මප්‍රතිලාභය කියල. ඔහුගේ ඇතුළෙ මනොමය ආත්ම ප්‍රතිලාභයක් හැංගිල තියෙනව කියල ප්‍රකාශකරන්නෙ නැහැ. ඒ වගේම අරූප ආත්මතත්ත්වයක් ඔහු තුළ හැංගිල තියෙනව කියල කියන්නෙ නැහැ. ඒ අවස්ථාවෙ ප්‍රකාශකරන්නෙ ඒ තැනැත්තට තියෙන්නෙ ඒ ඕළාරික ආත්මප්‍රතිලාභයක්ය කියලයි. ඊළඟට කියනව මනොමය ආත්ම ප්‍රතිලාභයක් ගැන, ඒ අර රූප ධ්‍යාන තත්ත්වය ලබා ගැනීම. මේ ඒ කාලෙ හිටිය ආත්මවාදය ගිලගත්ත තවුසන්ට උන පටලැවිල්ලක් - එකිනෙකක් ඇතුළෙ තියෙන කොපු පහක් වගේ මේ ආත්මය ගැන කල්පනා කළේ භාරතීය දාර්ශනිකයින්. පංචකෝෂ මතය කියල එකක් තියෙනව තෛත්තිරිය උපනිෂද් ග්‍රන්ථයේ. ඒකෙ මුල් අවස්ථාවක් බුදුරජාණන්වහන්සේ මෙතන දක්වන්නෙ ඕළාරික ආත්ම ප්‍රතිලාභ මනොමය ආත්ම ප්‍රතිලාභ, අරූප ආත්ම ප්‍රතිලාභ, කියල ධ්‍යාන ලාභී පුද්ගලයින් පිළිබඳව සඳහන් වෙනව. මුල්ම එක සාමාන්‍ය කාමලෝකයේ භව තත්ත්වය. ඊළඟට රූප. ඊළඟට අරූප.

මේවා උපනිෂද් දර්ශනයෙ දැක්වෙන්නෙ අන්නමය , ප්‍රාණමය, සංඥමය විඥනමය, ආනන්දමය, කියල, කොපු පහකින් යුක්ත ආත්මයක් හැටියට. මෙතන තියෙන්නෙ එයින් තුනයි. පළමුවැනි එක ආහාරයෙන් යැපෙන අන්නමය ආත්මයට සමානයි. ඊළඟ එක මනොමය ආත්මය. මේක සංඥමය හැටියට උපනිෂද්වල දක්වනව. ඊළඟට අරූප ආත්මප්‍රතිලාභය. මේක තේරුම්ගන්න තියෙන්නෙ කිරි උපමාව මතක තියාගෙනයි. යම්කෙනෙක් ධ්‍යාන අවස්ථාවකට පත්උනානම්, එහෙම නැතිනම් අපි හිතමු මනොමය ආත්මප්‍රතිලාභයක් ලබාගත්ත කියල. රූප ධ්‍යානය ලබාගත්ත කියල. ඒ පුද්ගලය හිතන්න නරකයි මගේ ආත්මයේ අරූප තත්ත්වයක් සෑහවිලා තියෙනව කියල. ඒ වගේම කලින් තිබුන ඕළාරික තත්ත්වයක් සෑහවිලා තියෙනව කියල. ඒවා එක් එක් අවස්ථා පමණයි. අර කිරි, දී කිරි වගේ. අන්න ඒකයි බුදුපියාණන් වහන්සේ මෙතෙන්දි අර පරිබ්‍රාජකයට දක්වන්නෙ. එහෙම කියල ඔන්න ඊළඟට අපිට තුන්වෙනි කොටස හැටියට දක්වන්න තිබෙන්නෙ බුදුපියාණන්වහන්සේ දෙන නිගමනය. ඒක ඉතාමත්ම වැදගත්.

**ඉමා ඛො චිත්ත ලොකසමඤ්ඤා. ලොකනිරුත්තියො ලොකවොහාරා ලොකපඤ්ඤත්තියො යාහි තථාගතො වොහරති අපරාමසං.**

'චිත්ත මේ ඔක්කොම 'ලොක සමඤ්ඤා' - ලෝකයා එකමුතුවෙලා ඇතිකරගත්තු හැඳින්වීම් ගොඩක් පමණයි. 'ලොක නිරුත්තියො' - ලෝකයා ඇතිකරගත්තු නිරුත්ති. නිරුත්ති කියල කියන්නෙ යමක් තේරුම් කරන විධි 'ලොකවොහාරා ලෝකයා වහරන විධි' ව්‍යවහාර කරන විධි, 'ලොකපඤ්ඤත්තියො' - ලෝකයා පනවා ගෙන තිබෙන සංකල්ප ප්‍රඥප්ති ගොඩවල්. 'යාහි තථාගතො වොහරති' ඒවායින් තථාගතයන් වහන්සේ ව්‍යවහාර කරනව. අවසාන වචනය තමයි ඔක්කොටම වඩා වැදගත් 'අපරාමසං' - නමුත් පරාමර්ශනයක් නැහැ. දැඩිව අල්වාගැනීමක් නැහැ. පොඩි දරුවන් ඉන්න ගෙදරක පොඩිදරුවන්ගෙ බාසාවෙන් මවුපියන් කතාකරන්න වගේ බුදුපියාණන්වහන්සේ මේ මුළු මහත් භාෂා ව්‍යවහාරයම යොදන්නෙ. ලෝකයා කෙලෙස් අදහස් පිළිබඳව ගනුදෙනු කරන්න යොදාගත්තු භාෂාවක් මගිනුයි බුදුපියාණන්වහන්සේ මේ පටිසොතගාමී ධර්මය ඉදිරිපත් කරන්නෙ. අන්න ඒක නිසාම වෙන්න ඕන බුදුපියාණන්වහන්සේ මුලදි මේ ධර්මය දේශනාකරන්න පවා මන්දෝත්සාහී උනෙ. කොහොමද මේ වගේ ධර්මයක් දේශනාකරන්නෙ මේ ලෝකයාගේ වචනවලින්, ලෝකයාගේ ව්‍යාකරණයෙන්, ලෝකයාගේ තර්කයෙන්, කියල.

එතකොට මෙයින් අපට පෙනෙනව, මෙන්න මේ පොට්ඨපාද සූත්‍රය ඉතාම වැදගත්. මෙතනින් පෙන්නුම් කරන්නෙ මොකක්ද? දැන් සාමාන්‍ය ලෝකයා යම්කිසි විදියකින් හිතාගත්තොත් අර එළදෙනගෙන් දොවා ගත්තු කිරිවලම ගිතෙල් අඩංගු වෙලා තියෙනව කියල, සමහරවිට තර්ක කරන්න පුළුවන් ඇයි

ගිතෙල් වෙන්නෙ කිරිනේ. කිරි ගිතෙල් වෙනවනම් කිරිවල ගිතෙල් තියෙන්න ඕන. ඊළඟට ඒක ගිතෙල් උනාට පස්සෙ කෙනෙකුට හිතෙන්න පුළුවන් කිරිවලින් මේක ගිතෙල් උනෙ. ඒක නිසා මේ ගිතෙල් ඇතුළේ කිරි තියෙන්න ඕන සැඟවිලා. මේක සාමාන්‍යයෙන් කියනතොට කෙනෙකුට විහිළුවක් හැටියට හිතෙන්න පුළුවනි. නමුත් මහාදාර්ශනිකයන්ට මේක පෙනුනෙ නැහැ. ඒක නිසා තමයි බුදුපියාණන් වහන්සේ කිරි උපමාවෙන් දීල මේ වැරද්ද පෙන්නුම් කරන්නෙ. ආත්මවාදයෙ තියෙන්නෙ මෙන්න මේ රහසයි. 'අතීතයත් තිබෙනව. අනාගතයත් තිබෙනව, වර්තමානයට පමණයි බුදුපියාණන් වහන්සේ 'අත්ථි' කියල යොදන්නෙ. 'ඇත' කියල යොදන්නෙ. අතීතයට 'අහොසි' කියල කියන්න ඕන, අනාගතයට 'භවිස්සති' කියල කියන්න ඕන. අර නිරුත්තිපථ සූත්‍රයෙන් කිව්වෙත් මේ අදහසමයි. එහෙම නොකිය ගත්තොත් තමයි අර පටලැවිල්ල වෙන්නෙ. කිරි, දීකිරි, වෙඬරු, මේව එක්තරා සන්තතියක අවස්ථා පමණයි. ලෝකයා මේව පනවාගෙන, කඩුලු බැඳගෙන, කොටුකරගෙන, මේවා ප්‍රඥප්ති හැටියට ඉදිරිපත් කරගෙන තිබෙනව. හදාගෙන තිබෙනව. ඒ අයම හදාගත්තු මේ පටලැවිල්ල ඊළඟට තමන්ටම බලපානව. දාර්ශනිකයින් හේතුඵලවාදය අනුව තර්කකරන්න ගිහිල්ල මේ වචන දෙක එහෙමපිටින්ම එකිනෙකට සම්බන්ධ නැති දේවල් හැටියට කල්පනාකරගෙනයි මේ හේතුඵල සම්බන්ධතාව විග්‍රහ කරන්න යන්නෙ. කිරි, දීකිරි වෙන නිසා එක්කො කිරි, දීකිරිත් එක්ක කොහෙත්ම සම්බන්ධයක් නැති දෙයක් වෙන්න ඕන. එහෙම නැත්නම් දීකිරි කිරි ඇතුළේ තියෙන්න ඕන. ඔය විදියට නොයෙකුත් තර්ක ඇතිකරගත්ත. මෙන්න මේ තර්ක න්‍යායයන් අපට පෙනෙනව භාරතීය දර්ශනවාදවල, මේ හේතුවත් ඵලයත් අතර සම්බන්ධතාව පිළිබඳව, නොයෙකුත් අන්තගාමී දෘෂ්ටි ඇති කරගත්ත.

'ආරම්භවාද' කියල එක්තරා දර්ශනක්‍රමයක මේ හේතුවත් ඵලයත් පිළිබඳව, ඵලය අමුතුවෙන්ම ඇතිඋන දෙයක් හැටියට දක්වනව, හේතුවට සම්බන්ධයක් නැතිව. ඊළඟට තවත් ඔය සත්කාර්යවාද, සත්කාරණවාද කියල ඔය විදියට නොයෙකුත් දර්ශන ඇතිඋනා මේ පොඩිකාරණය පටලවා ගැනීමෙන්. ඒ අය හිතාගත්ත, හේතුව තුළම ඵලය හැංගිලා තිබෙනව. ඒක හැංගිල තිබිල එළියට එනව. ඔය විදියට. ඊළඟට තවත් සමහරකෙනෙක් කල්පනා කළා. ඵලය බොරුයි, හේතුව විතරයි සත්‍ය. ඔයවිදියට නොයෙකුත් අන්තවාදී නිගමන ඇතිකරගත්තා, මෙන්න මේ සංකල්ප ප්‍රඥප්තිවල ලෝක ව්‍යවහාර බව අමතක කිරීම නිසා, තමන්ම ඇතිකරගත්තු ප්‍රඥප්ති වලින් අමාරුවෙ වැටීමක් මෙතන තියෙන්නෙ. දැන් මේ කාලත්‍රය පටලවා ගැනීමේ අවුලට - මේ දර්ශනිකයින්ට ඇතිවෙච්ච අවුලට - අපට නිදසුනක් දෙන්න පුළුවනි. ජනකථා, ළමාකථා, ආදියෙ මේ ගැඹුරු කාරණය ඉතාම ලිහිල්ව, ඉතාම සරල අන්දමින් ඉදිරිපත් කරල තියෙනව.

අර රත්තරන් බිත්තර දාන තාරාවිය ගැන කථාවක් තියෙනව. ඒක බටහිර සාහිත්‍යයේ වැඩිපුරම තියෙන්නෙ. එක්තරා තාරාවියක් දිනකට එකක් බැගින් රත්තරන් බිත්තර දැම්ම. තාරාවිය අයිති මනුෂ්‍යයා කල්පනාකළා ලෝභකම වැඩි නිසා එක දවසටම බඩ ඇතුළෙ තියන බිත්තර ටික ලබා ගන්න ඕන කියල තාරාවි මැරුව. බඩ පැලුව. කල්පනා කළා අනාගතයත් තියෙනව කියල. ඒ විදියේ පටලැවිල්ලක් මේ ආත්මවාදීන්ටත් සිද්ධ උනේ. එතකොට මේ දර්‍ශනක්‍ෂේත්‍රයේ මේ විදියේ සියුම් පටලැවිලි ඇති උනෙත් මේ පපඤ්චය නිසා. එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය ලෝකයාට වෙන ප්‍රපංචත් ඒ විදියයි.

අර පපඤ්චසඤ්ඤාසංඛාවලට යටවෙනව කියල කියන්නෙ අන්න ඒ නිසයි. පපඤ්ච සඤ්ඤාවෙන් ඇතිකරගන්න 'සංඛා' ගිණීම්, ගණන්ගනු ලැබීම් වලට යටවෙනව. භාරතීය කවියෙක් හඳඑළියෙ දිලිසෙන රතුකැටයක් දැකල බොහොම චමත්කාර ජනක හැඟීම් ඇතිකරගෙන බොහොම ආශාවෙන් කිට්ටු උනා. අපොයි බුලත් කෙළ පිඩක්. මේ විදියේ පටලැවිලි ගැන හාස්‍යජනක කථාන්තරත් අපට දක්නට ලැබෙනව, පාළිසාහිත්‍යයේ සිංහල සාහිත්‍යයේ පවා. දිගට කතන්දර කීමට නොවෙයි යන්තම් මතක් කර දීම පමණක් ප්‍රමාණවත්. ධර්‍මසාහිත්‍යයේ ඉතාමත් ප්‍රකට කථාවක් තමයි - ධම්මපදයේ 'දූරඞ්ගමං එකචරං අසරීරං ගුහාසයං', ආදී ගාථාවක් තියෙනව. මේ තනිව, දුරගමන් කරන, ශරීරයක් නැති, ස්වභාවය පිළිබඳව බුදුපියාණන් වහන්සේ දේශනා කරල තිබෙනව චිත්තවග්ගයෙ. සිතේ ස්වභාවයක්.

ඒකට තියෙන නිදාන කථාව භාගිනෙය්‍ය සංඝරක්ඛිත වත්‍ථුව[10] ඉතාම ප්‍රකට කථාවක්, යන්තමින් මතක් කිරීම සෑහෙනව. සංඝරක්ඛිත මහරහතන්වහන්සේගේ ගෝලයා වන භාගිනෙය්‍ය සංඝරක්ඛිත ස්වාමීන් වහන්සේ එකදවසක් ගුරුන්නාන්සේට පවන් සලමින් සිටින අතරෙ ඇතිකර ගත්තු ප්‍රපංචය කොයි තරම් දුරගියාද කිව්වොත් ගිහිවෙල, විවාහවෙලා, දරුවෙකු ඇතිව අතදරුවත් එක්ක රථයකින් ගුරුතුමා බලන්න එන අතරෙ භාර්‍යාවගේ ප්‍රමාද දෝෂයකින් දරුව වැටිල රථයට යටවුනා. ඉතින් භාර්‍යාවට කරන දඬුවම හැටියට ගැසුවෙ මහ රහතන්වහන්සේගේ හිසටයි. රහතන්වහන්සේට ආවර්ජනා කරල බලනකොට මේ කාරණය පෙනුන. මේ නිසා අර භික්‍ෂුව ලොකු විපිළිසර බවකට පත්වුනා. ඒ කථාව පාළිසාහිත්‍යයෙ. ඔය විදියේ කොතෙකුත් කථාන්තර තියෙනව. සංස්කෘත සාහිත්‍යයේ වළං වෙළෙන්දෙක්, ඒ වගේම ඇති කරගත්ත ප්‍රපංචයකින් වළං ටික බිඳල දැම්ම. සිංහල සාහිත්‍යයේ තියෙනව ළමා කථාවක් මුරුංගා ගහ කැපූ මිනිහ පිළිබඳව. බටහිර සාහිත්‍යයේ තියෙනව 'ආඩම්බර කිරි වෙළෙන්දි'. ඔය විදියේ නොයෙකුත් කථාන්තර තියෙනව එදිනෙදා ජීවිතයෙ වෙන ප්‍රපංච පිළිබඳව. අර කාලත්‍රය පටලවා ගැනීම නිසයි මේ. අනාගත වශයෙන් තවම නොවුන දෙයක් වූ හැටියට කල්පනා කරනව, තිබෙන දෙයක් හැටියට. මෙන්න මේ විදියට සංකල්පයේ

තියෙනව මහ පුදුම දෙයක්. අර නිත්‍ය සංඥාව අනුව ගිය මේ සංකල්පමාත්‍රයෙන් හුහක් දුරට ගිහිල්ල අන්තිමට ඒ පුද්ගලයා හැබෑ ජීවිතයෙන් ඉවත්වෙනව. ඉහවහා යාමකට, මහා මෝහනයකට පත්වෙනව. ඔන්න ඔය තත්ත්වයයි එතකොට 'පපඤ්චසඤ්ඤාසංඛා සමුදාචරණය කියල කියන්නේ. පපඤ්ච සඤ්ඤා සංඛාවන්ට යටවෙන්නෙ අන්න ඒ ආකාරයටයි. මේ 'සංඛා' කියන එක දැන් අපි තේරුම් කළ හැටියට අර කොට්ඨාස කියන අදහසට වඩා 'සංඛා' කියල ගත්තම මෙතන මේ ප්‍රඥප්ති, ගණන්ගනු ලැබීම් කියන අර්ථය සහේතුක හැටියට දක්වන්න පුළුවන්, වඩා ධර්මයට එකඟ හැටියට.

තථාගතයන්වහන්සේලා මේ පපඤ්චසංඛාවලින් විමුක්තයි. මක්නිසාද අර ලෝකනිරුත්ති ලෝකවොහාර ලෝක පඤ්ඤත්ති බව නිතරම තේරුම් අරගෙන බබාගේ ව්‍යවහාර හැටියට හිතාගෙනයි ඒවා පාවිච්චි කරන්නෙ. වැඩිහිටියන් බබාගේ ව්‍යවහාර පාවිච්චි කළාට ඒවායින් බැඳී සිටින්නෙ නැහැ. අන්න ඒවගේ බුදුපියාණන්වහන්සේලා, රහතන්වහන්සේල, ඒවා ලෝක නිරුක්ති බව අමතක කරන්නෙ නැහැ. මේව කොටස් කරල මේව විතරක් ප්‍රඥප්ති මේව විතරක් පරමාර්ථ කියල එහෙම ගැනීමකුත් නැහැ. මේ ඔක්කොම ප්‍රඥප්ති ගොඩවල් බව දන්නව. ඒක නිසා තමයි තථාගතයන් වහන්සේලා නිෂ්ප්‍රපංච. ලෝකයා ප්‍රපංචයේ බැඳිල සිටිනව. ධම්මපදේ හොඳ ගාථාවක් තියෙනව.

**ආකාසෙ පදං නත්ථි - සමණො නත්ථි බාහිරෙ**
**පපඤ්චාභිරතා පජා - නිප්පපඤ්චා තථාගතා[11]**

අහසෙහි පාරක් නැහැ. නියම ශ්‍රමණයින් මේ ශාසනයෙන් පිට නැහැ. ඒක සාමාන්‍ය කාරණා වශයෙන් ප්‍රකාශ කරල අවසාන පදවලිනුයි ප්‍රධාන දේ දෙන්නෙ. පපඤ්චාභිරතා පජා - නිප්පපඤ්චා තථාගතා - සාමාන්‍ය ප්‍රජාව ප්‍රපංචයෙහි ඇලිලයි සිටින්නෙ. තථාගතයන්වහන්සේලා නිෂ්ප්‍රපංචයි. අන්න ඒ නිසාම තමයි නිවන හඳුන්වන පද 33 අතරෙ 'නිප්පපඤ්ච' කියන එකත් නිවනට නමක්. 'දුක්ඛූපසම' කියල කියන්නා වගේ 'පපඤ්චවූපසම[12] කියන්නෙත් නිවන හඳුන්වන පදයක් බව දක්වල තියෙනව. 'පපඤ්චූපසම'- ප්‍රපංචයන් සංසඳවීම 'පපඤ්ච නිරොධ' කියලත් කියනව. ඔන්න ඔය විදියට මේ පපඤ්ච යන පදය ආශ්‍රය කරගෙන නිවන තත්ත්වය හඳුන්වපු සථාන බොහෝවිට අපට දකින්නට ලැබෙනව. ඒ වගේම තථාගතයන්වහන්සේලා අර 'පපඤ්ච සඤ්ඤා සංඛා' වලින් මිදිල. ලෝක ව්‍යවහාර පාවිච්චි කරනව, ප්‍රඥප්ති පාවිච්චි කරනව. නමුත් උන්වහන්සේලාට 'පපඤ්ච සඤ්ඤා සංඛා' වක් නැහැ. ඉස්සෙල්ල කලහවිවාද සූත්‍රයෙත් අපට හමුවුනා 'සඤ්ඤා නිදානා හි පපඤ්ච සංඛා' - කියල සඤ්ඤා හේතුකරගෙනයි පපඤ්චසංඛාවල් ඇතිවෙන්නෙ. තථාගතයන් වහන්සේල සංඥාවෙන් මිදිල, ප්‍රඥාව ලබාගෙනයි සිටින්නෙ. අන්න ඒක නිසා තමයි 'අර පපඤ්චසඤ්ඤාසංඛා තථාගතයන් වහන්සේලාට නැත්තෙ. සංඥාවට යටවුනු අඳුරේ අතපත

ගාන අයටයි මේ පපඤ්චසංඛාවල් ඇතිවන්නේ. රහතන් වහන්සේලාට, බුදුරජාණන් වහන්සේලාට, ප්‍රඥා ආලෝකය තිබෙන නිසා, සංඥාවෙන් මිදිල තියෙන නිසා, ලෝක ව්‍යවහාරය පාවිච්චි කළාට මොකද 'පපඤ්ච සඤ්ඤා සංඛාවල් නැහැ. ඒක නිසා තමයි උදාන පාළියේ චූලවග්ග කොටසේ සඳහන් වෙන්නෙ-

**'තෙන ඛො පන සමයෙන භගවා අත්තනො පපඤ්ච සඤ්ඤා සංඛා පහානං පච්චවෙක්ඛමානො නිසින්නො හොති[13] කියල**

ඒ අවස්ථාවේ භාග්‍යවතුන් වහන්සේ, තමන් වහන්සේගේ පපඤ්ච සඤ්ඤා සංඛා ප්‍රහානය කිරීම ගැන ප්‍රත්‍යවේක්ෂා කරමින් සිටියහ. විමුක්තිසුවය කියන එකයි. එතැන සඳහන් වෙනව වටිනා ගාථාවකුත්.

**යස්ස පපඤ්චා ඨිති ච නත්ථි - සන්දානං පළිඝංච වීතිවත්තො**
**තං තං නිත්තණ්හං මුනිං චරන්තං - නාවජානාති සදෙවකොපි ලොකො**

'යස්ස පපඤ්චා ඨිතී ච නත්ථි' - යමෙකුට ප්‍රපංචවීම් සහ, ඨිති කියල කියන්නෙ සිටගෙන සිටීම්, වාච්‍යාර්ථ වශයෙන් බැලුවොත්. පපඤ්ච කියල කියන්නෙ අපි කිව්වෙ, කොළඹට වටරවුම් පාරවලින් යන්න වගේ ඒ විදියෙ මහ රවුම් ගමනක්. එතකොට මෙතන යොදල තිබෙන වචන දෙකෙන් අර්ථය උද්දීපනය වෙනව. අර්ථය වඩාත් පැහැදිලි වෙනව 'පපඤ්ච ඨිති' කියන වචන දෙක එකට යෙදීම නිසා. 'යස්ස පපඤ්චා ඨිති ච නත්ථි' යමෙකුට ප්‍රපංච වීමක්වත් ඨිති - 'ඨිති' කියන වචනය නෙත්තිප්පකරණයෙ තෝරන්නෙ 'අනුසය'[14] කියල. එතකොට සිතේ තිබෙන රැඳීසිටීම් ස්වභාවය තමයි අනුසය කියල කියන්නෙ. පපඤ්ච කියල කියන්නෙ රවුම් ගැසීම, වටරවුම් යාම. ඒ වටරවුම් ගැහීමක්වත් අනුසය වශයෙන් ඨිතියක්වත් යමෙකුට නැද්ද, 'සන්දානං' කියන එකත් ඒ වගේම ධර්මානුකූල විශේෂ වචනයක්. සන්දාන කියල කියන දෘෂ්ටි නමැති මහ දම්වැලක් නැද්ද, 'පළිඝං' කියල කියන අවිද්‍යාව නමැති දොර අගුලත් ඉක්මවලද - තං නිත්තණ්හං මුනිං චරන්තං - තණ්හාව නැතිව හැසිරෙන්නාවූ ඒ මුනිවරයාව 'නාවජානාති සදෙවකොපි ලොකො' දෙවියන් සහිත ලෝකයා අවඥාවට පාත්‍රකරන්නෙ නැහැ - කියල ඔය විදියට ප්‍රකාශ කරනව.

ඉතින් ඒ වගේ අපට කොතෙකුත් සූත්‍ර දේශනාවලින් මේවාට නිදසුන් දක්වන්න පුළුවන්. හැමඑකක්ම දක්වනවාට නොවෙයි නමුත් සමහර විට වැදගත් උද්ධෘතපාඨ තිබෙනව. තවත් ඒ විදියෙ එකක් දක්වන්න පුළුවනි. මේ පපඤ්චයේ ස්වභාවය විශේෂයෙන් ප්‍රකාශකරන, ඒවා ගෙහසිත සිතිවිලිවලට සම්බන්ධ බව පෙන්නුම් කරන, හොඳ ගාථාවක් තියෙනව සංයුත්ත නිකායෙ සළායතන සංයුත්තයේ.

**'පපඤ්ච සඤ්ඤා ඉතරීතරා නරා - පපඤ්චයන්තා උපයන්ති සඤ්ඤිනො**
**මනොමයං ගෙහසිතංච සබ්බං - පනුජ්ජ නෙක්ඛම්මසිතං ඉරීයති'[15]**

'පපඤ්ච සඞ්ඛා ඉතරීතරා නරා - 'ඉතරීතරා නරා' කියන්නෙ සාමාන්‍ය ජනයා, ලාමක මනුෂ්‍යයින්, 'පපඤ්ච සඞ්ඛා' - ප්‍රපංච සංඥාව නිසා 'සඞ්ඛිනො' සංඥාවට වහල්වුවාහු. සංඥාවට නතුවුවාහු, පපඤ්චයන්තා උපයන්ති - ප්‍රපංච කරමින් ඒ අරමුණුවලට ළං වෙත්. අර රතුකැටය සොයාගන්නට බුලත් කෙළ පිඩට ළං වුන පුද්ගලයා වගේ ප්‍රපංච කරමින් අරමුණු වලට ළං වෙනව, අර සංඥාවට මුළා වෙලා. 'පපඤ්ච සඞ්ඛා ඉතරීතරා නරා පපඤ්චයන්තා උපයන්ති සඞ්ඛිනො - ඊළඟට ප්‍රකාශකරනව, 'මනොමයං ගෙහසිතංච සබ්බං - පනුජ්ජ නෙක්ඛම්මසිතං ඉරීයති. - ඊළඟ පද දෙකෙන් කියන්නෙ නුවණැති භික්ෂුවගේ ක්‍රියාකලාපයයි.

-'මනොමයං ගෙහසිතංච සබ්බං - පනුජ්ජ නෙක්ඛම්මසිතං ඉරීයති' නුවණැති භික්ෂුව - එතැන අධ්‍යාහාරයි - මනොමයවූ ගෙහසිත වූ ගෙහසිත සිතිවිලි කියන්නෙ ගෘහජීවිතය ආශ්‍රය කරගත්තු ඒවා, ගෘහ ජීවිතය ඇසුරුකළ සිතිවිලි, අර භාගිනෙය්‍ය සංඝරක්ඛිත වසතුවෙ කිව්ව වගේ. එතකොට ගෙහසිතවූ - 'මනොමය' - සිතින්ම උපදවාගත්තාවූ ඒ සියල්ලම අතහැරල - පනුජ්ජ, නෙක්ඛම්මසිතං ඉරීයති - නෙක්ඛම්මයට අදාළවූ දෙය පැත්තට ගමන් කරනව කියන එකයි. ඔන්න ඔය විදියට එතකොට පපඤ්ච කියන වචනයෙ එන්න එන්නම ගැඹුරු අංශයක් අපට පැහැදිලි වෙනව. ඊළඟට අපට කියන්න තියෙන්නෙ ලෝකයාගේ සාමාන්‍ය සවභාවය භාෂාව්‍යවහාරයත් ව්‍යාකරණයත් - මේ ලෝකයේ ව්‍යවහාරකරන ව්‍යාකරණයත් - ඒවාටම ගැතිවෙලා, ඒවට යටවෙලා යම් යම් දෘෂ්ටි ඇතිකරගැනීමයි. බුදුපියාණන්වහන්සේ පහළවන තාක් හිටිය දශීනිකයින් කළෙත් ඒකයි. අර කිරි - දීකිරි පටලව ගත්ත වගේ වැඩක්. එතකොට අන්න ඒක සිදුවන්නෙ එකක් සංඥා අනුශය වශයෙන් තිබීම නිසා, අනික, දෘෂ්ටි අල්ලා ගැනීම නිසා. මේ කාරණා දෙක තමයි අපි මධුපිණ්ඩික සූත්‍රයේදී පළමුවෙන්ම පෙන්නුම් කළ පාඨයෙන් සඳහන් වෙන්නෙ. ඒ කියන්නෙ. බුදුපියාණන්වහන්සේ දණ්ඩපාණිශාක්‍යයට දුන්න කෙටි පිළිතුර ඒක මහා ප්‍රහේලිකාවක් වුන නිසා තමයි දණ්ඩපාණි ශාක්‍යයා නළල රැළි ගන්වල දිවහොලවල, ඔලුව වනල ගියේ. ඒකෙ කියැවෙන හැටියට 'කිංවාදී සමණො කිමක්ඛායී, මොකක්ද ශ්‍රමණයාගෙ වාදය, මොකක්ද ශ්‍රමණය කියන්නෙ' ඇහුවහම බුදුපියාණන්වහන්සේ ප්‍රකාශ කළේ-යම්බඳු වාදයකින් ලෝකයේ කිසිවෙකු සමඟ නොගැටෙයිද වාද නොකරයිද අන්න එබඳු වාදයකුයි මගේ වාදය". යම්බඳු කියමනක් නිසා සංඥාවල් අනුශය වශයෙන් සිතේ ලැගගන්නෙ නැද්ද අන්න එබඳු දේකුයි මා කියන්නෙ'. මේක මහ පුදුම ගැටලුවක් වගේ. මෙතන කියැවෙන අදහස මොකක්ද? අපි අර 'සඞ්ඛා' 'පඤ්ඤා' කියන වචන දෙක දැනටමත් සඳහන් කරල තියෙන නිසා අපිට තව හොඳ නිදසුන් ගාථාවක් ගන්න පුළුවනි. සුත්ත නිපාතයේ මාගන්දිය සූත්‍රයේ අග එන වටිනා ගාථාවක් තියෙනව මේ සඞ්ඛාවත්

පඤ්ඤවත් අතර වෙනස පෙන්නුම් කරන -

**සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා - පඤ්ඤාවිමුත්තස්ස න සන්තිමොහා සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං- තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ**[16]

'සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා'- සංඥාවෙහි නොඇලුනු තැනැත්තාට ගැට නැත. 'පඤ්ඤා විමුත්තස්ස න සන්ති මොහා - ප්‍රඥාවෙන් විමුක්ත වූ තැනැත්තාට මෝහයෝ නැත. 'සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං, - නමුත් යම් කෙනෙක් සංඥාවත් දෘෂටියත් අල්ලා ගත්ත නම්, 'තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ' - ඒ අය ගැටෙමින් ලෝකයේ හැසිරෙනව අර අන්‍ය තීර්ථකයින් වගේ. ඒ වගේම සමහර අවස්ථාවල බුදුපියාණන් වහන්සේ ප්‍රකාශකරනව මහ පුදුම පරස්පරවිරෝධී වගේ කියමනක්.

ඛන්ධ සංයුත්තයේ 'පුප්ඵ' සූත්‍රයේ ප්‍රකාශකරනව 'නාහං භික්ඛවෙ ලොකෙන විවදාමි ලොකො ච මයා විවදති'[17] 'මහණෙනි මම ලෝකයත් එක්ක විවාද කරන්නෙ නැහැ. ලෝකයා මා එක්ක විවාද කරනව. බැලුවාම මේක මහ පුදුම කියමනක්. හරියට 'එයා මා එක්ක රණ්ඩු වෙනව මම එයා එක්ක රණ්ඩු වෙන්නෙ නැහැ, කිව්ව වගේ. නමුත් මෙතන තිබෙන ගැඹුර මොකක්ද? බුදුරජාණන්වහන්සේට කිසිම දෘෂ්ටියක් නැහැ. සමහරකෙනෙක් හිතන්න පුළුවන් බුදුරජාණන්වහන්සේටත් මොකක් හරි දෘෂ්ටියක් තියෙනව කියල. බුදුරජාණන්වහන්සේ පාවිච්චි කරන්නෙ බබාගෙ භාෂාවයි. බුදුරජාණන්වහන්සේට දෘෂටියක් ගන්න තැනක් නැහැ. මේක අපට පැහැදිලිවෙන හොඳ කථාන්තරයක් තියෙනව. ඇත්ත වශයෙන්ම බුදුපියාණන්වහන්සේ යම්තාක් වාද විවාද පැවැත්වුව නම් තීර්ථකයන් එක්ක, එයින් ඉතාමත්ම ප්‍රකට වාදයක් තමයි සච්චක එක්ක පැවැත්වූ වාදය. සච්චක නිගණ්ඨ පුත්‍රය එක්ක කළ මේ වාදය මජ්ඣිම නිකායේ චූල සච්චක සූත්‍රයෙ[18] සඳහන් වෙනව.

මහා උග්‍ර විදියට වාදය පැවැත්වුනා. වාදය අවසාන හරියේදි බුදුපියාණන්වහන්සේ මේ සච්චක නිගණ්ඨයට ප්‍රකාශකරනව - 'මට පෙනෙනව දැන් නුඹේ නළලින් ගැලූ ඩාදිය උතුරු සළුවත් විනිවිද ගිහිල්ල ඔන්න බිම වැගිරෙනව. ඒ උඹට වෙච්චදෙ. මේ බලන්න මා දිහා මගෙ නැහැ ඇඟේ ඩාදිය බිඳුවක්, කියල බුදුපියාණන් වහන්සේ රන්වන්වූ කය ඒ පිරිස මැද විවෘතකරල දැක්වුව කියල කියනව. 'ඉති භගවා තස්මිං පරිසතිං සුවණ්ණවණ්ණං කායං විවරි[19] බුදුපියාණන් වහන්සේ අර මහා වාදයක් කළාට මොකද එයින් කිසිම කැළඹීමක් නැතිව තමන්ගෙ රන්වන් කය පෙන්නුව. ඒ මක් නිසාද උන්වහන්සේට හිතේ දෘෂටිපරාමර්ශනයක් නැහැ. තණ්හාමානදිට්ඨි වශයෙන් ඒවායේ බැඳීමක් නැහැ. ඒක නිසා තමයි කොයිතරම් වාදයක මැදදි උනත් බුදුපියාණන්වහන්සේල එක විදියටම නිවිල. ඔන්න ඔය

විදියේ තත්ත්වයකුයි තියෙන්නෙ විවාද පිළිබඳව. ඒ වගේම තමයි සඤ්ඤාව පිළිබඳවත්. සංඥා අනුශය වශයෙන් නැහැ. බුදුපියාණන්වහන්සේලත් එහෙමයි. රහතන්වහන්සේලත් එහෙමයි. අපි බොහෝවිට කථාකළා නාමරූපය ගැන. නාමරූප පිළිබිඹුවක් හැටියට අපි ප්‍රකාශකළා බුදුපියාණන්වහන්සේලට මේ නාමරූපය නිසා ඇතිවන මුළාව නැහැ. මේක පිළිබිඹුවක් බව තේරුම් ගත්ත. ඒකටත් හොඳ ගාථාවක් අපට සොයාගන්න පුළුවනි සුත්ත නිපාතයෙ සභිය සූත්‍රයෙන්.

**අනුවිච්ච පපඤ්චං නාමරූපං - අජ්ඣත්තං බහිද්ධා ච රොගමූලං**
**සබ්බරොගමූලබන්ධනා පමුත්තො - අනුවිදිතො තාදි පවුච්චතෙ තථත්තා**[20]

'අනුවිච්ච පපඤ්ච නාමරූපං - මේ නාමරූපය පපඤ්චයක්, ලෝකයාගේ පපඤ්චයක්, අර මැණිකේ පිළිබිඹුව ගැන එහෙම අපි කථාකළා. ඒ දණ්ඩ උඩින් යන බල්ලාගේ පිළිබිඹුව ගැන කථාකළා. එයින් පෙනෙනව මේ නාමරූපය පිළිබඳ ලෝකය අල්ලගෙන සිටීම පපඤ්චයක්. අනුවිච්ච පපඤ්ච නාමරූපං - බුදුපියාණන්වහන්සේ ඒ පපඤ්ච නාමරූපය හරියට තේරුම් ගත්ත. 'අජ්ඣත්තං බහිද්ධාච රොගමූලං - පුද්ගලසන්තානයේත් බාහිර ලෝකයේත් යම්තාක් ව්‍යාකූල තත්ත්වයක් ගැටලු තත්ත්වයක්, අහිතකර තත්ත්වයක් තියෙනව නම්, ඒ හැම එකකටම - ඒ රෝගයට - මූලතමයි මේ පපඤ්ච නාමරූපය, සබ්බරොගමූලබන්ධනා පමුත්තො' ඒ සියලු රෝග මූලයන්ගේ බන්ධනයෙන් මිදුනාවූ ඒ තැනැත්තා අනුවිදිතො තාදී - 'අනුවිදිතයයි', 'තාදී' යයි හැඳින්වේ කියන එකයි ඒ ගාථාවෙන් කියැවෙන්නෙ.

එතකොට මේ සඤ්ඤා අනුසය ගැන විශේෂයෙන් යමක් කියනව නම් මෙතෙන්දි අපට ඉදිරියට ගන්න සිද්ධවෙනව මජ්ඣිම නිකායෙ පළමුවෙනිම සූත්‍රය. ඇත්ත වශයෙන් මේ කාලෙ මැදුම්සඟිය කියවනව නම් සාමාන්‍යයෙන් ලැබෙන උපදේශය මොකක්ද? පළමුවෙනි සූත්‍රය අතහැරල අනිත් ඒවා කියවන්න. ඒක තේරුම් ගන්න බැහැ. ඒක අහගෙන හිටිය හාමුදුරුවරුන්ටවත් තේරුනේ නැහැ. ඒක නිසා නොසතුටු උනා. මේක ගැඹුරු සූත්‍රයක්. මේක අවශ්‍ය නැහැ. ඒක හරියට අර හෝඩිය ඉගෙනගන්නෙ නැතිව අනිත් ඒව කියවන්න කියනව වගේ. මක්නිසාද මුළුමහත් බෞද්ධදර්ශනය පිළිබඳව ඉතාමත්ම වැදගත් මූලධර්මයක් මේ මජ්ඣිම නිකායෙ මූලපරියාස සූත්‍රයෙ ඇතුළත්වෙනව. දෘෂ්ටි පිළිබඳ ප්‍රශ්නයට දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රය යම් පමණ වැදගත්ද, එපමණටම සංඥා පිළිබඳ ප්‍රශ්නයට මජ්ඣිම නිකායේ මූලපරියාය සූත්‍රයත් වැදගත්. මේ මූලපරියාය සූත්‍රයෙන් පෙන්නුම් කරන්නෙ මොකක්ද? මූලපරියාය කියල කියන්නෙ සිතට අරමුණු වන හැමදෙයක්ම, හැම ධර්මාරම්මණයක්ම, එක්තරා ආකෘතියකට අනුවයි ලෝකයා තේරුම් ගන්නෙ. ලෝකයා ව්‍යවහාර කරන්නෙ. අන්න ඒ ආකෘතිය හඳුන්වාදීමයි මෙතෙන්දි කරන්නෙ. - 'සබ්බධම්ම

මූලපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි, කියලයි බුදුපියාණන්වහන්සේ දේශනාව ආරම්භ කරන්නෙ. 'මහණෙනි මම නුඹලාට සියලු ධර්මයන්ගේ - සියලු ධර්මයන් කියන්නෙ සිතට අරමුණු වන දේවල් කිව්වට වරදක් නැහැ. - හැම දේකම මූලපරියාය, මුල් ආකෘතිය, මුල්රටාව මම දේශනා කරනව.' එතකොට මේ සූත්‍රයෙ අඩංගුවන කාරණා අපට පුළුවන් කෙටියෙන් සමපිණ්ඩනය කරල දක්වන්න වෙලාව ඇති පරිදි. මේ සූත්‍රයේ සඳහන් වෙනව සංකල්ප 24ක්. සංකල්ප කිව්වත් කමක් නැහැ ප්‍රඥප්ති කිව්වත් කමක් නැහැ. ඒව නිදසුන් හැටියටයි බුදුපියාණන්වහන්සේ ඉදිරිපත් කරන්නෙ. ලෝකයේ ඇතිතාක් ප්‍රඥපති නොවෙයි. ඒවායේ නියෝජිතයින් හැටියට ඉදිරිපත්කරන ප්‍රඥපති, සංකල්ප 24 ක්. සංකල්ප 24කුත් ඊළඟට ඒ සංකල්ප පිළිබඳව පුද්ගලයින් හතර දෙනෙක් දක්වන ආකල්පත්. පුද්ගලයින් හතර දෙනෙකු ඒ සංකල්ප දිහා බලන ආකාරය. ඒවා ගැන හිතන ආකාරය. ඔන්න ඔය ටිකයි මේ මූලපරියාය සූත්‍රයේ දක්වන්නෙ. වෙන දෙයක් නොවෙයි. එතකොට මොනවද මේ සංකල්ප.

පඨවි ආපො තෙජො වායො භූතා දෙවා පජාපති බ්‍රහ්මා ආභස්සරා සුභකිණ්හා වෙහප්ඵලා අභිභූ ආකාසානඤ්චායතනං, විඤ්ඤාණඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං එකත්තං, නානත්තං සබ්බං නිබ්බානං[21] කියල ඔය විසිහතර. බැලුවහම මේව කීප පැත්තක්ම නියෝජනය කරන සංකල්ප 24ක්. ඔය එක් එක් සංකල්පය පිළිබඳව පුද්ගලයින් හතර දෙනෙකු බලන ආකාරයයි පෙන්නුම් කරන්නෙ. කවුද මේ පුද්ගලයින් හතර දෙනා? පළමුවන පුද්ගල කොට්ඨාශය 'අස්සුතවා පුථුජ්ජනො' තවදිගටම විශේෂණ පද තිබුනත් අපට කියන්න පුළුවනි' අස්සුතවා පුථුජ්ජනො' - අශ්‍රැතවත් පෘථග්ජනය. අරියානං අදස්සාවී අරියධම්මෙ අකොවිදෙ ආදී වශයෙන් දක්වනව ධර්මය නොඇසූ ධර්මයෙහි නොහසල අශ්‍රැතවත් පෘථග්ජනය පළමුවන කොට්ඨාසය. දෙවෙනි කොට්ඨාසය 'සෙඛො අප්පත්ත මානසො' - ශෛක්ෂ පුද්ගලය, නිවනට තාම පැමිණියෙ නැහැ. නමුත් සෝවාන්, ඒ කියන්නෙ සෝවාන් ඉඳල ඉහලට. තාම රහත් උනෙ නැහැ. ශෛක්ෂ පුද්ගලය කියන්නෙ හික්මෙන්නා. දෙවෙනි කොටස සෝවාන් ඉඳල ඉහලට ශෛක්ෂ පුද්ගලයා. තුන්වෙනි පුද්ගලය 'භික්ඛු අරහං ඛීණාසවො'-ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ. හතරවෙනි පුද්ගලය 'තථාගතො අරහං සම්මාසම්බුද්ධො' - තථාගතයන් වහන්සේ. එතකොට, 1අශ්‍රැතවත් පෘථග්ජනය 2ශෛක්ෂ පුද්ගලය 3රහතන් වහන්සේ 4බුදුපියාණන් වහන්සේ-නමුත් මෙතන දීල තියෙන ආකල්ප විග්‍රහය අනුව ඇත්ත වශයෙන් පුද්ගලයින් තුන් දෙනෙක් හැටියට කෙටිකරල දක්වන්න පුළුවන්. මක්නිසාද, රහතන් වහන්සේගේ ආකල්පයත්, තථාගතයන් වහන්සේගේ ආකල්පයත් එකක් හැටියටයි මෙතන පෙන්නුම් කරල තියෙන්නෙ. පුද්ගලයින් දෙකොටසක්

හැටියට දැක්වුවට මොකද ආකල්ප වශයෙන් බලනකොට, ප්‍රඥප්ති දිහා බලන ආකාරය අනුව සලකන කොට, එකවිදියටමයි බලන්නෙ. ඒක නිසා අපට පුළුවන් දැන් මේ හතර, තුනක් කරගන්න. දැන් අපි මේ එකින් එක සූත්‍රයේ දක්වල තියෙන ආකාරය බලමු.

මේ අශ්‍රැතවත් පෘථග්ජනයගේ ලෝක දර්ශනය කුමක්ද? කෙටියෙන් කියතොත් ලෝකදර්ශනය කුමක්ද? 'පඨවි' කියන වචනය ගැන බුදුපියාණන්වහන්සේ මෙන්න මේ විදියටයි ප්‍රකාශකරන්නෙ. අශ්‍රැතවත් පෘථග්ජනයා 'පඨවිං පඨවිතො සඤ්ජානාති පඨවිං පඨවිතො සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති පඨවියා මඤ්ඤති පඨවිතො මඤ්ඤති පඨවිං මෙති මඤ්ඤති පඨවිං අභිනන්දති, තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සාති වදාමි, ඒ පුද්ගලයා ගැන කියන්නෙ මේ ටිකයි. ඒ තැනැත්තා 'පඨවිං සඤ්ජානාති' - පෘථිවිය හඳුනගන්නව. ඊට වැඩිය ඉහල දෙයක් ඒ තැනැත්තට කරන්න බැරි නිසා හඳුනගන්නව. අර අඳුරෙ අතපත ගාන්න වගේ. පෘථිවිය පෘථිවිය හැටියට හඳුන ගන්නව. 'පඨවිං පඨවිතො සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති' අන්න ඊළඟට මඤ්ඤනා කියල දෙයක් ඇති කරගන්නව. මඤ්ඤනා කියන එකට අපි සිංහල වචනයක් කිට්ටුකරගන්නව නම්, සමහරවිට කියන්න පුළුවන් 'හිතාගැනීමක්' කියල. හිතාගැනීම කියන එක, අපි සාමාන්‍යයෙන් උපමාවක් දෙනකොටත් එක්තරා හිතාගැනීමක් කරනව.නමුත් මෙතන මේ කියන හිතාගැනීම මුළු හිතෙන්ම කරන හිතාගැනීමක්. මඤ්ඤනාවක්. ඒක තණ්හා මාන දිට්ඨි අනුව මුළාවෙන් කෙරෙන එක්තරා සිතිවිලි ක්‍රමයක්, එතකොට පඨවිං පඨවිතො සඤ්ඤත්වා' - පෘථිවිය පෘථිවිය හැටියට තමාගේ සංඥවෙන් තේරුම් අරගෙන පෘථිවිය පිළිබඳව මඤ්ඤනාවක් ඇතිකර ගන්නව. 'පඨවිං මඤ්ඤති' - පෘථිවිය පෘථිවිය යයි කියල මඤ්ඤනා කරනව. ඊළඟට 'පඨවියා මඤ්ඤති' - පඨවියා කියල කියන්නෙ පෘථිවියෙහි. ආධාර විභක්තියෙ - සත්තමී - 'පෘථිවියෙහි' කියලත් කල්පනාකරනව. ඊළඟට 'පඨවිතො මඤ්ඤති'- පෘථිවියෙන්' කියන ඒ සංකල්පයකුත් හදගන්නව. පඨවිං මෙති මඤ්ඤති' - 'පෘථිවිය මගේ ය' කියලත් කල්පනාකරනව. අන්තිමට කියනව' පඨවිං අභිනන්දති' පඨවි කියන සංකල්පය පිළිබඳව සතුටුවෙනව' 'තං කිස්ස හෙතු' - ඊට හේතුව කුමක්ද? 'අපරිඤ්ඤාතං - තස්සාති' - ඒ තැනැත්තා කාරණය හරියට පිරිසිඳ දැනගත්තෙ නැති නිසයි, එහෙම වෙන්නෙ. අපි මේ විදියට එකින් එක දක්වල විස්තර කරමු.

දෙවෙනි පුද්ගලය පිළිබඳව ඊළඟට කියනව-ඒ කියන්නෙ 'සෙඛ' ශෛක්‍ෂ පුද්ගලය, සෝවාන් ඉඳල ඉහලට. ඒ පුද්ගලය ගැන විශේෂයෙන් සඳහන් වෙනව මෙහෙම-'පඨවිං පඨවිතො අභිජානාති පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං මා මඤ්ඤී, පඨවියා මා මඤ්ඤී, පඨවිතො මා මඤ්ඤී, පඨවිං මෙති මා මඤ්ඤී පඨවිං මාභිනන්දි තං කිස්ස හෙතු පරිඤ්ඤෙය්‍යං තස්සා'ති වදාමි'

මේ ශෛක්ෂ පුද්ගලය පිළිබඳව සඳහන් වෙන්නෙ ඒ තැනැත්තා සක්කද වශයෙන් නොවෙයි දැනගන්නෙ' පඨවිං අභිජානාති' පෘථිවිය පෘථිවිය වශයෙන් විශිෂ්ට ඥානයෙන් දැනගෙන 'පඨවිං මා මඤ්ඤී' - එතැන අමුතුම ප්‍රයෝගයක් තියෙනව. 'මා මඤ්ඤි' කියන එක අටුවාවෙ තෝරන්නෙ එක්තරා විදියකට. නමුත් අපට එතෙන්දිත් යම්කිසි දෙයක් කියන්න සිද්ධවෙනව. අටුවාවෙ ඒක තෝරන්නෙ 'මඤ්ඤතී ති මඤ්ඤි - මඤ්ඤති කියන එකට දෙන වෙන වචනයක් හැටියටයි. නමුත් මෙතන මේ මා මඤ්ඤි' කියල කියන්නෙ ප්‍රතිෂේධාර්ථයෙන්. වැළැක්වීම් අර්ථයක් මෙතන තිබෙනව. 'මඤ්ඤනා කරන්න එපා' කියන එකක් මෙතනින් හැඟෙන්නෙ. එහෙම නැතිව මේක අටුවාවෙ කියන්න වගේ අධාල තත්ත්වයක් නොවෙයි. අටුවාවෙ කියන්නෙ මේ ශෛක්ෂ පුද්ගලය තුළ පඨවියේ තත්ත්වය පිළිබඳ විශිෂට ඥානයක් තිබෙන නිසා ඒ තැනැත්ත තුළ දෘෂටිමඤ්ඤනා නැත. තණ්හා මාන මඤ්ඤනා තිබෙන නිසා ඒ තැනැත්තා පිළිබඳව මඤ්ඤනා තිබෙනවයි කියා හෝ නැතෙයි කියා හෝ කියන්න බැරි විදියේ තත්ත්වයක් තිබෙනවයි, අන්න ඒ නිසා මෙතන 'මා මඤ්ඤි' කියල පදයක් යොදල තිබෙනවය කියල. නමුත් මෙතන මා මඤ්ඤි කියන එකෙන් අපට ගන්න තියෙන්නෙ 'මඤ්ඤනා නොකළ යුතුයි' කියන එකයි. මඤ්ඤනා නොපැවැත්විය යුතුයි. කියන එකයි. මේ 'මා මඤ්ඤි' කියන එක මේ අර්ථයෙන්ම යෙදෙන තවත් තැනක් තියෙනව. අපි අර කලින් අවස්ථාවක සඳහන් කළ සැරියුත් ස්වාමීන් වහන්සේ සමිද්ධි ස්වාමීන්වහන්සේ සමඟ කළ ප්‍රශ්නෝත්තර ධර්ම සාකච්ඡාවක් අවසන් වෙන්නෙ, ඒ සාකච්ඡාවෙ පිළිතුරු වලට 'සාධු සාධු' කියල සැරියුත් ස්වාමීන්වහන්සේ අනුමතකරල ඉවරවෙල කියනව' තෙනව මා මඤ්ඤී' කියල. මේ ඔක්කොම හරි, හැබැයි මඤ්ඤනා ඇතිකර ගන්න එපා' කියල. අන්න ඒ විදියට මඤ්ඤනා ඇති කරගන්න එපා කියන අදහසයි මෙතනින් ගන්න තියෙන්නෙ. එතකොට' පඨවිං මා මඤ්ඤි' - පෘථිවිය යයි මඤ්ඤනා ඇතිකරගැනීමෙන් වැළකීමට යම්කිසි හික්මීමක් උත්සාහයක් ඒ තැනැත්ත කරනව. ඒ බවයි මේ සූත්‍රයෙන් හඟවන්නෙ. ඒ වගේම 'පඨවියා මා මඤ්ඤි' පෘථිවියෙහි කියන ඒ අදහස පිළිබඳවත් මඤ්ඤනා ඇතිකර නොගැනීමට ඒ තැනැත්ත උත්සාහයක් දරනව. පෘථිවියෙන් කියන අදහස ඒ පුද්ගලයට ඇති වෙන්න පුළුවනි. නමුත් ඒ පිළිබඳ මඤ්ඤනා නොකරන්න හික්මෙනව. පෘථිවිය මගේය කියන හැඟීමක් ඇතිවෙන්න පුළුවනි. නමුත් ඒ නිසා ඇතිවෙන මඤ්ඤනාවෙන් වැළකීමට උත්සාහ කරනව. පෘථිවිය පිළිබඳව 'මා අභිනන්දි' ඒ ඇතිවන සතුටත් නැතිකිරීමට ඒ තැනැත්ත උත්සාහ කරනව. මක්නිසාද ඒකට හේතුව කියන්නෙ පරිඤ්ඤෙය්‍යං තස්සාති වදාමි' වදාමි. ඒ තැනැත්ත විසින් පිරිසිඳ දතයුතු නිසා. පිරිසිඳ දැනීමක් තව ඉදිරියට තියෙනව ඒ වෙනුවෙන් හික්මෙනව. අන්න ඒ නිසයි.

# අධෝ ලිපි

1. සු.වි. II 516 පිට (හේ.මු.)
2. සා.ප. III 82 පිට (හේ.මු.)
3. මනො II 657 පිට (හේ.මු.)
4. අං.නි. IV 26 පිට (බු.ජ.21)
5. ප.සූ. II 9 පිට (හේ.මු.)
6. ප.සූ. II 61 පිට (හේ.මු.)
7. සං.නි. III 122 පිට (බු.ජ.15)
8. ම.නි. I 458 පිට (බු.ජ.10)
9. දී.නි. I 434 පිට (බු.ජ.7)
10. ධ.අ. I 149 පිට (හේ.මු.)
11. මලවග්ග ධ.ප.බු.නි. I 88 පිට (බු.ජ.24)
12. අං.නි. II 312 පිට (බු.ජ.19)
13. බු.නි. I 284 පිට (බු.ජ.24)
14. නෙත්ති. 60 පිටුව. (බු.ජ.39)
15. සං.නි. IV -154 පිටුව. (බු.ජ.16)
16. සු.නි. 268 පිට (බු.ජ.25)
17. සං.නි. III 238 පිට (බු.ජ.15)
18. ම.නි. I 540 පිට (බු.ජ.10)
19. ම.නි. I 554 පිට (බු.ජ.10)
20. සු.නි. 160 පිට (බු.ජ.25)
21. ම.නි. I 2 පිට (බු.ජ.10)